



දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ මැදින් අව තුදුස්වක ලත් ශනි දින | කාණ්ඩය 112 | පත්‍රය 99 | පිටු 16 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 අප්‍රේල් 10 සෙනසුරාදා




සදාකාලික පත්තර තාරුණ්‍යය
යොවුන් ජනතා
අද පත්‍රය සමඟ



# ආබාධිත රණවිරුවන්ගේ වැටුප්-දීමනා යැපෙන්නන්ටත් දිවි ඇති තෙක් දෙනවා

## කැබිනට් පත්‍රිකාව යොමු කළ බව ජනපති කියයි

නුවන් කොඩිකාර

ආබාධිත රණවිරුවන්ට දිවි ඇති තෙක් ගෙවනු ලබන වැටුප් සහ දීමනා ඔවුන් මියගිය පසු ඔවුන්ගෙන් යැපෙන්නන්ටත් දිවි ඇති තෙක් ගෙවීම සඳහා අනුමැතිය ගැනීමට සකස් කළ කැබිනට් පත්‍රිකාව ඇමැති මණ්ඩලයට යොමු කර ඇතැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී පෙරේදා (8) පැවසීය. පිට 06



# වසරකට කෝටි 2,000ක එළවළු-පලතුරු අපතේ

## වැඩිහිටියන් 73%කට ප්‍රමාණවත් ආහාරයක් නෑ

## අවුරුදු 5ට අඩු ළමයින්ගෙන් 21%කට මන්ද පෝෂණය

ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

වාර්ෂිකව එළවළු හා පලතුරු මෙට්‍රික් ටොන් 270,000ක් පමණ අපතේ යන බවත් එයින් මෙරට ආර්ථිකයට සිදුව ඇති අලාභය රුපියල් කෝටි 2,000ක් පමණ වන බවත් ජාතික විගණන කාර්යාලය 2015දී කළ විගණනයකට අනුව හෙළිව ඇතැයි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අනාවරණය වී තිබේ. පිට 06

# පොල් ගස් කැපීම තහනම්

## ගැසට්ටුව ළඟදීම

සුභාෂිණී සේනානායක

ලබන සතියේ සිට මෙරට පොල් ගස් කැපීම තහනම් කරමින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට සූදානම් වෙයි. පිට 06

## එඩින්බරෝ ආදිපාද පිලිප් කුමරු මියයයි

මහින්ද අලුත්ගෙදර



බ්‍රිතාන්‍යයේ දෙවැනි එලිසබෙත් මහ රැජනගේ ස්වාමිපුරුෂයා වන පිලිප් කුමරු හෙවත් එඩින්බරෝ ආදිපාදවරයා මෙරට වේලාවෙන් ඊයේ (9) සවස්වරුවේ අභාවප්‍රාප්ත වී තිබේ. පිට 06

## උසස් පෙළ විභාගය ඔක්තෝබර් 4 වැනිදා

සිතාරා සේනානි

මේ වසරේ අගෝස්තු මස පැවැත්වීමට නියමිතව තිබූ අ.පො.ස. උසස් පෙළ-2021 විභාගය මේ වසරේ ඔක්තෝබර් 4 වැනිදා සිට ඔක්තෝබර් 30 වන දින දක්වා පැවැත්වීමට කටයුතු යොදා ඇති බව අධ්‍යාපන ඇමැති, මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා පවසයි. පිට 06

## පොලිසියට අලුතින් 10,000ක්

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස් සහ නුවන් කොඩිකාර

පොලිස් දෙපාර්තමේන්තුවේ පිරිස් බලය වැඩි කිරීම සඳහා ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අලුතින් සාමාජිකයන් 10,000ක් බඳවා ගැනීමට රජය තීරණය කර තිබේ. පිට 06

## රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ධුරය මොහාන්ට

පිට 6



## අජිත් මාන්නප්පෙරුම දිවුරුම් දෙයි

පිට 6

## ‘පීටී’ සහ ‘තංගල්ලේ සුද්දා’ STF අත්අඩංගුවට

පිට 6

## සඳුදා රජයේ විශේෂ නිවාඩුවක්

පිට 6

## ආණ්ඩුව ගජමිතුරන්ට හම්බ කර ගන්න ඉඩ දී ජනතාවට වස දෙනවා

රංජිත් මද්දුමබණ්ඩාර පිට 6

## රට පාලනය කරන්නේ ව්‍යාපාරිකයන් පිරිසක්

සුනිල් හඳුන්නෙත්ති පිට 6

## සැමටම සමාන අවස්ථා දෙන්න


සජබය කථානායකට ලියයි පිට 6

## විෂ පොල්තෙල් ගැන සොයන්න CID විමර්ශනයක්

පිට 6

## කොටි පොලිසියට පණ දුන් යාපනයේ නගරාධිපති අත්අඩංගුවට

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්, රක්ෂණ ශ්‍රියන්ත සහ උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ



එල්ටීටීඊ සංවිධානයේ පොලිස් නිල ඇඳුමට සමාන ඇඳුම් අන්දවා යාපනය නගරයේ පොලිස් ආරක්ෂක ඒකකයක් පිහිටවූ බවට චෝදනා එල්ල වී ඇති යාපනය නගරාධිපතිවරයා ත්‍රස්ත මර්දන ඒකකයේ පොලිස් නිලධාරීන් විසින් ඊයේ (8) අලුයම යාපනයේදී අත්අඩංගුවට ගෙන ඇත. පිට 06





## එජාපයේ මැයි පෙළපාළි නෑ

කෘත්‍යාධිකාරියෙන් තීරණයක්

පිට 6

## නිව් ඩයමන්ඩ් නැවේ ගින්න: වන්දි ගැනීමේ ලේඛන සමාගමට භාර දෙයි

සුභාෂිණී සේනානායක සහ මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාවට ආසන්න මුහුදු සීමාවේදී අනතුරට ලක්වූ තෙල් කාන්දුවක් වූ MT නිව් ඩයමන්ඩ් නෞකාවේ හිමිකාරීත්වයෙන් රුපියල් බිලියන 3.423ක් අය කර ගැනීමට අවශ්‍ය ලේඛන නීතිපතිවරයා විසින් අදාළ නැව අයත් සමාගමට ඉදිරිපත් කර තිබේ. පිට 06



• තනි තනි පුද්ගලයෝ දිනවලා මේ රට පෙරට ගෙනයන්න බෑ කියලා හඳුන් - නෙත්ති කියනවා!

• ඒකනේ අපි 225ම - ම දිනවලා යැව්වේ!

## චෝදනා ඔප්පු වුණොත් කැරොලයින් වසර 20ක් හිරේ

### නීතිවේදීහු පෙන්වා දෙති



### ලෝක කිරුළ භාර දෙනවා කැරොලයින් කියයි

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

ශ්‍රී ලංකා විවාහක රූ රැජන 2020 කිරුළ හිමි පුෂ්පිකාද සිල්වා විසින් ලෝක විවාහක රූ රැජන කැරොලයින් ජූරිට එල්ල කර ඇති චෝදනා ඔප්පු වුවහොත් වසර 15ත් 20ත් අතර සිරදඬුවමක් පැනවිය හැකි බව නීතිවේදීහු පෙන්වා දෙති. පිට 06

# ආතර් සී. ක්ලාක් ආයතනයට ජනාධිපති සම්මානයක්

උපාලි කරුණාරත්න

අමෙරිකාවේ තාරකා විද්‍යා සංගමය මගින් පළ කරන අන්තර්ජාතික තාරකා විද්‍යාත්මක සඟරාවට ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් කළ තාරකා විද්‍යාත්මක පත්‍රිකාව වෙනුවෙන් 2021 ජනාධිපති සම්මාන උලෙළේදී තාරකා විද්‍යාව වෙනුවෙන් විශේෂ සම්මානයක් දිනා ගැනීමට ආතර් සී. ක්ලාක් ආයතනය සමත් වී ඇත.

එම ආයතනයේ තාරකා විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ ඉන්දික මැදගංගොඩ මහතා විසින් අභ්‍යවකාශයේ පවතින 'CATACLYSMIC' ද්විත්ව තාරකා පිළිබඳ චීනයේ යූනාන් තාරකා විද්‍යා නිරීක්ෂණ මධ්‍යස්ථානය හා එක්ව 2018දී කරන ලද අන්තර්ජාතික පර්යේෂණයක් ඇසුරෙන් ඉදිරිපත් කරන ලද මේ පර්යේෂණ පත්‍රිකාව මෙවර ජනාධිපති සම්මාන උලෙළේදී විශේෂ ඇගයීමට ලක් වූ අතර එම ජනාධිපති සම්මානය මෙතෙක් ශ්‍රී ලංකාවේ තාරකා විද්‍යාව වෙනුවෙන් පිරිනැමුණු ඉහළම හා එකම ජනාධිපති සම්මානය බවට පත් විය. මේ තාරකා විද්‍යා පර්යේෂණයට ඉන්දික මැදගංගොඩ මහතා සමඟ අන්තර්ජාතික පර්යේෂණ කණ්ඩායමක් සහ සබරගමුව විශ්ව විද්‍යාලයේ මලිත් සිල්වා මහතාද සහභාගි වී තිබේ.

මේ සම්මානය ජනාධිපතිවරයා වෙනුවෙන් ජාතික පර්යේෂණ ආයතනයේ සභාපති මහාචාර්ය හේමන්ත දොඩම්පහළ මහතා විසින් ලබා දෙන ලදී. කොළඹ විද්‍යා මාවතේ ජාතික පර්යේෂණ සභා ශාලාවේදී මේ සම්මාන උලෙළ පැවැති අතර මෙහි ප්‍රධාන ආරාධිතයා වශයෙන් නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය ඇමැතිනි සීතා අරඹේපොල මහත්මිය සහභාගි වූවාය.

# ජලාශ ඉවුරු ඛාදනය වැළැක්වීමට පරිසර හිතකාමී විසඳුමක්



දියවන්නා ඔයේ ඉවුරු ඛාදනය වැළැක්වීමට පොල් කෙඳි පාදක කර ගත් පාංශු ඛාදන වැළැක්වීමේ නිෂ්පාදන (geotextile සහ coir logs) යොදා ගැනීමේ නියමු ව්‍යාපෘතියක් පසුගියදා ආරම්භ විය. ඒ Tropicoir Lanka පෞද්ගලික සමාගමේ සහ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සහයෝගිතාවෙනි. ඒ යටතේ geotextile සහ coir logs නිෂ්පාදන, තාක්ෂණික දැනුම සහ විශේෂඥතාව නොමිලේ සැපයීමට Tropicoir Lanka සමාගම පියවර ගෙන තිබේ. දියවන්නා ඔය ආශ්‍රිත ශාක හා සත්ත්ව ප්‍රජාවගේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන මේ ව්‍යාපෘතියේ විශේෂත්වය වන්නේ, පරිසර හිතකාමී සහ 100%ක්ම දේශීය නිෂ්පාදන ඒ සඳහා භාවිත කිරීමය.

පාංශු ස්ථාවරත්වය ආරක්ෂා කරන geotextile සහ coir logs නිෂ්පාදන, ගංගා ඉවුරු, බෑවුම්, ඇළ ඉවුරු, කඳු බෑවුම ආදි පාංශු ඛාදනය වීමේ අවදානමක් ඇති ඕනෑම ස්ථානයකට භාවිත කළ හැක. නිසි තාක්ෂණය භාවිත කරමින් geotextile සහ logs ස්ථාපනය කළ පසු, ඒවා වසර 3-5ත් අතර කාලයකදී ස්වාභාවිකව දිරාපත් වීම වේ. ඒ අතරේ ඒ ආශ්‍රිතව වර්ධනය වන ශාක පද්ධතියෙන් ඉවුරු ඛාදනය වළක්වා ගැනීමට අවශ්‍ය ස්වාභාවික පරිසර පද්ධතියක් නිර්මාණය කෙරේ.

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/29/2018/පිටු/සැ

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත් / පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කළ ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2021-04-09 වෙනි දින සිට 2021-04-23 වෙනි දින දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2021-04-30 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර | ඉඩම්වල විස්තර | ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර |
| --- | --- | --- |
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 47/1099/87 දරන පත්ඉරුව. | කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ 99 - කැරළන්කඩවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කැරළන්කඩවල පිහිටි කුඹුක්ගොල්ල හේන නැමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද පිඹුරු අංක 2989 කුරු/ප්‍ර 18498 දීමනා පත්‍රයේ 1987-07-24 දිනැති ඉඩමේ ලොට් අංක 184 සඳහා මායිම්,<br>උතුර : කැබලි අංක 185<br>නැගෙනහිර : කැබලි අංක 96<br>දකුණ : කැබලි අංක 183<br>බස්නාහිර : කැබලි අංක 178<br>බිම් ප්‍රමාණය : හෙක්. 0.726 | 01. ජනාධිපති ලේකම් විසින් 1987-07-24 දින ප්‍රදානය කරන ලද අංක කුරු/ප්‍ර 18498 දරන දීමනා පත්‍රයයි. |

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,**
**නො. 234/ඒ3,**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර,**
**රෙජිස්ට්‍රාර් ජනරාල්.**

---

**මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/44/2018/පිටු/සැ**

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත් / පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2021.04.09 වෙනි දින සිට 2021.04.23 වෙනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2021.04.30 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර | ඉඩම්වල විස්තර | ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර |
| --- | --- | --- |
| කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. කොට්ඨාසයේ 1351 වෙළුමේ 268 පත්ඉරුව | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තුවේ සල්පිටි කෝරළයේ දම්පෙ ග්‍රාමයේ 'මලබොඩගහකැළේ, මලබොඩගහකනත්ත සහ එනසාල්වත්ත - ලෝඩ්ස්වත්ත' නැමැති ඉඩමට බලයලත් මානක එස්.එච්. පීරිස් මහතා විසින් මැන සාදන ලද ඉඩමේ සිතියම් අංක 1372/1988.11.22 දිනැති කැබලි අංක '2සී' සඳහා මායිම්<br>**උතුර** : ලොට් 02 ඒ.<br>**නැගෙනහිර** : අංක 1606 පිඹුරේ ලොට් 01<br>**දකුණ** : කේ. දෙන් සිල්මන්ගේ දේපළ<br>**බස්නාහිර** : අංක 494 හි පිඹුරේ ලොට් 03<br>**බිම් ප්‍රමාණය** : අ. 00 රූ. 02 ප. 26.05 | 01. ජී.එම්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1988.12.05 දින අංක 307 දරන විකුණුම් ඔප්පුවයි. |

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,**
**නො. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර**
**රෙජිස්ට්‍රාර් ජනරාල්.**

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/22/2018/පිටු/සැ

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත් / පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කළ ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2021-04-09 වෙනි දින සිට 2021-04-23 වෙනි දින දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2021-04-30 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර | ඉඩම්වල විස්තර | ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර |
| --- | --- | --- |
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ කොට්ඨාශයේ 1386 වෙළුමේ 122 පත්ඉරුව. | වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩවිල්ලි හත් පත්තුවේ තිරගන්දහය කෝරළයේ බදුරාගල පිහිටි "රුටිලේල් වත්ත" නැමති ඉඩමට මායිම්,<br>**නැගෙනහිර :** රත්මැණිකාගේ වත්ත<br>**දකුණ :** අප්පුහාමිගේ වත්ත<br>**බස්නාහිර :** ජෝන්ගේ වත්ත<br>**උතුර :** ලේකම් මහත්මයාගේ වත්ත<br>**බිම් ප්‍රමාණය :** අක්. 00 රූ. 01 ප.07 | 01. එම්. නිලිනි ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1998-11-25 දින අංක 2269 දරන උගස් ඔප්පුව. |

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,**
**නො. 234/ඒ3,**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර,**
**රෙජිස්ට්‍රාර් ජනරාල්.**

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/28/2018/පිටු/සැ

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත් / පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2021-04-09 වෙනි දින සිට 2021-04-23 වෙනි දින දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2021-04-30 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර | ඉඩම්වල විස්තර | ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර |
| --- | --- | --- |
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B38/300/97 දරන පත්ඉරුව | කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ 400 - තිකවැහැර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කට්ටච්බේරිය පිහිටි බෝගහමුල හේන, කඩවල්යාය දන්දුන්ගොඩයාය නැමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද පිඹුරු අංක අ.ග.පි.2983 කුරු/ප්‍ර 97868 දීමනා පත්‍රයේ 1996-09-06 දිනැති ඉඩමේ ලොට් අංක 337 සඳහා මායිම්,<br>**උතුර :** කැබලි අංක 335<br>**නැගෙනහිර :** අ.ග.පි. 10<br>**දකුණ :** කැබලි අංක 338 සහ 339<br>**බස්නාහිර :** කැබලි අංක 336<br>**බිම් ප්‍රමාණය :** හෙක්. 0.095 | 01. ජනාධිපති ලේකම් විසින් 1996-09-06 දින ප්‍රදානය කරන ලද අංක කුරු/ප්‍ර 97868 දරන දීමනා පත්‍රයයි. |

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,**
**නො. 234/ඒ3,**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර**
**රෙජිස්ට්‍රාර් ජනරාල්.**

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/30/2018/පිටු/සැ

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත් / පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කළ ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2021-04-09 වෙනි දින සිට 2021-04-23 වෙනි දින දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2021-04-30 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර | ඉඩම්වල විස්තර | ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර |
| --- | --- | --- |
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A38/286/89B දරන පත්ඉරුව. | කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ 215 - මාපේගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මාපේගමුව පිහිටි දෙල්ගහගොඩ මූකලාන නැමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද පිඹුරු අංක 3170 ලොට් අංක 31ඒ සඳහා මායිම්<br>බිම් ප්‍රමාණය : අක්. 00 රූ. 02 ප. 09.05 | 01. එස්.බී. වදුරාගල ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1991-03-15 දින අංක 2202 දරන උගස් ඔප්පුවයි. |

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,**
**නො. 234/ඒ3,**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර,**
**රෙජිස්ට්‍රාර් ජනරාල්.**

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/50/2018/පිටු/සැ

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත් / පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2021-04-09 වෙනි දින සිට 2021-04-23 වෙනි දින දක්වා** සතියේ වැඩකරන දිනවල **පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා** ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2021-04-30 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර | ඉඩම්වල විස්තර | ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර |
| --- | --- | --- |
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/B/3/1165/92 දරන පත්ඉරුව | කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ දෙරවේරුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැකතිමුදුගමුව පිහිටි බොගහයාය මූකලාන (මඩ) නැමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද කුරු/ප්‍ර 22606 දීමනා පත්‍රයේ 1990-06-05 දිනැති ඉඩමට පිඹුරු අංක අ.ග.පි. 1964 ලොට් අංක 176,<br>බිම් ප්‍රමාණය : අක්. 01 රූ. 02 ප.35 | 01. ජනාධිපති ලේකම් විසින් 1990-06-05 දින ප්‍රදානය කරන ලද අංක කුරු/ප්‍ර 22606 දරන දීමනා පත්‍රයයි. |

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,**
**නො. 234/ඒ3,**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර**
**රෙජිස්ට්‍රාර් ජනරාල්.**

# කඩා වැටුණු මූල්‍ය සමාගම්වල තැන්පත්කරුවන්ට වන්දි මුදල් ගෙවීම ඇරඹේ

**මහින්ද අලුත්ගෙදර**

කඩා වැටුණු මූල්‍ය සමාගම්වල මුදල් තැන්පත් කළ පිරිස් වෙනුවෙන් ලක්ෂ 5ක මුදලක් වන්දි වශයෙන් වැඩිපුර ගෙවීමේ කටයුතු ශ්‍රී ලංකා මහබැංකු මගින් ඊයේ (09) සිට ආරම්භ කර තිබේ.

ඒ අනුව සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ්, ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්, ටී. කේ. එස්. ෆිනෑන්ස් ලිමිටඩ්, ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී., ඊ.ටී.අයි. ෆිනෑන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී. යන ආයතනවල තැන්පතුකරුවන්, අදාළ නීත්‍යනුකූල තැන්පතු උරුමකරුවන් වෙත එම වන්දි මුදල් ගෙවන බව ශ්‍රී ලංකා මහ බැංකුව පවසයි.

පසුගිය 04 දිනැති පුවත්පත් නිවේදනයේ දැක්වෙන පරිදි නියමිත කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරම සහ අනෙකුත් අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීමෙන් පසු සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ්, ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්, ටී.කේ. එස්. ෆිනෑන්ස් ලිමිටඩ් යන ආයතන තුනෙහි තැන්පතුකරුවන්ට, නීත්‍යනුකූල තැන්පතු උරුමකරුවන්ට වන්දි මුදල් ගෙවීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මේ වනවිට ද සිදු කරමින් පවතින බවද එම බැංකුව පෙන්වා දෙයි. ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී., ඊ.ටී. අයි. ෆිනෑන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී. යන ආයතන තුනෙහි තැන්පතුකරුවන්ට, නීත්‍යනුකූල තැන්පතු උරුමකරුවන්ට වන්දි මුදල් ගෙවීම සිදුකෙරෙනුයේ එම කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිත බැංකුව ලෙස පත්කර ඇති මහජන බැංකුව මගින් දිවයින පුරා පිහිටි එහි ශාඛා ජාලය හරහා වේ.

ඊ.ටී.අයි. ෆිනෑන්ස් ලිමිටඩ්හි තැන්පතුකරුවන්ට, නීත්‍යනුකූල තැන්පතු උරුමකරුවන්ට ඊයේ (09) සිට ද, ද ෆිනෑන්ස් කම්පනි ආයතනයේ තැන්පතුකරුවන්ට, නීත්‍යනුකූල තැන්පතු උරුමකරුවන්ට මේ මස 12 දා සිට ද තමන්ට හිමි වන්දි මුදල් ලබා ගතහැකි අතර ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී. ආයතනයේ තැන්පතුකරුවන්ට, නීත්‍යනුකූල තැන්පතු උරුමකරුවන්ට වන්දි මුදල් ගෙවීම ද නුදුරු දිනක දී ආරම්භ කෙරේ.

ඊ.ටී.අයි. ෆිනෑන්ස් ලිමිටඩ් හි තැන්පතුකරුවන්ගේ,නීත්‍යනුකූල තැන්පතු උරුමකරුවන්ගේ පහසුව උදෙසා අද (10) පෙරවරු 9.00 සිට පස්වරු 2.00 දක්වා තම සියලුම ශාඛා විවෘතව තැබීමට මහජන බැංකුව එකඟ වී ඇත. ඒ අනුව ඉහත තත්ත්වයන්ට යටත්ව, අදාළ දිනවල දී, නියමිත ලේඛන ඉදිරිපත් කර තමන්ට හිමි වන්දි මුදල් ලබා ගන්නා ලෙස සුදුසුකම් ලත් තැන්පතුකරුවන් , නීත්‍යනුකූල තැන්පතු උරුමකරුවන් වෙත මෙයින් දැනුම් දෙන අතර එසේම මහජන බැංකු ශාඛා පරිශ්‍රයන්හි පිරිස් වශයෙන් රැස්නොවන ලෙසටත්, සෞඛ්‍ය ආරක්ෂණ උපදෙස් නිසිලෙස පිළිපදින ලෙසටත් ඉල්ලීමක් කරයි.

කෙසේ වුවද මේ සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු 0112 477 000, 0112 477 261, 0112 398 788 දුරකතන අංක ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව ඇමතීමෙන් ලබාගත හැකිය.

# ශ්‍රී ලංකා විදේශ සේවයට 40ක් බඳවා ගැනීමට ගැසට් කරයි

**මහින්ද අලුත්ගෙදර**

සුදුසුකම් ලත් අපේක්ෂකයන් 40කගෙන් ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවා ගැනීම සඳහා ගැසට් කර තිබේ. ඒ අනුව ශ්‍රී ලංකා විදේශ සේවයට (SLFS) බැඳීම සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයන් 40 දෙනෙකු බඳවා ගැනීමේ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කර ඇති බව විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

මේ අංක 2,223 දරන සහ 2021 අප්‍රේල් 9 දිනැති ගැසට් නිවේදනය වෙත http://www.documents.gov.lk/files/gz/2021/4/2021-04-09(I-IIA)E.pdf වෙබ් සබැඳිය ඔස්සේ පිවිසිය හැකි බවද එම අමාත්‍යාංශය කියයි.

ශ්‍රී ලංකා විදේශ සේවය සඳහා නිලධාරීන් පත්කිරීමේ අධිකාරිය වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සකස් කරන ලද නීතිරීති හා රෙගුලාසිවලට අනුව විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විවෘත තරගකාරී බඳවා ගැනීමේ විභාගයක් මගින් සෑම වසර කීපයකට වරක් විදේශ සේවයට සාමාජිකයන් තෝරා ගනී.

සේවයට බැඳීමට තෝරාගන්නා ලද සාර්ථක අයැදුම්කරුවන්ට විදේශ අමාත්‍යාංශයේ සේවය කිරීමට අවස්ථාව ලැබෙන අතර, විදේශ ශ්‍රී ලංකා දූත මණ්ඩල 67 ක දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීමේ වරප්‍රසාදය ද හිමි වේ. ශ්‍රී ලංකා විදේශ සේවය (SLFS) 1949 වසරේ දී පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ සුවිශේෂී රාජ්‍ය සේවයක් වන අතර එය ශ්‍රී ලංකාවේ වෘත්තීය රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ ආයතනය ද වෙයි.

# මුද්‍රිත බතික් රෙදිපිළි ආනයනය තහනම් කරනවා

## ඇමැති දයාසිරි ජයසේකර

**ස්වර්ණා විජේකෝන්, සන්ධ්‍යා කරුණාරත්න**

මුද්‍රිත බතික් රෙදිපිළි ආනයනය තහනම් කරන බව බතික් අත් යන්ත්‍ර හා පේෂකර්මාන්ත අමාත්‍ය දයාසිරි ජයසේකර මහතා පාර්ලිමේන්තුවේදී (09) ප්‍රකාශ කළේය.

රෙදිපිළි ආනයනය තහනම් කරන බවට තමන් සඳහන් කළ බවට පුවතක් මාධ්‍ය ඔස්සේ පළවූ බවත් එම පුවත අසත්‍යය වන අතර මුද්‍රිත බතික් රෙදිපිළි ආනයනය පමණක් තහනම් කරන බවද ඇමැතිවරයා පැවසීය. මුද්‍රිත බතික් රෙදිපිළි විශාල වශයෙන් ආනයනය දේශීය බතික් කර්මාන්තයට මරු පහරක් බවත් අත්යන්ත්‍ර රෙදිපිළි සම්බන්ධයෙන් ද ඉදිරියේදී එබඳුම ක්‍රමවේදයක් අනුගමනය කරන බව ඇමැතිවරයා සඳහන් කළේය. ඇමැති දයාසිරි ජයසේකර මහතා මේ බව සඳහන් කළේ පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ මහතා මතු කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

# හිටපු ජනපති මෛත්‍රී ගැන කාදිනල් හිමියන් කළ ප්‍රකාශයේ කිසිම දේශපාලනික අරමුණක් නෑ

## කතෝලික සභාව

**සුභාෂිණී සේනානායක**

කාදිනල් හිමියන් ඉකුත් පාස්කු ඉරුදින සිදු කළ ප්‍රකාශයේ කිසිදු දේශපාලනික අරමුණක් නැති බවත් ඊට දේශපාලනික අර්ථකථනයක් නොදෙන ලෙසත් කතෝලික සභාව මෙරට ජනතාවගෙන් ඉල්ලා සිටියි.

කාදිනල් හිමියන් දේශපාලනිකව කිසිවකුට පහර ගැසීමේ අදහසින් එම ප්‍රකාශය සිදු නොකළ බව සිරිල් ගාමිණී පියතුමා මේ සම්බන්ධයෙන් විශේෂ ප්‍රකාශයක් කරමින් කියා සිටියේය. උන්වහන්සේගේ එම ප්‍රකාශයේ කිසිම විදිහක දේශපාලනිකව කිසිවකුට පහර ගසන්නට අදහසක් තිබුණේ නැති බව කියා සිටි සිරිල් ගාමිණී පියතුමා මේ පාස්කු ප්‍රහාරය ජාතික අපරාධයක් හැටියට දකින බවත් එම තර්ජනය තාමත් ඒ අයුරින්ම පවතින බවත් කියා සිටියේය.

ඉකුත් පාස්කු ඉරිදා කාදිනල් හිමියන් හිටපු ජනපතිවරයා සම්බන්ධයෙන් සිදු කළ ප්‍රකාශය සම්බන්ධයෙන් ඇති වූ මතවාද සම්බන්ධයෙන් කතෝලික සභාව මේ නිවේදනය නිකුත් කර තිබිණ.

# රුපියල් දහසේ දෛනික වැටුප වතු කම්කරුවන්ට දෙන්න සමාගම් පියවර ගනී



**අසේල කුරුළුවංශ**

වැටුප් පරිපාලක සභාව විසින් අනුමත කරන ලද රුපියල් 1000.00 ක දෛනික වැටුප වතු කම්කරුවන්ට ලබාදීමට වතු සමාගම් පියවර ගෙන තිබේ. දිනක මූලික වැටුප රුපියල් 900.00 ක් හා අයවැය දීමනාව රුපියල් 100.00 ලෙස මේ රුපියල් දහසේ වැටුප සකස් වී ඇත.

මෙයට ප්‍රථම වතු කම්කරුවකුට රුපියල් 750.00ක දෛනික වැටුපක් වතු සමාගම් විසින් ගෙවනු ලැබීය.

පසුගිය අයවැය යෝජනාවේදි වතු කම්කරුවකුගේ දෛනික වැටුප රුපියල් දහසක් දක්වා වැඩි විය යුතු බවට අගමැති මහින්ද රාජපක්ෂ මහතා විසින් යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීය.

ඒ සම්බන්ධයෙන් කම්කරු අමාත්‍යාංශය, වතු සමාගම් සහ වෘත්තීය සමිති අතර දීර්ඝ වශයෙන් පැවති සාකච්ඡාවලින් අනතුරුව වතු කම්කරුවකුගේ දෛනික වැටුප රුපියල් දහස දක්වා වැඩි කළ යුතු බවට වැටුප් පරිපාලක සභාව තීරණය කළේය.

වතු සමාගම් විසින් වැටුප් පරිපාලක සභාව විසින් අනුමත කරන ලද වතු කම්කරුවකුගේ දෛනික වැටුප රුපියල් දහස දක්වා වැඩිකර ගෙවීම් සිදු කළද වතු වෘත්තීය සමිති සහ වතු සමාගම් අතර මීට ප්‍රථම අත්සන් කර තිබූ අවබෝධතා ගිවිසුම අනුව වතු කම්කරුවන්ට වතු සමාගම් විසින් ලබාදුන් සුබ සාධන හා සෞඛ්‍ය පහසුකම් ලබානොදීමට ඇතැම් වතු සමාගම් තීරණය කර තිබේ.

රුපියල් දහසක වැටුප් ලබාදීම සම්බන්ධයෙන් වතු කම්කරුවන් මාධ්‍යයට අදහස් දක්වමින් මේ වැටුප ලබාදීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් රජයට සහ වතු වෘත්තීය සමිතිවලට තම ස්තුතිය පුද කරන බවයි.

# රිදියාගම ගොවිපොළ 2017 - 2018 වසරවල රු. මිලියන 173ක් පාඩුවක්

## කෝප් කාරක සභාවේදී හෙළිවෙයි

**ස්වර්ණා විජේකෝන්, සන්ධ්‍යා කරුණාරත්න**

රිදියාගම ගොවිපොළ 2017 හා 2018 වසරවල රුපියල් මිලියන 173ක් පාඩු ලබන මට්ටමට පත්ව ඇති බව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හෙවත් කෝප් කාරක සභාවේදී හෙළිවී ඇත.

2015 වසරේදී ආනයනය කළ එළ ගවයන් රඳවා සිටින රිදියාගම ගොවිපොළ 2017 වසරේ ඔක්තොබර් 01 දින සිට 2018 සැප්තැම්බර් 30වැනි දින දක්වා ගවයන්ට රුපියල් 508,793,160 ක වටිනාකමකින් යුත් ආහාර මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට පටහැණිව ක්‍රියා කර තිබීම සම්බන්ධයෙන් ද කාරක සභාවේ අවධානය යොමු විය.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හෙවත් කෝප් කාරක සභාව පසුගියදා එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් රැස් වූ අවස්ථාවේදී මේ කරුණු අනාවරණය කෙරිණි.

මණ්ඩලයේ මූල්‍ය කටයුතු අවධිමත්වීම හේතුවෙන් ගැටලු රැසක් මතුව ඇති බව කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත් මහතා මෙහිදී පෙන්වා දුන්නේය.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කටයුතු නෛතික රාමුවේ නිසි මාර්ගෝපදේශ අනුගමනය කරමින් සිදු කිරීමට කෝප් කාරක සභාව එම මණ්ඩලයට උපදෙස් දුන්නේය.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 2017 වසරේ සිට 2020 වසර දක්වා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත නොකිරීම සම්බන්ධයෙන්ද කාරක සභාවේ අවධානය යොමු විය.


**සේල්, සේල්, සේල්**

**අත්යන්ත්‍ර හා බලවේග යන්ත්‍ර රෙදිපිළි....**

**බෙඩ්ෂීට්** - 48" පළල 250/- සිට, 54" - 350/- සිට, 60"-450/- සිට, 72"-600/- සිට, 80"-850/- සිට.

**සර්ව්යට්** - 35/- සිට, කොට්ටා උර 130/- සිට, සාරි 950/- සිට, 100% කපු හා ලිනන් කමිස 895/- සිට.

**තොග සහ සිල්ලරට.**

**හෙලසළු වීවින්,**
මීගමුව පාර, දිවුලපිටිය.
0312246746, 0778379998


## ශ්‍රීකාන්තගේ ශ්‍රී දූපත




# අප්‍රේල් 13 හා 14 බන්ධනාගාර රැඳවූවන්ට ඥාතීන් හමුවීමට අවසර

**බුද්ධිකා ඉඹුලාන**

මෙවර සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙන් මේ මස 13 හා 14 දෙදිනයන්හි බන්ධනාගාර රැඳවූවන්ට තම ඥාතීන් හමුවීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් අවසර ලබා දී තිබේ.

දැඩි සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් බන්ධනාගාර නීතිරීතිවලට අනුකූලව එම ඥාතීන්ට සිරකරුවන් හා සැකකරුවන් බැලීමට අවස්ථාව ලබා දුන්නද නිවෙසින් රැගෙන එන කිසිදු ආහාරයක් ඔවුන්ට ලබාදීමට අවස්ථාව නොලැබෙන බව බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහතා කියයි.

## ඇස නැත්ත

කොරෝනා සමඟ සිටියදි පොර අල්ලා
විදුලිය බලේ පිරිසක් වැඩි පඩි ඉල්ලා
වර්ජනයකට සැරසී ඇවිදිල්ලා
අවුරුද්දටත් රට අඳුරේ තියපල්ලා

දෛනික වැටුපකින් යැපෙමින් වැඩ කරන
කම්කරුවන්ට නැත වර්ජන රැකවරණ
සොයුරනි! තවත් දේ ඉල්ලා වැඩ වරන
වැඩ නොකරන අයට කාගේ පිළිසරණ!

රටේමුල්ලේ මුදන්නායක

## ගිනි කෙළියක්

අවුරුදු කන්න දින ගැන ගැන දිවා රැයේ
ගම රට යන්නටයි ඉස්ටේසමට ගියේ
පෙර පවු ගෙවන්නට තව ඉතුරුවක් තියේ
රැස්පොට් බලන්නත් වුණු හැටි කෝච්චියේ

ගැප්මන් හෝනා



දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 අප්‍රේල් 10 සෙනසුරාදා

# පාර්ලිමේන්තුව පොරපිටියක් ද?

1940 ගණන්වල දී ද 1950 ගණන්වලදී ද ලන්ඩනයේ පුවත්පත් ශ්‍රී ලාංකේය දේශපාලනය ගැන වාර්තා පළ කර ඇත. ලන්ඩන් ටයිම්ස් පත්‍රය ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව ගැන ද දේශපාලකයන්ගේ කාර්යක්ෂමතාව ගැන ද කතු වැකි ලියා ඇත. නිදහස ලබා වසරක් තුළ ශ්‍රී ලංකාව අත්පත් කරගත් ආර්ථික ජයග්‍රහණ ගැන පැසසුම් වාර්තා පළ කිරීමට ලන්ඩන් පුවත්පත් අමතක නොකළ බව පෙනෙයි. අපේ ප්‍රජාතන්ත්‍රවාදය, පාර්ලිමේන්තු ක්‍රමය හා දේශපාලකයන්ගේ පරිණත ස්වභාවය ගැන විශ්වාසයක් මෙන්ම පිළිගැනීමක් ද එදා විදේශීය ජනමාධ්‍යවලට තිබිණි. එහෙත් අද වන විට එය සෝදාපාළුවට ලක් වී ඇති බව පැහැදිලිය. මෙරට පාර්ලිමේන්තුව ගැන සුබවාදී සටහනක් එතෙර පුවත්පත්වල නොව මෙතෙර පුවත්පත්වල ද දැකගත නොහැකිය.

පෙරේදාත් පළමුදාත් අපේ පාර්ලිමේන්තුව උණුසුම් විය. එහි දකින්නට ලැබුණේ මහා කලබැගෑනියකි. වාග් ප්‍රහාර සඳහා භාවිත කරන ලද්දේ පාර්ලිමේන්තුවට අනුචිත වචනය. එකිනෙකා කෙරෙහි ක්‍රෝධයෙන් මහජන නියෝජිතයන් හැසිරෙනු දක්නට ලැබිණි. බොක්සිං වළල්ලකදී ප්‍රතිමල්ලවයන් එකිනෙකාට පරිභව කර ගත්ත ද ප්‍රේක්ෂකයා එය ගණනකට ගන්නේ නැත. මන්ද යත්: එය මුෂ්ටි - ප්‍රහාර සහිත සටනක් බැවිනි. ශක්තිවන්තයා හා උපායශීලී සටන්කරුවා එහිදී ජය ගනු ලබයි. එය බොක්සිං වළල්ලේ නිත්‍ය ස්වභාවය වෙයි. එහෙත් පාර්ලිමේන්තුව යනු බොක්සිං වළල්ලක් නොවේ. එය රටේ ප්‍රශ්න සාකච්ඡාවට ගනු ලබන විද්වත් සභාවකි. පාර්ලිමේන්තු අසුනක් ජය ගනු ලබන ඕනෑම තැනැත්තකු විනයගරුකව මහත්මයකු ලෙස ක්‍රියා කළ යුතුය.

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව දෙස ආපසු හැරී බලන විට අමතක නොකළ යුතු කරුණු කිහිපයක් තිබේ. එක: ආසියාවේ ප්‍රජාතන්ත්‍රවාදයට හා පාර්ලිමේන්තු ක්‍රමයට අදාළ වැදගත් ස්ථානයක් ලෙස මෙරට පාර්ලිමේන්තුව පවතින බවය. දෙක: ආසියාවේ පරිණත දේශපාලකයන්ගේ සාකච්ඡා සභාවක් හැටියට මෙරට පාර්ලිමේන්තුව පැවති බවය. විදේශ අගමැතිවරු හා නායකයෝ ශ්‍රී ලංකාවට පැමිණ පාර්ලිමේන්තුවේ දී දේශන පැවැත්වූහ. තුන: මෙරට පාර්ලිමේන්තුවට ආවේණික වැදගත් සම්ප්‍රදායයන් ගණනාවක් තිබේ. අතීත මහජන නියෝජිතයා ඒවා අකුරටම ආරක්ෂා කර තිබේ. ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් ලෝක විද්වතුන්ගේ පැසසුමට ද ලක් වී ඇත.

මේ සියල්ල විනාශ වන්නට පටන් ගත්තේ නුසුදුසු පුද්ගලයන් පාර්ලිමේන්තුවට තේරී පත් වීම නිසා යැයි කිව හැකිය. පක්ෂවල ප්‍රතිපත්ති, ඡන්ද ක්‍රමයේ ප්‍රතිපත්ති හා සමාජ ආකල්ප ඒ කෙරෙහි බලපා ඇතැ'යි සිතන්නට පුළුවන. අතීතයේ මහජන නියෝජිතයකු බවට පත් වූයේ හොඳ පසුබිමක් සහිත විනයගරුක පුද්ගලයන්ය. ඔවුන් ස්වකීය වගකීම් හා යුතුකම් කෙරෙහි අවබෝධයකින් ක්‍රියා කර ඇත. හැත්තෑ ගණන්වලින් පසුව මේ තත්ත්වය වෙනස් වී ඇත. කුමන හෝ ක්ෂේත්‍රයක කැපී පෙනෙන පුද්ගලයකුට පාර්ලිමේන්තුවට ප්‍රවේශ වීමේ අවස්ථාව උදා විය. එහි වරද ඇත්තේ දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති මතය. පිරිස් බලය, මුදල් බලය හා තවත් බලකේන්ද්‍ර මත ඡන්ද දිනා ගනු ලබන බොහෝදෙනකුට පාර්ලිමේන්තුවේ වගකීම් ගැන සිහිපත් වන්නේ නැත.

පෙරේදාත් පළමුදාත් පාර්ලිමේන්තුව උණුසුම් වූයේ රන්ජන් රාමනායකගේ මන්ත්‍රී ධුරය අහෝසි වීම නිසාය. රන්ජන් නීතිය ඉදිරිපිට වරදකරුවකු වී සිර දඬුවම් විඳිමින් සිටී. රටේ නීතිය කථානායකවරයාට වෙනස් කළ නොහැකිය. එහෙත් රන්ජන්ගේ පාර්ශ්වය තර්ක කරන්නේ කථානායකවරයා රන්ජන් බේරා ගත යුතුය යන ස්ථාවරයක සිට බව පෙනෙයි. අධිකරණයට හා විනිසුරුවන්ට අපහාස කිරීම බරපතළ වරදකි. ඒ හැරත් මහජන නියෝජිතයකු එවැන්නක් සිදු කිරීම කිසිසේත්ම අනුමත කළ හැකි කාරණයක් නොවේ. තත්ත්වය එසේ තිබියදී සජිත් පිල රන්ජන් නම් චරිතය දේශපාලන වශයෙන් සිය ඉලක්ක දිනා ගැනීම සඳහා භාවිත කරයි. පාර්ලිමේන්තුවේදී අපට දැකගන්නට ලැබෙන්නේ එම අවුලය.

රන්ජන් රාමනායකගේ සිද්ධිය නිසා පාර්ලිමේන්තුවේ වටිනා කාලය නිකරුණේ ගෙවී ඇත. ඒ හැර සභාවේ අවුලක් ද නිර්මාණය වී ඇත. රටේ වැදගත් ප්‍රශ්න සාකච්ඡාවට ගත යුතුව තිබියදී ආණ්ඩු පක්ෂය හා විරුද්ධ පක්ෂය පාර්ලිමේන්තුව තුළ විරෝධතා දැක්වීම අනුමත කළ හැකි කාරණයක් නොවේ.

පාර්ලිමේන්තුව පවත්වා ගැනීම සඳහා දිනකට රජය වැය කරන මුදල විශාලය. රජය යනු මහජනතාවය. අවසන් විග්‍රහයේදී පාර්ලිමේන්තුව පවත්වා ගැනීමට අවශ්‍ය මුදල් සපයන්නේ රටවැසියාය. පාර්ලිමේන්තුව පවත්වන සෑම දිනයකදීම මහජන මුදලට වටිනාකමක් ලැබිය යුතුය. එසේ නොවන්නේ නම්: පාර්ලිමේන්තුව පැවැත්වීමේ ප්‍රයෝජනයක් නැත. රන්ජන්ගේ සිද්ධිය ගැන තවත් කතා කරන්නට දෙයක් ඉතිරි වී නැත. ඔහු වරදක් කර ඇති බව සනාථ වී තිබේ. එසේ නම්: ඔහුට දඬුවමක් ද තිබිය යුතුය.

නැවතත් කිව යුත්තේ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව උත්තරීතර සභාවක් හැටියට කාලයක් පැවති බවය. එදා පාසල් ශිෂ්‍ය ප්‍රජාව ප්‍රජාතන්ත්‍රවාදය ගැන ප්‍රායෝගික අත්දැකීම් ලැබීමට පාර්ලිමේන්තුවේ ප්‍රේක්ෂකාගාරයට පැමිණියහ. ඔවුහු බොහෝ දේ එහි සිට උගත්හ. පසුකලෙක ශිෂ්‍ය ප්‍රජාවට තහනම් ස්ථානයක් ලෙස පාර්ලිමේන්තුව නම් කැරිණි. හේතුව එහි විවාද හා මන්ත්‍රීවරුන්ගේ හැසිරීම දරුවන්ට නරක ආදර්ශ ගෙනදීමය. ඇතැම් මහජන නියෝජිතයෝ පාර්ලිමේන්තුව තුළ අසභ්‍ය වචන භාවිත කරති. තව සමහර නියෝජිතයෝ මැරයන් සේ හැසිරෙති. ඒ හැරත් රටේ ප්‍රශ්න සම්බන්ධයෙන් විද්වත් සංවාදයක් එහි නැත. මේ තත්ත්වය වෙනස්කොට පාර්ලිමේන්තුවේ උත්තරීතර භාවය ආරක්ෂා කිරීම සාමූහික වගකීමක් බවට පත් වී ඇත.

පාර්ලිමේන්තුවේ සජීවී දර්ශන රූපවාහිනිය ඔස්සේ විකාශය කිරීමත් හොඳ ප්‍රතිඵල උදා කර දී නැත. ඇතැම් මන්ත්‍රීවරු ජංගම දුරකතන ඔස්සේ පාර්ලිමේන්තු සිද්ධි වීඩියෝගත කොට ඒවා සමාජ මාධ්‍ය වෙත නිකුත් කරති. එයින් ද බලවත් හානියක් සිදු වේ. පාර්ලිමේන්තුවේ ගෞරවය ගැන කිසිවකු කල්පනා කරන බවක් පෙනෙන්නට නැත. එය ජාතියේ අවාසනාවක් ලෙස සටහන් කර තැබිය යුතුය.

දිල්රූගෙ සීවිදි

| | |
|---|---|
| ඇවිලී යන්න දේවල් නම් | අපමණය |
| එනමුත් නිවීමය කොතැනත් හොඳ | ගුණය |
| වැදුනොත් විනාසෙකි කෝපය නම් | හෙණය |
| රැක ගත යුතුය ඔක්කෝටම පෙර | විනය |

# උණුසුමට නතුවෙමින් වියැකෙන සමකය අසල සමුදුරු ජීවය

සමකාසන්න කලාපවල සමුද්‍රීය ජීවයේ සාරවත් බව දේශගුණික විපර්යාසවල බලපෑම හේතුවෙන් වියැකෙමින් ඇති බව නවතම අධ්‍යයනයකින් හෙළි වී තිබේ. එම පර්යේෂණ වාර්තාව ඉකුත් සඳුදා ප්‍රකාශයට පත් වූ අතර, ඉන් පෙන්වා දී ඇත්තේ නිවර්තන සමුද්‍රීය කලාපවල සාගරය මතුපිට කලාපයේ වසන ජීවී විශේෂ වර්ෂ 2010 දක්වා ගත වූ 40 වසරක කාලසීමාව තුළ අඩකින් පමණ ක්ෂය වී ඇති බවය.



ඇතැම් ගිම්හාන කාලවලදී කැරිබියානු මුහුදේ උෂ්ණත්වය ඉහළයාමත් සමඟ රත්, හරිත, නිල් විවිධ පැහැයන්ගෙන් විචිත්‍රවත්ව දිස් වූ කොරල් ජනපද ක්‍රමයෙන් අවපැහැ ගැන්වීමට පටන් ගත් අයුරු දක්නට හැකි විය. කියුබාව අවට මුහුදු කලාපයේ එවැනි කොරල් දිස්වන්නේ සුදුපැහැ ගැන්වුණු පැල්ලම් විලසය. කොරල්පරවලට එවැනි ඉරණමක් අත්ව ඇත්තේ කියුබාවේ සමුද්‍රීය ජීවී සම්පත්, සමුද්‍ර දූෂණය සහ පමණ ඉක්මවා මත්ස්‍ය අස්වනු නෙළා ගැනීම හේතුවෙන් බලපෑමට ලක්ව තිබියදීය. පර්යේෂණයට ලක්ව ඇති 40 වසරක කාල සීමාව තුළ සාගරය මතුපිට උෂ්ණත්වය සෙල්සියස් අංශක 0.2කින් පමණ ඉහළ ගොස් ඇතැයි පැහැදිලි වී තිබේ.

මෙම පර්යේෂණය සිදු කර ඇත්තේ කියුබාවේ ජාතික විද්‍යා ඇකඩමිය විසිනි. ඊට පෙර සිදු කළ පර්යේෂණවලින් පෙනී ගොස් ඇති පරිදි, සාගරයේ උෂ්ණත්වය ඉහළ යාමත් සමග එම කලාපවල සිටින සමුදුරු ජීවීන් වඩා සිසිල් ජලය ඇති මුහුදු කලාප කරා සංක්‍රමණය වූ අයුරු පැහැදිලි විය. නව අධ්‍යයනය සඳහා මත්ස්‍යයන්, මුහුදු බෙල්ලන්, පක්ෂීන්, කොරල් ආදී සමුද්‍රීය ජීවී විශේෂවලට අයත් 48661කගේ පමණ දත්ත ගෙන තිබේ. 1970 – 2010 සමයට අදාළව සාගර පත්ලට සම්බන්ධ කොරල්, ස්පොන්ජ් වැනි ජීවීන්ගේ ද දත්ත මෙලෙසම රැස් කර ඇත. "භූගෝලීය ඉතිහාසය විමසන විට මෙය සිදු වී ඇත්තේ ඇසිපිය හෙළන තරම් ඉක්මනින්..." ඒ, මෙම පර්යේෂණයට සම්බන්ධ නොමැති පරිසරවේදියකු වන සෙබස්තියන් ෆර්ස්ගේ අදහසය. "බරපතළ ප්‍රශ්නයක් තමයි, කොරල් වැනි ජීවීන්ට සංචරණය කළ නොහැකිවීම. සමුද්‍රීය පරිසර පද්ධතියක කොරල් ඉටු කරන්නේ වැදගත් කාර්යභාරයකි. ධීවර කර්මාන්තය මෙන්ම සංචාරක කර්මාන්තය ඒ මත විශාල වශයෙන් රැඳී පවතී. එබැවින් ඒ ආශ්‍රිත ජන කොටස්වලට මින් ඇති කර තිබෙන බලපෑම බලවත්ය.

ගොතේ විශ්වවිද්‍යාලයේ ජීව විද්‍යාඥයකු මෙන්ම මෙම අධ්‍යයනයේ සම කතුවරයකු ද වන ඡායා චෞද්රි පෙන්වා දෙන්නේ, දේශගුණික විපර්යාස දැනටමත් සමුද්‍රීය ජීවී විශේෂ ව්‍යාප්තිය සම්බන්ධයෙන් බලපෑම් ඇති කර තිබෙන බවය. සංරක්ෂණ විද්‍යාඥයකු වන ස්ටුවර්ට් ජිම් පවසන පරිදි, මිහිතලය මත වසන වඩාත් අවදානමට ලක්ව ඇති මානව ප්‍රජාවන්ට මේ තත්ත්වය විශාල බලපෑමක් ඇති කළ හැකිය.

## කියුබාවේ කොරල් තවාන්

කියුබාව ආශ්‍රිත මුහුදු කලාපයේ පිහිටි කොරල් සාගරය ආශ්‍රිත සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් තර්ජනයට ලක්ව ඇත්තේ ද සමුද්‍රීය දූෂණයට හසුව ඇත්තේ ද අඩු මට්ටමිනි. එසේ වුවද සාගරයේ උෂ්ණත්වය ඉහළ නැඟීමේ බලපෑම වෙනස් කිරීමට ඔවුහු අපොහොසත්ව සිටිති. පාරිසරික ආරක්ෂණ අරමුදලේ කැරිබියානු වැඩසටහන් ප්‍රධානී ඩැනියෙල් විට්ල් පවසන පරිදි, වසරකට පෙර විරංජනයට ලක් වූ කොරල් වසරක් ඇවෑමෙන් යළිත් ප්‍රකෘති තත්ත්වයට පත් වෙමින් ඇති අයුරු දිස් වූ බවය.

කියුබාව සිය පළමු කොරල් තවාන විවෘත කළේ සිව් වසරකට ඉහතදීය. වෙරළබඩ කඩොලාන යළි වගා කිරීමට ද කියුබාව යොමු වී සිටී.

අත්ලාන්තික් සාගර වෙරළ තීරයේ පිහිටි ශාක ප්‍රජාව මුහුදු මට්ටම ඉහළ නැඟීමේ ප්‍රතිඵලයක් ලෙස අතුරුදහන් වෙමින් පවතී. ගුවනේ සිට බලන විට එම ප්‍රදේශ දිස්වන්නේ අවතාර වනාන්තර මෙනි. උතුරු කැරොලිනා වෙරළාශ්‍රිතව මෙම වනාන්තර බිම් විනාශයට පත්ව ඇති අයුරු සෑම තැනකම දක්නට හැකිය. එක්කෝ එම තුරුලතා මිය ගොසිනි: නැති නම් මිය ඇදෙමින් පවතී. පරිසර විද්‍යාඥයන් පවසන පරිදි, අත්ලාන්තික් වෙරළ තීරයේ භූ දර්ශනය දේශගුණික විපර්යාස මඟින් වෙනස් කරන අයුරු දැක්වීමට මෙය හොඳම නිදසුනකි. එම බලපෑම් පාරිසරික වෙනස්කම්, වනජීවීන් තර්ජනයට ලක් වීම, පරිසර පද්ධතිවලට බලපෑම් ඇති වීම, ගොවිපොළ සහ වනාන්තර ආශ්‍රිත ව්‍යාපාරවලට බලපෑම් ඇති වීම ආදී වශයෙන් විවිධාකාරයෙන් දැනෙමින් පවතී. ඕනෑම සජීවී වස්තුවක් මෙන්ම ගස් ද මිය යාම ස්වභාවය වුවද මෙහි සිදු වන්නේ සාමාන්‍ය දෙයකින් නොවේ. තැනින් තැන විශාල පැල්ලම් මෙන් මිය ඇදෙමින් ඇත්තේ කැලෑ කුට්ටිය. මේ තත්ත්වය අත්ලන්තික් සාගරය ආශ්‍රිතව පිහිටි රටවලට සමස්තයක් ලෙස බලපාන තත්ත්වයක් පෙනෙන්නට ඇත. විද්‍යාත්මක ප්‍රජාව මෙම තත්ත්වය "අවතාර වනාන්තර" ඇති වීම යනුවෙන් හඳුන්වන්නේ එය දිස්වන ස්වභාවය අනුවය.

මුහුදු මට්ටම ඉහළ නැඟීමේ ප්‍රතිඵලයක් ලෙස වෙරළබඩ කලාපවල ලවණ තැන්පත් වන අතර, ඒ ආශ්‍රිත ගහකොළ මිය ඇදීමට හේතුව එයයි. මේ පිළිබඳ 2019 වර්ෂයේ නිකුත් වූ වාර්තාවක් නම් වූයේ Wooden tombstones යනුවෙනි. මෑතදී කරන ලද අධ්‍යයනයකින් පෙනී ගිය පරිදි උතුරු කැරොලිනාවේ මේ තත්ත්වය සිතා ගැනීමට නොහැකි තරම් ප්‍රබලය. ගහකොළ පමණක් නොව සතා සීපාවා ද මේ හේතුවෙන් තර්ජනයට ලක්ව අවසන්ය. රතු වෘකයා, රතු තොප්පි මල් කොට්ටෝරුවෝ වැනි තර්ජනයට ලක්ව ඇති ජීවීන් මේ හේතුවෙන් වඩාත් අනතුරට මුහුණ පා සිටීම බරපතළ තත්ත්වයකි. මේ පිළිබඳ වඩා පැහැදිලි චිත්‍රයක් ඇඳ ගැනීමට ගුවනේ සිට සිදු කරන නිරීක්ෂණ ඉතා වැදගත්ය. නාසා ආයතනයේ පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා මඟින් දෙන දත්ත ද මෙම අධ්‍යයන සඳහා ප්‍රයෝජනවත් වී ඇත. එම චන්ද්‍රිකා මඟින් 1972 වර්ෂයේ පටන් යොමු කළ දත්ත මේ සඳහා අදාළ කරගෙන තිබේ. 1984 පටන් ගූගල් අර්ත් දර්ශන ද ඊට උපයෝගි විය. මේ දත්ත විශ්ලේෂණය මඟින් ලැබී ඇති ප්‍රතිඵල කම්පනයට පත් කරන සුළුය. ඇලිගේටර් නදිය ආශ්‍රිත ජාතික වනජීවී කලාපයට අයත් වනාන්තර බිම් වලින් 10%ක් 35 වසරක් තිස්සේ විනාශය කරා ඇදී ඇත. එය ප්‍රාන්තීය වශයෙන් සංරක්ෂිත වනාන්තර භූමියකි. මෙම වනාන්තර විනාශ වීමට වෙනත් මානව ක්‍රියාකාරකමක් හේතු වී නැති බව ද මින් පැහැදිලි වී තිබේ. නිරන්තරයෙන් ඇතිවන සුළි කුණාටු, නියං තත්ත්ව ආදියට ද මෙම දේශගුණික විපර්යාස බලපා ඇති බව පෙනී ගොස් ඇත.

මෙම අධ්‍යයනයන්ට අනුව වාර්ෂිකව වැඩිම වනගහනයක් අහිමි වී ඇත්තේ 2012 වර්ෂයේදීය. ඒ දරුණු නියං සමයකට පසුවය. එම වකවානුව තුළදී ලැව්ගිනි සහ ඉරේන් සුළි කුණාටුව වැනි දරුණු සුළි කුණාටු ද වාර්තා විය. මේ සාධක සියල්ල වන බිම් විනාශයට හේතු පාදකය.


මේ තත්ත්වය ලොව බොහෝ තැන්වල අඩු වැඩි වශයෙන් දක්නට හැකිය. ඊට පිළියම් යෙදීමට හැකි ආකාර ගැන සංරක්ෂකයන්ගේ අවධානය යොමු වී ඇත. කුණාටු තත්ත්වවලදී ලවණ ජලය ගොඩබිමට ගලා ඒම වැළැක්වීම සඳහා ශාක, වැලි, ගල් ආදිය උපයෝගි කර ගනිමින් බාධක ඇති කිරීම එක් ක්‍රමවේදයකි. වඩාත් රැඩිකල් ප්‍රවේශයක් නම් වගුරු ආශ්‍රිතව වැඩෙන ශාක එම පරිසරයට හඳුන්වාදීමයි. එම උපාය මාර්ගය ආන්දෝලනයට තුඩු දී ඇත්තේ එම පරිසර පද්ධති ඊට ආවේණික තත්ත්ව යටතේම රැකගැනීමට ඇති කැමැත්ත සමඟය. කෙසේ වුවද වෙරළාශ්‍රිත ශාක ප්‍රජාව විනාශයට පත් වෙමින් ඇති පසුබිමක එවැනි විකල්ප හෝ යෙදීම ගැන ද අවධානය යොමුව ඇත.

## පහත් බිම් අවදානමක




දේශගුණික විපර්යාස හේතුවෙන් පහත්බිම් මුහුදු ජලයෙන් යටවීමේ අවදානම කාලයක් තිස්සේ අවධානයට ලක්ව තිබේ. එය ඇතැම් රටවල් ලෝක සිතියමෙන් මකා දැමීමට තරම් තත්ත්වයක් බවට අනතුරු ඇඟවීම් සිදුව ඇත. එසේ තිබියදී මෙවැනි පර්යේෂණ මඟින් හෙළිදරවු කෙරෙන්නේ ලොව පුරා වෙරළාශ්‍රිත කලාප දැනටමත් වසර හෝ දශක ගණනාවක් තිස්සේ එම බලපෑම් හේතුවෙන් විනාශයට ගමන් කර ඇති අයුරුය. එය වළක්වා ගැනීමට නම්, දැනට ඇති තර්ජනයට තාවකාලික පිළියම් යෙදීමෙන් ඔබ්බට යමින් ගන්නා දේශගුණික විපර්යාසවල බලපෑම් තීව්‍ර කිරීමට හේතුවන මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමේ ක්‍රියාමාර්ග තවදුරටත් බලගැන්විය යුතුමය. මිහිතලය උණුසුම් වීම සමඟ සෘජුවම සම්බන්ධ වන්නේ මානව ක්‍රියාකාරකම් බව පැහැදිලිය. දැනට දශක කිහිපයක් තිස්සේ ඒවා පාලනය කිරීම පිණිස ගත හැකි ක්‍රියාමාර්ග මෙන්ම ඉලක්ක ද සාකච්ඡාවට ලක් වෙමින් පවතී. ලොව මුල් පෙළේ කලාපීය හෝ අන්තර්ජාතික සමුළුවල න්‍යාය පත්‍රයේ මග නොහැරෙන අංගයක් වන්නේ දේශගුණික විපර්යාස පිළිබඳ කාරණයයි. අවම වශයෙන් දැනට එකඟ වී ඇති ඉලක්ක සපුරාගැනීම සඳහාවත් මෙහිදී ලෝකයට කටයුතු කිරීමට සිදු වනු ඇත. එසේ නොවන්නේ නම් එම අනර්ථකාරී බලපෑම්වල ප්‍රතිවිපාක දරා ගැනීමට අප සූදානම් විය යුතුයි. ඛේදනීය කාරණය නම් එම ප්‍රතිවිපාක අදාළ වන්නේ මානව වර්ගයාට පමණක් නොවන බවය. සෑම ජීවී සංහතියකටම ඊට වන්දි ගෙවීමට සිදු වේ. ඒත් සරල මූලික කාරණයක් දැන්වත් මිනිසා විසින් අවබෝධ කරගත යුතුව ඇත. ඒ, මිහිතලය යනු ඔහුට පමණක් අයත් වස්තුවක් නොවන අතර, ඔහු ද මිහිතලයට අයත් බවය.

**ධම්මික සෙනෙවිරත්න**



# ජීවිතයට අතහැරීම කියාදෙන අලුත්ම පාඩම

වර්තමානය වන විට ඌණිතවාදය (Minimalism) ලෝකයේ අස්සක්, මුල්ලක් නෑරම පැතිරී තිබේ. බොහෝ දේ අඩුවෙන් භාවිතයට ගැනීම සහ අඩු බව යනු එක්තරා වැඩියක් ලෙස සැලකීම දක්වා වූ මාර්ගයේ විවිධ අර්ථකතන සමග විවිධාකාරයෙන් වර නැගේ. දර්ශනවාදය, නිෂ්පාදන සහ ජීවන රටා සමග යෙදෙමින් ඌණිතවාදය යන යෙදුම අවභාවිතය කිරීම කෙරෙහි ද බොහෝදෙනකුගේ අවධානය යොමු වී තිබේ. ඉතා සුළුවෙන් භෞතික දේ සතු කරගෙන ජීවත් වීමෙන් පටන් ගෙන අවම දේපළක් හිමි කර ගැනීම, සැහැල්ලු මෝස්තර සහිත දේ මිල දී ගැනීමට පෙලඹවීම තෙක් එය ඇදී යයි. භික්ෂුභාවය ලැබූ පසු සුළුවෙන් ජීවත් වීමේ ජීවන රටාව ද දැන් මීට ඈඳාගෙන තිබේ. එනම් තනි වචනයකට තේරුම් ගණනාවක් ආදේශ කරමින් මූලික අර්ථයේ වෙනස්කම් සිදු කරමින් හිඳියි. අඩු බව යනු වැඩිපුර තිබීම යනුවෙන් වර්තමානයේ ප්‍රකට යෙදුමකි. සැබැවින්ම මේ ක්‍රියා පිළිවෙත වසර 2500ක් තරම් ඈතට විහිදී යන්නකි. මේ අතරම, අභ්‍යන්තර සන්සුන්භාවය සහ සරල බව අපව සතුටු කිරීමට උපකාරී වන්නේ ඇයි, දැයි කියා පර්යේෂිකාවක වන බෙවර්ලි ඩී. සිල්වා ප්‍රශ්න කරයි.

බ්‍රිතාන්‍ය ජාතික තරුණ කලාකරුවකු වන මයික් ලැන්ඩි විසින් 2001දී 'බ්‍රේක් ඩවුන්' නමින් ප්‍රදර්ශනයක් ලන්ඩනයේදී ඉදිරිපත් කරන ලදී. මෙහි විශේෂත්වය වූයේ ඔහුට අයත් සියලුම ගෘහ භාණ්ඩ සහ සියලු උපකරණ කඩා දමමින් මේ ප්‍රදර්ශනයට ඉදිරිපත් කිරීමයි. ඔහු සතුව බඩු භාණ්ඩ 7227ක් තිබූ බව ගණනය කිරීම්වලදී සොයා ගන්නා ලදී. ඒ වසර 37ක් මුළුල්ලේ එකතු කරන ලද ඒවාය. මේවා අතරට, ඇඳුම් ආයිත්තම්, පෙම් හසුන්, සාබ් 900 ටර්බෝ මෝටර් රථයක්, සිතුවම් සහ ඔහුගේ පියාට අයිතිව තිබූ බැටලු හමින් කළ කබායක් ද විය. උදව්කරුවන් 12 දෙනකු සමග මේ සියලු වත්කම් කැබලි කිරීමට ඔහු සමත් විය. සියල්ල කැබලි කළ පසුව මේ ක්‍රියාවලිය මුළුල්ලේ ඇඟලා සිටි නිල් පැහැති ඇඳුම හැර ඔහු සතුව කිසිදු භෞතික භාණ්ඩයක් නොවීය.

"ඒ, මගේ ජීවිතේ ගෙවුණ සතුටුදායකම සති දෙක" ලැන්ඩි තමන්ගේ බ්‍රේක් ඩවුන් ව්‍යාපෘතිය ගැන පවසන්නේ එවැන්නකි. ලැන්ඩි විසින් තමන් සන්තකයේ තිබූ සියලු දෑ මෙලෙස කඩාබිඳ දමා ප්‍රදර්ශනයක් පැවැත්වූයේ පරිභෝජනවාදයට එරෙහි වීමටය. ඒ වසර 15ට පෙරය. තමන් සන්තක දේ තමන් විසින්ම සුනුවිසුනු කර දැමීමෙන් ඌණිතවාදය වෙත ප්‍රවේශ විය හැකි ද? එසේත් නැත්නම් මේ අප සන්තකයේ පවතින එහෙත් අපට අනවශ්‍ය දෑ විනාශ කර දැමීමෙන් යම් ආත්ම තෘප්තියක් ලැබිය හැකි ද?

මාරි කොන්ඩෝට අනුව අප අවට ඇති දේවලින් ප්‍රීතිය අවුළුවාලීමේ ක්‍රමෝපායන් සොයා ගැනීම වඩාත් යෝග්‍යය. ඈ විසින් සංවිධානාත්මභාවය පිළිබඳ කෘති රැසක් ලියා පළ කර ඇත. කොන්-මාරි ක්‍රමය පිළිබඳ ලියා පළ කළ මේ කෘති මිලියන 11ක් තරම් අලෙවි වී ඇත. පසුගිය කාලය පුරා ජනප්‍රිය සංස්කෘතිය නියෝජනය කරමින් ප්‍රාදූර්භූත මාරි කොන්ඩෝ ඇතුළු පිරිස ඌණිතවාදය පිළිබඳ කතා කෙරෙන වේදිකාවලට පැමිණි නව හමුදා සේනාංකයක් ලෙස සැලකෙයි. ඒ අතරම, කොන්ඩෝ සමග ජෝෂුවා ෆීල්ඩ්ස් මිල්බර්න් සහ රයන් නිකොදේමුස් හෝ ඌණිතවාදීන් විසින් අප සතු ද්‍රව්‍යමය භාණ්ඩ පිළිබඳ ප්‍රශ්න කිරීමට පටන් ගනී. ඒවායේ අයිතිය ලබා ගැනීමට මෙතරම් උනන්දුවක් පවතින්නේ ඇයි, දැයි තමන් වෙතින්ම ප්‍රශ්න කිරීමට අපව පොලඹවාලීම මේ සංවාදයේ වැදගත් ලක්ෂණයකි.

ඌණිතවාදයට ළඟාවීම යම් ආලෝකයක් දැකීමක් ලෙස සැලකිය හැකි බව මිතුරන් දෙදෙනෙක් විසින් වටහාගෙන ඊට සමීපවීමට උත්සාහ කිරීම ද මේ අතරම සිදු විය. තම දෛනික ජීවිත අතෘප්තියෙන් ගැලවීමට මෙය හොඳ මාර්ගයක් ලෙස ඔවුන් සැලකීය. "මම ඇමරිකානු සිහිනය පසුපස හඹා ගියෙමි, එය මගේ සිහිනය නොවන බව මට වැටහෙන තුරු" යැයි මේ මිතුරන් දෙදෙනකුගෙන් එක් අයෙක් වන නිකෝඩෙමුස් පවසයි. ඇමරිකානු සිහිනය හෝ වෙනත් ග්‍රහලෝකයක සිහිනයක් හෝ පසුපස හඹායෑමේ සාමාන්‍ය මිනිස් ආශාවෙන් වෙන් වීමට සිතීම පැසසුම් ලැබිය යුතුය. එහෙත් යමකු ඒ තැනට ළඟා වන්නේ කෙසේ, දැයි සමස්ත සමාජයේ පැහැදිලි මග පෙන්වීමක් ඇත්තේ නැත. හුදෙකලා සටන් මඟින් අහඹු ලෙස මිනිසුන්ව ඌණිතවාදයට විසි කරන්නේ ද? එසේත් නැත්නම් හුදෙක් කළකිරීම, ආතතිය විසින් ඔවුන්ව ඒ වෙත යොමු කරන්නේදැයි යළිත් විමසා බැලිය යුතුය.

මේ මිතුරන් දෙපළ, ජෝෂුවා ෆීල්ඩ්ස් මිල්බර්න් සහ රයන් නිකොදේමුස් විසින් ඌණිතවාදය පිළිබඳ රචිත කෘතිය පිළිබඳ ඊළඟට අවධානය යොමු කළ යුතුමය. නොසිතූ ජනප්‍රියත්වයක් හිමිකර ගත් 'ලෙස් ඊස් නව්' ඉතා ඉක්මනින් නෙට්ෆ්ලික්ස් කතා මාලාවක් බවට ද පරිවර්තනය විය. පොඩ්කාස්ට් මඟින් සේම ඔවුන්ගේ වෙබ් අඩවියෙන් ඌණිතවාදය පිළිබඳ බොහෝ දේ කියූ ඔවුන් නව ජනප්‍රිය සංස්කෘතියේ වැදගත් ඉඩක් නිරූපණය කරන්නෝ විය. ඌණිතවාදය වෙත ප්‍රවේශ වූයේ කෙසේ ද, බොහෝ දේ කෙරෙහි නො ඇලී අත්‍යවශ්‍ය දේ පමණක් භාවිත කිරීමට තීරණය කිරීමේ සංකල්පය වඩාත් ආකර්ෂණීයවත්, අර්ථාන්විතවත් මේ දෙපළ විසින් ඉදිරිපත් කරන ලදී. විශේෂයෙන්ම නෙට්ෆ්ලික්ස් කතා මාලාව වෙත තරුණ කණ්ඩායම් වැඩි ප්‍රමාණයක් කාන්දම් සේ ඇදී එනු දක්නට හැකි විය. ඔවුන් දෙපළට විශාල අනුගාමිකයන් පිරිසක් ඇති වීම ද තවත් විශේෂ කාරණාවකි. තම පෞද්ගලික අත්දැකීම් බෙදා ගනිමින් ඇති කළ සංවාදය මීටත් වඩා ගැඹුරු තැනකට රැගෙන යා යුතු යැයි අප සිතන්නේ එහෙයිනි.

ග්‍රීන්පීස් යූඑස්ඒ සංවිධානයේ ඈනී ලෙනාර්ඩ් පවසන ආකාරයට "අප සතුව ඇති දේවල්වලට ඇබ්බැහි වීම පිටුපස ඇත්තේ ලාභ ලැබීමේ අරමුණෙන් ඒවා නිපදවන සමාගම්ය, ඔවුන්ගේ ක්‍රියා කලාපයන්ය."

සාමාන්‍ය ක්‍රමෝපායන් මඟින් සමාජය සමග සම්බන්ධ වීමේ හැකියාව අහිමි, ඉලක්ක සහ සබඳතා නොමැති බහුතරයක් මේ සිල්ලර චිකිත්සාවේ ගොදුරු බවට පත්ව ඇත. එකක් මිල දී ගත් විට තවත් එකක් නොමිලේ ලැබෙන අවස්ථා දුටු විට තමන්ට කොතරම් අනවශ්‍ය වුවත් එකක් මදිවාට දෙකක් හිමිකර ගැනීමේ ආශාව පහළ වේ. එය වළක්වා ගත නොහැකි තත්ත්වයට පත් වුව හොත් දිගින් දිගටම මේ ආකාරයේ මිලදී ගැනීම්වලට ඇබ්බැහි වේ. භාණ්ඩ කෙරෙහි ඇලීමට වෙළෙඳපොළ විජ්ජා බොහොමයක් බලපවත්වයි.

මේ පසුබිම තුළ ඌණිතවාදය ජනප්‍රිය වීම යහපත් ලක්ෂණයකි. එහෙත් එහි නියම අර්ථය වෙනස් කිරීම නොකළ යුතුය. මිනිසුන් සතු භාණ්ඩ කන්ද එන්නම් එන්නම ඉහළ යෑම නොවැළැක්විය හැකි සාධකයක්ව පවතින විටත් ඌණිතවාදයට ප්‍රවේශ වීමට යමකු උත්සාහ දරයි නම් ඒ මහත් සතුටකි.

මිල්බර්න් සහ නිකොදේමුස් විසින් රචිත නවතම කෘතිය, 'ලව් පීපල්, යූස් තින්ග්ස්' යළිත් ඔබේ හිසට තදින් පහරක් එල්ල කරයි. මිනිසුන්ට ආදරය කර භාණ්ඩ පාවිච්චියට ගැනීමට ඔවුන් කරන යෝජනාව ගැන යළි, යළිත් කල්පනා කළ යුතුය. මන්දයත් වර්තමානය වන විට භාණ්ඩවලට ආදරය කරමින් මිනිසුන්ව පාවිච්චියට ගැනීමට අප පුරුදුව ඇති බැවිනි. ඔබේ ජංගම දුරකතනය, ස්මාර්ට් ඔරලෝසුව, මෝටර් රථය හෝ නිවෙසට ආදරය කරමින් මවුපියන්, බිරිය, ස්වාමියා සහ ළමුන් පාවිච්චියට ගත හැකි භාණ්ඩ සේ සැලකීමේ මුග්ධ ක්‍රියාවට ලෝකය දැන් එළැඹෙමින් පවතින බව යළි යළිත් කිව යුතු නැත. ගැජට් සහ අතත්‍ය දේ මිනිසුන්ගේ ලෝකයේ ප්‍රමුඛ වුවමනා බවට පත් වීමේ අභාග්‍ය අපව කොතැනකට ගෙන යනු ඇත් ද? ඒ නොසලකා හැර කාලය ඉදිරියට තල්ලු කළ යුතු ද?

භාණ්ඩ කඳු ඉහළ යාම පිළිබඳ මිල්බර්න් සහ නිකොදේමුස් කළ පර්යේෂණයකට අනුව ලැබුණු තොරතුරු මවිතය දනවන සුළුය. සාමාන්‍ය ඇමරිකානු නිවෙසක් තුළ භාණ්ඩ 30000ට ආසන්න ප්‍රමාණයක් ඇති අතර, අමතර භාණ්ඩ රැඳවීමට වෙනම සැකසූ කාමරයක් ද තිබේ. නිවෙසක් මිල දී ගැනීමේදී මේ අමතර භාණ්ඩ කාමරයක් තිබේ දැයි පිරික්සීම අනිවාර්ය සාධකයකි. කුඩා නිවාස සංකල්පය දිය කර දමමින් විශාල නිවාස සෙවීම වෙත මිනිසුන් පෙලඹී ඇත්තේ ඇත්තෙන්ම ඔවුන් සන්තකයේ විශාල බඩු භාණ්ඩ සංඛ්‍යාවක් ඇති හෙයිනි. ඒවා රඳවා තබා ගැනීමට විශාල ඉඩක් තිබිය යුතුමය. එහෙත් මේ අමතර භාණ්ඩ කාමර ගැන වෙනත් සාකච්ඡාවකට එළැඹිය යුතුය. අමතර දේ යනු දැනට අවශ්‍ය නොවන යම් දිනෙක අවශ්‍ය විය හැකි දේය. ඒවා අනාගතය වෙනුවෙන් ආරක්ෂා කිරීමේ උවමණාව මිනිසාගෙන් ගිලිහී නොයයි. මේ ආශාවේ අතිරික්තය විසින් ඔබව අනවශ්‍ය දේ වෙත බැඳ තබා ගැනීමේ අවසානය කුමක් ද?




විශාල නිවාස වෙත ආකර්ෂණීය නොවී කුඩා ඉඩක විසීමට හිත හදා ගැනීම එකකි. ඔබ සතු අනවශ්‍ය, අමතර දේ ඉවත ලෑමට හිත හදා ගැනීම තවෙකකි. සැබැවින්ම දෙවැන්නෙන් පසුව පළමු වැන්නට පහසුවෙන් ළඟා විය හැකිය. ඌණිතවාදයේ රසිකයකු වීමට උත්සාහ කිරීමෙන් මේ තත්ත්වයට පහසුවෙන්ම ළඟා විය හැකිය. බෞද්ධාගමික ප්‍රජාවට කුඩා කල සිටම උගන්වන අල්පේච්ඡවාදය ලුහුඬින් ප්‍රගුණ කළ හොත් ඌණිතවාදයට එළැඹීම අතිශය පහසුය. අත් හැරීම, දන් දීම ආදී දේ සමාජගතව පවතින සමාජයක වෙසෙන අප සැබැවින්ම දන් දෙන්නේ හෝ යමක් අත් හරින්නේ ඊට වඩා වැඩි යමක් බලාපොරොත්තුවෙන් නම් බැඳීමේ ප්‍රමාණය ගණනය කළ නොහැක.

ඌණිතවාදය යනු සියල්ල අහිමි කරගෙන අමාරුවෙන් ජීවත් වීම නොවේ. අත්‍යවශ්‍ය දේ පමණක් ළං කර ගැනීමය. අතිරික්තය වෙන අයකුට ලබා දීමය. අනවශ්‍ය දෑ යළි, යළිත් මිල දී නොගැනීමය, සෑහීමකට පත් වීමට ඉගැනීමය. නාස්තිය අවම කිරීමය, පහසුවෙන් ජීවත් වීමය. මේ කාරණා සමග එකඟ වීමට යමකුට හැකි නම් භෞතික දේ කෙරෙහි පවත්නා මේ දැඩි ඇලීමෙන් නුවණක්කාර ලෙස ගැලවීමට දොරක් හැරෙනු ඇත. ඒ දොරෙන් එපිට ලෝකය මීට වඩා බොහෝ සැහැල්ලු වනු ඇත. අතෘප්තිකර ජීවිත ඇතුළත ඇති ශෝකය භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීමේ නොනවතින ආශාව වටා නොනැවතීම කැරකැවෙයි. ඒ, මෙරිගෝ රවුමකි. මහත් ආශාවෙන් ඔබ ඒ කැරකීමට එකතු වේ. ඉන්පසු පශ්චාත්තාපීව, මහත් සාංකාවෙන් කල් ගෙවයි. මේ ස්වයං සාංකාව ඔබ විසින් ඉල්ලා ගනු ලබන්නකි. පීඩාවේ පරිමාව ලකුණු වන්නේ මේ ඉල්ලා ගැනීම මඟිනි. එහෙත් පීඩාවේ හෝ අතෘප්තියේ මුල කොතැන දැයි නොදැන එහි අතු කඩා දැමීමෙන් පලක් නොවේ. ගස මුලින් උදුරා නොදමන තාක් කල් ඔබ විසින්ම එයට ජලය සහ පොහොර දමමින් පෝෂණය කරනු ලබයි.

අතිරික්තයෙන් වෙන් වීමට යම් විනයක් තිබිය යුතු යැයි පවසන්නේ ඌණිතවාදයට අලුතින් එකතු වූ ගෘහ නිර්මාණ ශිල්පියකු වූ ජෝන් පෝසන් විසිනි. ජපන් ජාතික ගෘහ නිර්මාණ ශිල්පියකු යටතේ උගත් හෙතෙම තම ගෘහ නිර්මාණ ශිල්පය වෙනුවෙන් ද ඌණිතවාදය භාවිතයට ගනී. හිස් ඉඩ සමග නිවාස සැලසුම් කරන හෙතෙම ලුහුඬු බව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත. තරුණ වියේ පටන් බහුලත්වය ප්‍රිය නොකර ලුහුඬු බව කෙරෙහි ඇලුණු පෝසන් තම ජීවිතයටද එය ආදේශ කර ගැනීමට සිතා ඇත. ඔහු ඌණිතවාදයට ප්‍රවේශ වන්නේ ඒ ආකාරයෙනි.

ඇලීමේ ආනිසංස ගැන නිතර කතා කරන, සුළු දේ අගය කිරීම ගැන දේශනා අසන්නට ලැබෙන, දන් දීම ගැන උත්කර්ෂවත් දේ පවසන ජාතියක් වන අපට ඌණිතවාදය ගැන මීට වඩා බරපතළව සිතිය හැකිය. අතෘප්තිමත් ජීවිත ගත කිරීම වෙනුවෙන් සිය පණ නසා ගැනීමට තෝරා ගැනීම වෙනුවට සුළු දේ අගය කරමින් අතිරික්තය ඉවත හෙළමින් ජීවත් වීමට සිතා බැලිය හැකි නම් බහුතරයකගේ ජීවිත සටන් මීට වඩා අතිශය සරල වනු නියතය.

**කාංචනා අම්ලානි**
**බීබීසී ඇසුරෙනි**




# මානසික රෝග රැසකට අත වනන කොරෝනා උවදුර

ශ්‍රී ලංකාවේ බොහෝ දෙනකුට කොරෝනා වසංගතය ගැන මේ වන විට අමතක වී ගිය බවක් දක්නට ලැබේ. එසේ නොවන්නට මේ උත්සව සමයේදී පුද්ගල දුරස්ථකරණය ද නොතකා හරිමින් බොහෝදෙනකු සමාජයේ නොගැවසෙනු ඇත. එනිසා වසන්තය සමරන්නට පළමුව වසංගතයෙන් බේරීමට අවධානය යොමු කළ යුතුය. අප එසේ පවසන්නේ අන් කිසිදු කරුණක් නිසා නොව, බ්‍රසීලයේ තත්ත්වය ද මේ වන විට බෙහෙවින්ම නරක අතට හැරී ඇති බව වාර්තා වන නිසයි. පැය විසි හතරකට කොරෝනා මරණ 4000කට අධික සංඛ්‍යාවක් බ්‍රසීලයෙන් වාර්තා වෙයි. මෙය කොරෝනා වසංගතය තදින්ම බලපෑ අනෙක් කිසිඳු රටකින් මෙතෙක් වාර්තා නොවූ වෙනස්ම ආකාරයේ තත්ත්වයකි. බ්‍රසීලයේ ඇතැම් ප්‍රදේශවල ජනයා ප්‍රතිකාර අපේක්ෂාවෙන් රෝහල්වල පෝලිම්වල රැඳී සිටියදී මැරී වැටෙන බව බී.බී.සී. ප්‍රවෘත්ති සේවය වාර්තා කර තිබිණ. රෝගීන් සංඛ්‍යාව වැඩිවීමත් සමග ම බ්‍රසීලයේ බොහෝ ප්‍රදේශවල සෞඛ්‍ය සේවා කටයුතු ද බිඳ වැටී ඇත. රෝහල් කොරෝනා රෝගීන්ගෙන් පිරී ඉතිරී ගොස් ඇති බවද සඳහන් වේ. එරට කොරෝනා මරණ 337 000කට අධික සංඛ්‍යාවක් මේ වන විට සිදුව ඇත. කොරෝනා වසංගතය නිසා මෙවන් භයානක වාතාවරණයක් බ්‍රසීලයෙහි ඇති වන විට කොරෝනා ආසාදනය වී සුවය ලබන අය මුහුණ දෙන අයහපත් සෞඛ්‍ය තත්ත්ව කීපයක් පිළිබඳව වෛද්‍ය විශේෂඥයෝ අනතුරු අඟවති.

කොරෝනා ආසාදනය වූ අයට පළමු මාස හය ඇතුළතදී විෂාදය, ඩිමෙන්ෂියා, සයිකෝසියාව, ආඝාතය යනාදී වශයෙන් ඇති ව්‍යාධීන් වැලඳීමට වැඩි ඉඩක් තිබෙන බව පර්යේෂණයකින් සනාථව ඇත. කොරෝනා ආසාදනය වී රෝහල් ගත කර හෝ දැඩි සත්කාර ඒකකවල රඳවාගෙන හෝ ප්‍රතිකාර ලබා සුවය ලැබූ අය වඩාත් බරපතළ තත්ත්වවලට මුහුණ දෙන්නට ඉඩ ඇති බව ද හෙළි වී තිබේ. කොරෝනා වයිරසයෙන් ඍජුව ම මොළයට බලපෑම් එල්ල වන බව ද පර්යේෂණය සිදු කළ විශේෂඥ වෛද්‍යවරු පවසති. බ්‍රිතාන්‍ය පර්යේෂකයන් පිරිසක් මේ පර්යේෂණය සිදු කළේ කොරෝනා ආසාදනය වී සුවය ලද පිරිස්වලින් තුනෙන් පංගුවක් පමණ නොයෙක් ආකාරයේ මානසික රෝගවලට සහ ස්නායු රෝගවලට ගොදුරුවන ප්‍රවණතාවක් අනාවරණය වීමත් සමගය.

කොරෝනා වැලඳුණු එක්සත් ජනපද වැසියන් මිලියන හයකට අධික සංඛ්‍යාවකගේ වෛද්‍ය වාර්තා පරීක්ෂා කිරීමට පර්යේෂකයෝ සමත්ව සිටිති. කොරෝනා ආසාදනය වී සුවය ලද එම පිරිසට මානසික රෝග හෝ ස්නායු රෝග හෝ දහහතරකින් එකක් වැලඳීමේ අවදානමක් ඇති බව පර්යේෂකයන්ට පෙනී ගොස් ඇත. කොරෝනාවෙන් සුවය ලැබූවන්ට වැලඳෙනු ඇතැයි නිශ්චය කර ඇති රෝග අතර මොළයේ රක්තපාතය, ආඝාතය, පාකින්සන්, ගුයිලේන්-බාරේ සින්ඩ්‍රෝමය, ඩිමෙන්ෂියා, සයිකෝසියාව, කාංසාව, මානසික ආතතිය වැනි රෝග පර්යේෂකයන් පෙන්වා දෙන එම රෝග දහහතර අතර තිබේ. සමහරුන්ට විෂාදය සහ ආඝාතය වැනි රෝග තත්ත්ව ඇති වී තිබුණේ කොරෝනා ආසාදනය වීමෙන් සුවය ලබා මාස හයකට පමණ පසුවය.

පර්යේෂණයට භාජනය කළ පිරිසෙන් 24%කට ආසන්න පිරිසකට සයිකෝසියාව වැනි තත්ත්ව මතු වී ඇත. මේ තත්ත්වය කොරෝනා නිසා රෝහල් ගත කළ ප්‍රතිකාර ලැබූ 28%ක් අතරත් දැඩි සත්කාර ඒකකවල ප්‍රතිකාර ලැබූ 36%ක් අතරත් දක්නට ලැබුණු බව පර්යේෂකයෝ සඳහන් කරති. ආඝාතය ඇති වී තිබුණේ කොරෝනා ආසාදනයෙන් සුවය ලද 2%ක් වැනි පිරිසකටය. ඩිමෙන්ෂියා වැලඳුණු ප්‍රමාණය 0.7%ක් පමණ වන බව සඳහන් වේ.

බ්‍රිතාන්‍යයේ ඇල්ෂයිමර් පර්යේෂණ ඒකකයෙහි ප්‍රධානී ආචාර්ය සාරා ඉමරිසියෝ මේ සම්බන්ධයෙන් පළ කරන්නේ මෙවැනි මතයකි.

" මෙයට පළමුව කරන ලද පර්යේෂණවලින් තහවුරු වී තිබුණේ ඩිමෙන්ෂියා වැලඳුණු අයට ඉතා තදින් කොරෝනා ආසාදනය වෙන්න වැඩි ඉඩක් තියෙන බවය. නමුත් මෙම පර්යේෂණයෙන් අනාවරණය වන කරුණු අනුව තත්ත්වය හුගක් වෙනස්ය. මෙම නව අධ්‍යයනය මඟින් කොරෝනා සහ ඩිමෙන්ෂියා අතර සම්බන්ධතාවය අනෙක් දිශාවට පැවතිය හැකි බව ද පෙන්නුම් කරනවා ..."

මේ අතර ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ස්නායු පිළිබඳ මහාචාර්යවරයකු වන මසූද් හුසේන් සඳහන් කරන්නේ කොරෝනා ඇති කරන වයිරසය මිනිස් මොළයට ඇතුළු වී හානි පමුණුවන බවට සාක්ෂි ඇති බවකි. ඒ හැරුණු විට කොරෝනා වයිරසය මිනිස් රුධිර කැටි ගැසීම ඇති කිරීමට වක්‍රාකාරයෙන් රුකුල් දෙන බව ද විශේෂඥ වෛද්‍යවරු සඳහන් කරති. එය ආඝාතය ඇති කිරීමට ද හේතු වන තත්ත්වයකි.

කොරෝනා වයිරසය ගැන නොතකා හැර කටයුතු කරන බොහෝදෙනා මේ කරුණු අවධානයට ගත යුතුව ඇත. කොරෝනා එක් පැත්තකින් මාරාන්තිකය. කෙරෝනා ආසාදනය වීමෙන් කෙනකු ජීවිතක්ෂයට පත් නොවූවද ඉහත සඳහන් කළ ආකාරයේ ස්නායු රෝගයකට හෝ මානසික රෝගයකට හෝ ගොදුරු වුවහොත් ජීවිතයෙන් ඇති ඵලය කුමක් ද?.

**මංජුලා විජයරත්න**
**BBC ඇසුරෙනි**

sports.dinamina@lakehouse.lk

# මී. 800 කාන්තා ඉසව්වේදී දිල්ෂිගෙන් ශ්‍රී ලංකා වාර්තාවක්

## ලෝක කනිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලියට ශානිකා යයි



දිල්ෂි කුමාරසිංහ

**ප්‍රින්ස් ගුණසේකර**

මීටර් 800 කාන්තා ධාවන ඉසව්වේ නව ශ්‍රී ලංකා වාර්තාවක් පිහිටුවීමට දිල්ෂි කුමාරසිංහ සමත් වූ අතර, එම ඉසව්වෙන්ම තරග කළ ශානිකා ලක්ෂාණි නයිරෝබිහි පැවැත්වෙන ලෝක කනිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලියට සුදුසුකම් ලබා ගැනීම විශේෂත්වයකි.

කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේ ඊයේ පැවති මලල ක්‍රීඩා ජාතික තේරීම් තරගාවලියේදී ශ්‍රී ලංකා යුද හමුදාව නියෝජනය කරමින් දිල්ෂි කුමාරසිංහ එම ඉසව්ව මිනිත්තු 2:02.52කින් නිම කර වාර්තාව පිහිටුවූවාය. මෙයට පෙර එම ඉසව්වේ ශ්‍රී ලංකා වාර්තාව 2017දී බියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේදී ගයන්තිකා අබේරත්න මිනිත්තු 2:02.55කින් පිහිටුවා තිබිණි.

ශ්‍රී ලංකා නාවික හමුදාවේ ගයන්තිකා අබේරත්න ඊයේ තරගයේදී තෙවැනි ස්ථානයට පත් වූ අතර, ඇය වාර්තා කළ කාලය මිනිත්තු 2:03.64කි. මේ තරගයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිමාලී ලියනාරච්චි මිනිත්තු 2:03.15කින් දෙවැනි ස්ථානයට පත් වූවාය. නව ශ්‍රී ලංකා වාර්තාව පිහිටුවූ දිල්ෂි කුමාරසිංහ නේපාලයේ කත්මණ්ඩු නුවරදී නිමාව දුටු දකුණු ආසියානු ක්‍රීඩා උලෙළේ රන් පදක්කම් තුනක් දිනා ගැනීමට සමත් වූවාය.

ලෝක කනිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලියට සුදුසුකම් ලැබූ ශානිකා ලක්ෂාණි මිනිත්තු 2:07.02කින් තරගය නිම කිරීම හේතුවෙන් ඇයට මේ වසරේ අගෝස්තුවේ පැවැත්වෙන තරගාවලියට සහභාගි වීමේ අවස්ථාව උදා විණි. ලෝක කනිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලියට කාන්තා මීටර් 800 ඉසව්වේ පරිසාධන මට්ටම මිනිත්තු 2:08.70ක් වී තිබිණි. මලල ක්‍රීඩා ජාතික තේරීම් තරගාවලියේදී දිල්ෂි කුමාරසිංහ සහභාගි වූ මීටර් 400 කාන්තා තරගයෙන් ද පළමු ස්ථානයට පත් වීම කැපී පෙනිණි.

ඇය එම ඉසව්ව තත්පර 53.43කින් නිම කිරීමට සමත් වූවාය. මීටර් 400 කාන්තා ඉසව්වේ දෙවැනි ස්ථානය නදීෂා රාමානායක තත්පර 53.48කින් දිනාගත් අතර, කෞෂල්‍යා මධුෂානී තත්පර 56.24කින් තෙවැනි ස්ථානයට පත් වූවාය. මේ තිදෙනාම ශ්‍රී ලංකා යුද හමුදාව නියෝජනය කරන ක්‍රීඩිකාවන් වීම විශේෂත්වයකි.

මීටර් 400 පිරිමි අවසන් තරගය ජාතික ශූර ශ්‍රී ලංකා යුද හමුදාවේ කාලිංග කුමාරගේ තත්පර 45.99ක කාලයක් වාර්තා කරමින් ජය ගැනීමට සමත් වූ අතර, දකුණු ආසියා රන් පදක්කම්ලාභී යුද හමුදාවේම අරුණ දර්ශන තෙවැනි ස්ථානයට පත් විය. මෙහි දෙවැනි ස්ථානය තත්පර 46.82කින් ශ්‍රී ලංකා යුද හමුදාවේ ජී.ඒ.එම්. ගුණරත්න දිනා ගත්තේය.

මීටර් 800 පිරිමි ධාවන ඉසව්වේ මුල් ස්ථාන තුනම ශ්‍රී ලංකා යුද හමුදාවේ ක්‍රීඩකයන් සතු වීම විශේෂත්වයකි. පළමු ස්ථානය ජී.ආර්. චතුරංග (මිනිත්තු 1:49.82), දෙවැනි ස්ථානය සමන් කුමාර ප්‍රනාන්දු (මිනිත්තු 1:52.53) හා එන්.සී.විජේසිංහ (මිනිත්තු 1:52.70) තෙවැනි ස්ථානයට පත් වූහ.

ඊයේ නිමා වූ මීටර් 1500 කාන්තා තරගය මිනිත්තු 4:24.06කින් ගයන්තිකා අබේරත්න දිනා ගනිද්දී එහි පිරිමි ඉසව්ව හේමන්ත කුමාර මිනිත්තු 3:55.16කින් දිනා ගත්තේය.



ශානිකා ලක්ෂාණි

රිටි පැනීමේ පිරිමි ඉසව්ව මීටර් 4.90ක දක්ෂතාවකින් ශ්‍රී ලංකා යුද හමුදාවේ එස්. පුවතිරන්, මිටිය විසි කිරීම කාන්තා ඒ.එස්.එම්. අමරසිංහ සහ තුම්පිම්ම කාන්තා ඉසව්ව කේ.ඒ.ටී. ලක්ෂානී මීටර් 12.73කින් දිනා ගත්තාය.

මීටර් 400 කඩුලු පැනීමේ කාන්තා ඉසව්වේදී ශ්‍රී ලංකා යුද හමුදාවේ ජී.ඒ.එස්. දුලානී මිනිත්තු 1:01.67කින් පළමු ස්ථානයට පත් වූ අතර, එහි පිරිමි තරගයේදී ඒ.එල්.ඒ.අයි. රත්නසේන තත්පර 51.88කින් පෙරමුණේ පසු විය.

මීටර් 200 තරගයේදී යුද හමුදාවේ නදීශා රාමණායක තත්පර 24.28කින් පළමු ස්ථානයට පත් වූ අතර, පිරිමි අංශයෙන් මොහොමඩ් සෆාන් තත්පර 20.85කින් පළමු තැනට පත් විය. මීටර් 100 අවසන් මහා තරගයේදී පිරිමි හා කාන්තා ජාතික ශූරයන් වන හිමාෂ ඒෂාන් සහ අමාෂා ද සිල්වා එම ඉසව්ව ජයගත් අතර, හිමාෂ තත්පර 10.38 ක් හා අමාෂා තත්පර 11.60ක කාලයන් වාර්තා කළහ.

ෂෙලින්ඩා ජැන්සන් වසර 2019න් පසු යළි ධාවන පථයට පැමිණ තත්පර 12.07ක කාලයක් වාර්තා කරමින් දෙවැනි ස්ථානයට පත් විය.

# ශ්‍රී ලංකාවට එරෙහිව බංග්ලාදේශයෙන් නවකයෝ 4ක්

තරග දෙකකින් සමන්විත ටෙස්ට් තරගාවලියක් සඳහා මේ මාසයේ ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වීමට නියමිත බංග්ලාදේශ කණ්ඩායමේ මූලික සංචිතය ප්‍රකාශ කිරීමට එරට ක්‍රිකට් ආයතනය කටයුතු කරයි.

විසි එක්දෙනකුගෙන් යුත් එම සංචිතයේ නායකත්වය මොමිනුල් හක්ට පැවරී ඇති අතර, නවක ක්‍රීඩකයන් සිව්දෙනකු ඇතුළත්ව සිටීම විශේෂත්වයකි.

ෂොරිෆුල් ඉස්ලාම්, මුකිදුල් ඉස්ලාම්, ෂොහිදුල් ඉස්ලාම් සහ යසීර් අලි මෙලෙස සංචිතයට එක්ව ඇති තවමත් ටෙස්ට් වරම් නොලැබූ ක්‍රීඩකයන් වන අතර, අවසන් වරට බංග්ලාදේශ පිල සහභාගි වූ කොදෙව්වන්ට එරෙහි තරගාවලියට එක්ව සිටි මුස්ටෆිසුර් රෙහ්මාන්, සෞම්‍ය සර්කාර් සහ හසන් මහමුද්ට ස්ථාන අහිමි වී තිබේ.

නුරුල් හසන්, ෂුවගොටෝ හෝම් සහ කලීඩ් අහමඩ් නැවත සංචිතයට එක්ව ඇති අතර, තුන් ඉරියව් ක්‍රීඩක ශකීබ් අල් හසන් සමඟ මුස්ටෆිසුර් ඊයේ ආරම්භ වූ ඉන්දීය ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියට එක්ව සිටීම හේතුවෙන් මේ තරගාවලියෙන් ඉවත් වූහ.

කෙසේ වෙතත් තරගාවලියට එක් වන අවසන් සංචිතය ශ්‍රී ලංකාවේදී ප්‍රකාශයට පත් කිරීමට බංග්ලාදේශ ක්‍රිකට් තේරීම් කමිටුව කටයුතු කරනු ඇත.

මේ මස 12 වැනිදා ශ්‍රී ලංකාවට පැමිණෙන බංග්ලාදේශ පිල දින 7ක කාලයක් නිරෝධායනය වන අතර, ඒ අතරතුර සංචිතය දෙකට බෙදී කටුනායකදී 17සහ 18 දෙදින පුහුණු තරගයකට ද එක්වීමට නියමිතය. ඔවුන්ට පුහුණු සැසි සඳහා ශ්‍රී ලංකා ක්‍රීඩකයන් නොදෙන බැවින් මේ සංචිතයේ අතිරේක පන්දු යවන්නන් ද සමඟ 21 දෙනාම ශ්‍රී ලංකාවට රැගෙන ඒමට නියමිත බව බීසීබී ප්‍රධාන තේරීම් කමිටු සභාපති මින්හාජුල් අබේඩින් පැවසීය.

පසුගිය වසරේ පැවැත්වීමට නියමිතව තිබූ මේ තරගාවලිය පසුගිය ජූලි මාසයේදී කොරෝනා වසංගතය හේතුවෙනුත්, ඔක්තෝබර් - නොවැම්බර් මාසවල කොරෝනා නිරෝධායන නීති හේතුවෙනුත් කල් දැමීමට සිදු විය.

දෙරට අතර තරගාවලිය මහනුවර පල්ලේකැලේ ක්‍රීඩාංගණයේදී පැවැත්වෙන අතර, පළමු තරගය 21 වැනිදාත්, දෙවැනි සහ අවසන් තරගය 29 වැනිදාත් ආරම්භ වීමට නියමිතය.

බංග්ලාදේශ ටෙස්ට් සංචිතය: මොමිනුල් හක් (නායක), ලිටොන් දාස්, මොහොමඩ් මිතුන්, මුෂ්ෆිකූර් රහීම්, තමීම් ඉක්බාල්, ශද්මන් ඉස්ලාම්, අබු ජයද්, තායිජුල් ඉස්ලාම්, නජ්මුල් හුසේන් ෂැන්ටෝ, මෙහිදි හසන් මිරාස්, නයීම් හසන්, ටස්කින් අහමඩ්, ඊබදත් හුසේන් චෞද්‍රි, යසිෆ් හසන්, යසීර් අලි, ෂොරිෆුල් ඉස්ලාම්, කලීඩ් අහමඩ්, මුකිදුල් ඉස්ලාම්, ෂුවගතා හෝම්, ෂොහිදුල් ඉස්ලාම්, නුරුල් හසන්.

# තෝමා විස්සයි20 ක්‍රිකට් අද - හෙට මාතරදී

**වැලිගම සමූහ - ටී.කේ. මහින්ද**

මාතර සාන්ත තෝමස් ආදි ක්‍රිකට් සංගමය ප්‍රථම වරට සංවිධාන කරන ‘තෝමා විස්සයි20’ තුන්කොන් ක්‍රිකට් තරගාවලිය අද (10) සහ හෙට (11) දිනවලදී මාතර උයන්වත්ත ක්‍රීඩාංගණයේ දී පැවැත්වේ.

මාතර රාහුල විද්‍යාලය, සාන්ත තෝමස්, සාන්ත සර්වියසස් කණ්ඩායම් මේ තරගාවලියට සහභාගි වේ. ක්‍රීඩා සන්නිවේදන කුසලතා ප්‍රගුණ කිරීමෙන් නව ලොව ජය ගනිමු යන්න තේමා කර ගනිමින් මේ පාසල්වල දරුදැරියන් සඳහා ක්‍රිකට් විස්තර ප්‍රකාශක පුහුණු වැඩසටහනක් ද මේ තරගාවලියට සමගාමීව පැවැත්වීමට කටයුතු යොදා ඇත. තරගාලියේ සමාරම්භක උලෙළ ඉන්දික සේරම් මහතාගේ සහ සමාප්ති උත්සවය ප්‍රවීණ ක්‍රිකට් ක්‍රීඩකයන් වන සනත් ජයසූරිය හා ප්‍රමෝද්‍ය වික්‍රමසිංහ යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට නියමිතය.

# ක්‍රිකට් තේරීම් ප්‍රමෝද්‍ය අතට



ශ්‍රී ලංකා ක්‍රිකට් නව තේරීම් කමිටු සභාපතිවරයා ලෙස ප්‍රමෝද්‍ය වික්‍රමසිංහ මහතා පත් කරයි.

හිටපු වේග පන්දු යවන්නකු වූ වික්‍රමසිංහ මහතා 1996 ලෝක කුසලානය දිනාගත් කණ්ඩායමේ සාමාජිකයෙක් ද වේ. මින් පෙර ද තේරීම් කමිටු සාමාජිකයකු ලෙස කටයුතු කර ඇති වික්‍රමසිංහ මහතා නිමා වූ ශ්‍රී ලංකා පිලේ කොදෙව් සංචාරයේදී තේරීම් නිලධාරියකු ලෙස කටයුතු කළේය.

ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ අනුමැතිය සහිතව පත් කළ මේ කමිටුව සාමාජිකයන් 6 දෙනකුගෙන් සමන්විතය.

රොමේෂ් කළුවිතාරණ, හේමන්ත වික්‍රමරත්න, වරුණ වරාගොඩ, උවයිසුල් කර්නයින් සහ තිලකා නිල්මිණි ගුණරත්න මහත්ම මහත්මීහු කමිටුවේ සෙසු සාමාජිකයෝ වෙති.

මේ කමිටුවට ජාතික පිරිමි හා කාන්තා කණ්ඩායම් සමඟ ‘ඒ’ කණ්ඩායම්, නැඟී එන කණ්ඩායම් සහ අවුරුදු 19න් පහළ කණ්ඩායම් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගැනීම ද සිදු කරනු ඇත.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් යවන ලද නිර්දේශයන්ට අනුව යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා ප්‍රමුඛ ජාතික තේරීම් කමිටුව විසින් මේ තේරීම් කමිටුව නම් කර තිබේ.

හිටපු තේරීම් කමිටු සභාපති අසන්ත ද මැල් මහතා ධුරයෙන් ඉල්ලා අස්වීම නිසා ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා මේ නව තේරීම් කමිටුව පත් කිරීමට පියවර ගැනිණි.

# කළුතර ප්‍රිමියර් ලීග් අවසන් තරගය අද පාණදුරේ

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අනුග්‍රහයෙන් කළුතර දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය සංවිධාන කරන කළුතර ප්‍රිමියර් ලීග් විස්සයි20 ක්‍රිකට් තරගාවලියේ අවසන් තරගය අද (10 දා) පාණදුර නගර සභා ක්‍රීඩා පිටියේදී පෙ.ව. 10 සිට පැවැත්වේ.

දිස්ත්‍රික්කය තුළ වූ කණ්ඩායම් 20ක් එක් වූ මේ තරගාවලියේ අවසන් පූර්ව තරගවලදී පාණදුර ක්‍රීඩා සමාජය විසින් සමර්සෙට් ක්‍රීඩා සමාජයට එරෙහිව ලකුණු 65ක ජයක් ද ඒ.එම්. ක්‍රීඩා සමාජය විසින් මිල්ලණිය ක්‍රීඩා සමාජයට එරෙහිව කඩුලු 8ක ජයක් ද වාර්තා කරමින් අවසන් මහා තරග වරම් දිනා ගත්තේය. කළුතර දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ සභාපති ප්‍රසන්න අමරසේකර මහතා ඇතුළු සංගම් නිලධාරීන් විසින් සංවිධාන කරන මේ තරගාවලියේ ජයග්‍රාහකයන්ට ශූරතා කුසලාන සමඟ මුදලින් රුපියල් 50,000ක්ද අනුශූරයන්ට රු. 20,000ක්ද පිරිනැමෙනු ඇත.

මීට අමතරව අවසන් පූර්ව තරගවලදී පරාජයට පත් වන කණ්ඩායම් සඳහා ද මුදල් ත්‍යාග පිරිනැමෙන අතර, දක්ෂතම පිතිකරු, දක්ෂතම පන්දු යවන්නා, දක්ෂතම පන්දු රකින්නා සහ තරගාවලියේ වීරයා වෙනුවෙන් ද ත්‍යාග පිරිනැමීමට කටයුතු යොදා තිබේ.

## අන්තර් සමාජ ක්‍රිකට්

# එක්දින කිරුළට එන්සීසී - රාගම හෙට අවසන් සටනේ



ඉෂාන් ජයරත්න

**නිරෝෂාන් ප්‍රියංකර**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සංවිධාන කරන අන්තර් සමාජ එක්දින ක්‍රිකට් තරගාවලියේ අවසන් මහා තරගයට සුදුසුකම් ලබා ගැනීමට එන්සීසී සහ රාගම කණ්ඩායම් සමත් වෙයි. එම තරගය හෙට (11) එස්එස්සී ක්‍රීඩාංගණයේදී පැවැත්වේ.

ඊයේ සීසීසී පිටියේ පැවැති පළමු අවසන් පූර්ව තරගයෙන් බදුරලිය ක්‍රීඩා සමාජය ලකුණු 18කින් පරාජය කිරීමට එන්සීසී කණ්ඩායම සමත් වූ අතර, දෙවැනි අවසන් පූර්ව තරගයේදී රාගම ක්‍රිකට් සමාජය හමුවේ යුද හමුදා කණ්ඩායම කඩුලු 8කින් පරාජයට පත් වූයේ එන්සීසී පිටියේදීය.

බදුරලිය සමඟ තරගයේදී පළමුව පන්දුවට පහර දුන් එන්සීසී පිල කඩුලු 7ක් දැවී ලකුණු 292ක් රැස් කළ අතර, එම ඉලක්කය හඹා ගිය බදුරලිය ක්‍රීඩා සමාජයට ඕවර 49.3කදී සියල්ලන් දැවී රැස් කළ හැකි වූයේ ලකුණු 274ක් පමණි.

බදුරලිය පිල ජයග්‍රහණය කරා ගෙන යෑමට උත්සාහ කළ තිලකරත්න සම්පත් ලකුණු 98ක් රැස් කරමින් ඉනිමට සාර්ථක ආරම්භයක් දුන්නද සෙසු පිතිකරුවන් අසාර්ථක වීමෙන් පරාජය වැළඳ ගැනීමට කණ්ඩායමට සිදු විය. හතරේ පහර 11ක් සහ හයේ පහර 3ක් එල්ල කළ සම්පත් වැය කළේ පන්දු 97ක් පමණි. පන්දු යැවීමේදී ළහිරු කුමාර කඩුලු 4ක් බිඳ දැම්මේය.

අන්තර්ජාතික පිටියට සමුදීමෙන් පසු ක්‍රීඩා කරන පළමු දේශීය තරගාවලිය වන මේ තරගාවලියේ දෙවැනි තරගයට එක් වූ උපුල් තරංග එන්සීසී පිලට සාර්ථක ආරම්භයක් දුන්නේ ශතකයක් රැස් කරමිනි. පන්දු 139කින් ලකුණු 136ක් රැස් කළ ඔහුගේ ඉනිම හතරේ පහර 12කින් සහ හයේ පහර 3කින් වර්ණවත් විය. කමිල් මිෂාර සමඟ එක්ව දෙවැනි කඩුල්ලට ලකුණු 99ක සබඳතාවක් පිහිටුවූ තරංග අනතුරුව තවත් අර්ධ ශතක සබඳතා දෙකක් ද පිහිටුවීය. කමිල් මිෂාර ලකුණු 46කට දැවී ගියේය. පන්දු යැවීමේදී අලංකාර අසංක කඩුලු 3ක් සහ චාමිකර එදිරිසිංහ කඩුලු 2ක් බිඳ දැම්මේය.

එන්සීසී පිටියේ පැවැති තරගයේ පළමුව පන්දුවට පහර දුන් යුද හමුදා පිල ලකුණු 178ක සීමා කළ රාගම ක්‍රීඩකයෝ පන්දු 64ක් ඉතිරිව තිබියදී ජයග්‍රාහී ඉලක්කය පසු කළේ කඩුලු 2ක් පමණක් අහිමි කර ගනිමිනි.

රාගම ඉනිම ඉලක්කය කරා ගෙන යෑමට ආරම්භක පිතිකරු සමින්ද ප්‍රනාන්දු සමත් වුවත් ඊයේ ඔහු අවාසනාවන්ත පිතිකරුවකු බවට පත් වූයේ ශතකයට ලකුණක් පසුපසින් සිටියදී දුවද්දි දැවී යෑමට හසු වීම හේතුවෙනි. ඔහු පිටියෙන් ඉවත් වන විට රාගම පිලට ජයග්‍රහණය සඳහා අවශ්‍යව තිබුණේ ලකුණු 5ක් පමණි. පන්දු 145කට මුහුණ දුන් ප්‍රනාන්දු හතරේ පහර 6ක් සහ හයේ පහරක් එල්ල කර තිබිණි. නිෂාන් මධුෂ්ක ලකුණු 34ක් සහ දිනෙත් තිමෝද්‍ය ලකුණු 33ක් ඉනිමට එක් කළහ.

ලකුණු 45කට කඩුලු 4ක් බිඳ වැටීමෙන් පළමුව පන්දුවට පහර දුන් යුද හමුදා ඉනිම ආරම්භයේදීම අඩපණ වූ අතර, හිමාෂ ලියනගේ සහ නායක තිසර පෙරේරා එක්ව ලකුණු 76ක් එක් කළ ද ඉනිම විශාල ලකුණු සංඛ්‍යාවක් කරා ගෙන යෑමට එය ප්‍රමාණවත් නොවීය. ඔවුන් දෙදෙනාටම රැස් කළ හැකි වූයේ ලකුණු 45 බැගිනි.

යුද හමුදා ඉනිම බිඳ දැමූ ඉෂාන් ජයරත්න ලකුණු 31කට කඩුලු 5ක් දවාගත් අතර, ඔහුට අනගි සහායක් දුන් බිනුර ප්‍රනාන්දු ලකුණු 30කට කඩුලු 3ක් බිඳ දැම්මේය.



උපුල් තරංග






2021 අප්‍රේල් 10 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# ඇඟලුම් - තේ අපනයන ආදායමට වඩා වැඩි මුදලක් වසරකට ඉන්ධන ගෙන්වීමට වැය වෙනවා

## ජනාධිපති ලේකම්

**ජයසිරි මුණසිංහ**

ශ්‍රී ලංකාවේ ප්‍රධානම අපනයන ආදායම් මාර්ග දෙක වන ඇඟලුම් සහ තේ ආදායම් මුදලටත් වඩා වැඩි මුදලක් වසරකට ඉන්ධන පිටරටින් ගෙන්වීමට වැය කිරීමට සිදුවන බව ජනාධිපති ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහතා අනාවරණය කෙළේය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කොළඹ හිල්ටන් හෝටලයේ පෙරේදා (8) පැවැත්වූ බදු පිළිබඳ බදු ගෙවන්නන් දැනුවත් කිරීමේ ඉහළ පෙළේ සම්මන්ත්‍රණයේ ප්‍රධාන ආරාධිතයා ලෙස එක්වෙමින් ජයසුන්දර මහතා මේ බව කියා සිටියේය.

රටේ බදු පරිපාලනයක අනුකූලතාව දැක්වීම මූලික අංගයකි. උපදේශනය හා දැනුවත් කිරීම ඉන් සිදු කෙරේ. එහි වගකීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් දරනු ඇති. ඒ අනුව යමින් මුදල් අමාත්‍යාංශයේ මඟපෙන්වීම පරිදි බදු සංශෝධනය කිරීමේ අරමුණ හා එහි ප්‍රතිලාභ ප්‍රතිපත්ති සම්පාදකයන් හා බදු පරිපාලන නිලධාරීන් එක්ව සැමට පැහැදිලි කිරීම අරමුණින් මෙම සම්මන්ත්‍රණය පැවැත්විණි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ජයසුන්දර මහතා මෙසේද පැවසීය.

වසරකට පිටරටින් ඉන්ධන ගෙන්වීමට එ.ජ.ඩොලර් මිලියන 5000ක මුදලක් වැය කිරීමට සිදු වෙනවා. එය ඇඟලුම් හා තේ අපනයන ලබන මුදලටත් වැඩියි.

අපේ රටේ අපනයන ආදායම් ඉපැයීම් විවිධාංගීකරණය වී තිබේ. අප තවදුරටත් කෘෂිකාර්මික, කාර්මික අපනයන ආදායම් මත රැඳී නොසිටිය යුතුයි. කෘෂිකාර්මික අංශය වේවා තේ පොල් රබර් වලට අමතරව කුරුඳු ගම්මිරිස් වැනි අපනයන පුළුල් කිරීමක් ඔස්සේ වෙළෙඳ පොළ දිනාගැනීමට පියවර ගත යුතුයි. ඒ වගේම කාර්මික නිෂ්පාදන අංශයද ඉලෙක්ට්‍රොනික් තොරතුරු තාක්ෂණ නව නිපැයුම් අඩු පිරිවැය නිෂ්පාදන ක්‍රමවේද භාවිතා කර ගනිමින් දියුණු කළ යුතුය.

මේ වසරේ මුල් මාස තුන තුළ ඩොලර් මිලියන 3000ක අපනයන ආදායමක් ලබාතිබීම පිළිබඳ අප සතුටු විය යුතුයි. එමෙන්ම අඩුම තරමින් ඩොලර් මිලියන 4000ක, 5000ක ආනයන වියදමක් අඩු කර ගැනීමට අප කටයුතු කළ යුතුයි. දේශීය කර්මාන්ත නගා සිටුවා හැකි තරම් ආනයන ආදේශන කර්මාන්ත දියුණු කර විදේශ විනිමය රට තුළ ඉතිරි කර ගැනීමට අප පියවර ගත යුතුය. මෙහිදී විශේෂයෙන් පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය අත්‍යාවශ්‍ය නොවන ආහාර ද්‍රව්‍ය හැකි තරම් මෙරට නිෂ්පාදනය කිරීමට පියවර ගැනීම ඖෂධ නිෂ්පාදනය අපි සිදු කළ යුතුය. වසරකට ඩොලර් මිලියන 2000ක මුදලක් ආහාර ද්‍රව්‍ය පිටරටින් ගෙන්වීමට අප වැය කරනවා. අල, බී ලූනු, කරවල, සෝයා ඇතුළු බොහෝ දේ පිටරටින් ගේනවා. මේවා මෙරටේම නිෂ්පාදනය කර ගැනීමට හැකි දේවල්. අපි ඉක්මනින් දේශීය කිරිපිටි සහ දේශීය සීනි නිෂ්පාදනය උපරිම මට්ටමට ගෙන ආ යුතුයි.

අන්තර්ජාතික වෙළඳාමේ දී ශ්‍රී ලංකාවේ වෙළෙඳ නාමයන් නව නිෂ්පාදනයන් වැඩි වැඩියෙන් ක්‍රියාත්මක කළ යුතුයි. ආණ්ඩුව අරමුණ අය වැය හිඟයත් වෙළෙඳ හිඟයත් අඩු අගයක තබාගෙන ආර්ථිකය මෙහෙයවීමයි. විදේශ විනිමය මෙරටට හැකි තරම් ගෙන ආ යුතුය. එහිදී විදේශ රැකියා සහ දේශීය වශයෙන් මෙහි සිට විදේශ විනිමය උපයන නව සේවා අංශ කෙරෙහි මානව සම්පත යොමු කළ යුතුයි. මාස 4ක කාලයක ආනයන අවශ්‍යතාවය සපුරා ගැනීමට හැකි ලෙස අපේ විදේශ නිල සංචිතය තබා ගැනීම අපගේ ඉලක්කයයි. නිෂ්පාදන පිරිවැය ඉහළ භාණ්ඩ හා සේවා නිපැයුමට වඩා ලාබදායි සහ කාර්යක්ෂම නිෂ්පාදන පිරිවැයක් දැරීමට හැකි ලෙස අපේ කර්මාන්ත නවීකරණය විය යුතුයි. විදේශ විනිමය ස්ථාවර මට්ටමක තබාගැනීම නැතිනම් රුපියලේ අගය ආරක්ෂා කර ගැනීම අපේ අරමුණයි. රජයේ ණය ප්‍රධාන වශයෙන් දේශීය අංශයෙන් ලබාගැනීමට ඉලක්ක කොට තිබෙනවා. හැකි තරම්



විදේශ ණය ගැනීම් අඩු කිරීමට ආණ්ඩුව තීරණයක් ගෙන තිබෙනවා. රටේ ණය බර දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 80%ක මට්ටමට තබා ගැනීම ආණ්ඩුවේ අරමුණයි. රට පුරා දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියක් ආරම්භ වී තිබෙනවා. මහාමාර්ග, වාරිමාර්ග, විදුලිබල, ජලසම්පාදන, සෞඛ්‍ය අධ්‍යාපන, නාගරික සංවර්ධනය, වරාය, ගුවන්තොටුපොළ ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාවලියක් සිදු කොට තිබෙනවා. මේ අන්දමට දියුණු යටිතල පහසුකම් ජාලයක් ඇති කොට ගම නගරය එකසේ දියුණු කිරීම ආණ්ඩුවේ අරමුණයි. මෙහිදී බදු ප්‍රතිසංස්කරණ රාශියක් හඳුන්වාදීමට අප පියවර ගන්නවා. ඉදිරි වසර 05 සඳහා ස්ථාවර නොවෙනස් බදු ප්‍රතිපත්තියක් ගෙන එනවා. ජාතිය ගොඩනැගීමේ බද්ද, රඳවා ගැනීමේ බද්ද, උපයනවිට ගෙවන බද්ද, මේ ආදී විවිධ බදු අය කිරීම් අවසන් කොට අප අගය එකතු කිරීම් මත අය කළ බද්ද VAT බද්ද 17% සිට 8% දක්වා අඩු කිරීමට තීන්දු කරා. එසේ කිරීම තුළ බදු ක්‍රමය සරලවීමත් බදු අනුපාත අඩු කිරීමත් සිදු වුණා. මේ රටේ පුද්ගල ආදායම් මත අය කරන උපරිම බදු ප්‍රතිශතය 18%යි. මෙම අඩුකිරීම තුළ පනස්දහසක් දෙනාට සෙත සැලසුණා. ඒ වගේම රුපියල් මිලියන 3කට වඩා ආදායම් ලබන පුද්ගලයකු තමන්ගේ සෞඛ්‍ය ආරක්ෂණයට ලබාගන්නා රක්ෂණාවරණ වලට, නව ආයෝජන වලට ඉතුරු කිරීම් වලට කොටස් වෙළඳපොළ කරන ගනුදෙනුවලට මින් ඉදිරියට බදු අය කරන්නේ නැහැ.

කෘෂිකාර්මික අංශය ගතහොත් සාම්ප්‍රදායික ගොවිතැනට අමතරව ධීවර, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර, කරදිය ධීවර, තොරතුරු තාක්ෂණ, පුනර්ජනනීය බලශක්ති, ඇතුළු අංශ ගණනාවකට බදු සහන ලබාදී තිබෙනවා. අපේ රටේ පවත්වාගෙන යන කර්මාන්ත ක්ෂේත්‍රයේ මහා පරිමාණ ආයෝජන වලට කළ ආයෝජන සඳහා අය කරන උපරිම බදු මුදල 24%කි. මෙය යන්ත්‍රෝපකරණ ක්ෂයවීම මත අඩු කිරීමටත් කටයුතු කරනවා. ව්‍යාපාර බදු, පුද්ගල බදු, යනාදිය කලාපයේ අඩුම අය කරන ප්‍රතිශතයක් තිබෙන්නේ අපේ රටේයි. චීනයේ, ඉන්දියාවේ, බංදේශයේ, තායිලන්තයේ, වියට්නාමයේ බදු ප්‍රතිශත අපිට වඩා වැඩියි. අපගේ අරමුණ වැඩි වැඩියෙන් නිෂ්පාදන සිදු කොට ඒ ඔස්සේ ආදායම් උපයාගැනීමක් සිදු කිරීම විනා ආර්ථික වර්ධනයට බාධා වන අයුරින් හෝ එය මන්දගාමී වන අයුරින් කටයුතු කිරීම නොවෙයි. රජය අය වැයෙන් කළ බදු සංශෝධන නීතිගත කිරීමටට නව පනතක් ලෙස මේ වන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. එය පාර්ලිමේන්තුවේ සම්මත වූ වහාම නීතියක් බවට පත් කරනවා. එම නීතිය තුළ එක් එක් පුද්ගලයින්ට අවශ්‍ය පරිදි බදු සංශෝධන කිරීමක් සිදු වන්නේ නැහැ. ඉදිරි වසර 05 සඳහා තිරසාර බදු ප්‍රතිපත්තියක් අපි ගෙන එන්නේ රටේ සංවර්ධනයේ ඇති කිරීමේ අරමුණ මූලික කරගෙනයි. මෙවැනි බදු සංශෝධන පිළිබඳ බදු ගෙවන්නන් දැනුවත් කිරීම අගය කළ යුත්තක්. ඒ සඳහා මූලිකත්වය ගත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අපගේ ප්‍රණාමය පුද කරනවා.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් එච්.එම්.ඩබ්ලිව්.සී. බණ්ඩාර මහතා ද මෙහිදී කතා කෙළේය.

මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්.ආර්. ආටිගල, අමාත්‍යාංශයේ බදු සම්බන්ධ උසස් නිලධාරීහු, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධානීහු සහ ඉහළ පෙළේ බදු ගෙවන්නෝ විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වී සිටියහ.

# ‘සිව් දෙස සුරැකි සිව් වසර’ සමරු කලාපය ජනපතිට පිළිගන්වයි



ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට වසර 4ක් පිරීම නිමිත්තෙන් දීප ව්‍යාප්තව සංවිධාන කළ සම්මේලන මාලාවට සමගාමීව සම්පාදනය කළ “සිව් දෙස සුරැකි සිව් වසර” යනුවෙන් නම් කළ සමරු කලාපය පක්ෂයේ මහ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ සාගර කාරියවසම්, මාධ්‍ය ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්න යන මහත්වරුන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට පිළිගැන්වූ අයුරු.

# රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා නව ආයෝජන කලාපයක් ආරම්භ කිරීමට පියවර ගන්න

## ආයෝජන මණ්ඩලයේ නිලධාරීන්ට රාජ්‍ය ඇමැති ඩී.වී. චානක උපදෙස් දෙයි

**නුවන් කොඩිකාර**

රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා මේ වන විට ලෝක වෙළෙඳපොළේ විශාල ඉල්ලුමක් පවතින හෙයින් සුදුසු භූමියක් අධ්‍යයනය කර රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා නව ආයෝජන කලාපයක් ආරම්භ කිරීමට පියවර ගන්නැයි ගුවන් සේවා හා ආයෝජන කලාප සංවර්ධන රාජ්‍ය ඇමැති ඩී.වී. චානක මහතා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

රාජ්‍ය ඇමැතිවරයා මේ උපදෙස් දුන්නේ, කොළඹ ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ ඇති සිය අමාත්‍යාංශයේ පැවති රැස්වීමකදීය.

මේ සඳහා සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා රාජ්‍ය ඇමැති කනක හේරත්, සහ එම අමාත්‍යාංශයේ නිලධාරීන්, ගුවන් සේවා හා ආයෝජන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් හා ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයනකරුවන්ගේ සංගමයේ සභාපති රොහාන් මාස්කෝරාල මහතා ඇතුළු ඉහළ පෙළේ නිලධාරීහු රැසක් සහභාගි වී සිටියහ.

වැඩිදුරටත් අදහස් දැක් වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේද පැවසීය.

දැනට තිබෙන ආයෝජන කලාප තුළ පවතින කර්මාන්ත ශාලා තවදුරටත් පුළුල්





කළ නොහැකි නිසා ඉක්මනින්ම සුදුසු භූමියක් අධ්‍යනය කළ යුතුයි.

දේශිය රබර් නිෂ්පාදන ව්‍යවසායකයන්ගේ ඉල්ලීම අනුව අක්කර 200ක පමණ භූමයක අවශ්‍යතාවය දැනටමත් පවතිනවා. එසේම විදේශ ආයෝජකයන් විශාල ප්‍රමාණයක් මේ පිළිබඳ උනන්දු වෙනවා. ඒ සඳහා ද අක්කර 400ක් පමණ අවශ්‍ය වෙනවා. රබර් නිෂ්පාදන ක්‍රියාවලියේ දී ජලය අවශ්‍ය මෙන්ම බැහැර කිරීමද අත්‍යවශ්‍ය කරුණක්. අපට මේ පිළිබදව උනන්දු වන්න වෙනවා. එසේම රබර් නිෂ්පාදන කර්මාන්තයේදී අවශ්‍ය රසායනික ද්‍රව්‍ය හා අනෙකුත් අවශ්‍යතාවයන් විශාල ප්‍රමාණයක් ආනයනය කරනවා. ඒ නිසා ආයෝජකයන් කොළඹ වරායට පහසුවෙන් ප්‍රවිශ්ඨ විය හැකි ප්‍රදේශ පිළිබඳ සැලකිල්ලක් දක්වනවා. මේ සියළු කරුණු සැලකිල්ලට ගනිමින් ඉතා ඉක්මනින් නව ආයෝජන කලාපය පිහිටුවීමට කටයුතු කරන්නවා.

ජනාධිපතිවරයා අපනයන ආර්ථිකයකට රට යොමු කර තිබෙනවා. තව දුරටත් දේශීය රබර් අමුද්‍රව්‍ය ලෙස අපනයනය නොවිය යුතුයි. එය අගය එකතු කළ නිමි නිෂ්පාදන ලෙස අපනයනය වනු දැකීම රජයේ අපේක්ෂාවයි. දේශීය රබර් ගොවියා ශක්තිමත් වෙමින් රටට වැඩි විදේශ විනිමයක් ලබාදෙන කර්මාන්ත සඳහා අවධානය යොමු කරන ලෙස ද ඉල්ලා සිටිනවා.

දේශීය රබර් වගාව ප්‍රචලිත කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාවට නංවනවා. ඉදිරියේදී සාම්ප්‍රදායික ප්‍රදේශවලින් බැහැර ව නව ප්‍රදේශ කීපයක් රබර් වගාව ආරම්භ කිරීම සඳහා හඳුනාගෙන ඇති බවත් සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා රාජ්‍ය ඇමැති කනක හේරත් මහතා මෙහිදී පැවසීය.

# කුරුණෑගල නව ජාතික රෝහල ඉදි කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කෝටි 1,200ක්

කුරුණෑගල නව ජාතික රෝහල ඉදිකිරීම සඳහා රුපියල් කෝටි 1,200 ක (බිලියන 12ක) ප්‍රතිපාදන වෙන් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කරයි.

ඇමැතිවරිය මේ බව පැවසුවේ කුරුණෑගල නව රෝහල ඉදිකිරීමේ කටයුතු පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යංශයේ ඊයේ (9) පැවති සාකච්ඡාවකදී ය.

තවදුරටත් සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය මෙසේද පැවසීය.

වසර ගණනාවක් පැරණි රෝහලක් වන කුරුණෑගල ශික්ෂණ රෝහල නවීන තාක්ෂණයෙන් යුතු රෝහලක් බවට පරිවර්තනය කිරීම සඳහා රුපියල් කෝටි 1,200ක මුදලක් තිපෙනවා.

ප්‍රධාන මාර්ග 5ක් එකිනෙකට සම්බන්ධ වන කුරුණෑගල නගරයේ මෙම රෝහල පිහිටා ඇති බැවින් වෙනත් දිස්ත්‍රික්කවලින් ද විශාල ජනකායක් ප්‍රතිකාර සඳහා පැමිණෙනවා.

කොළඹ ජාතික රෝහලට හා මහනුවර රෝහලට පමණක් දෙවැනි වන කුරුණෑගල මහ රෝහල අක්කර 35ක භූමි ප්‍රමාණය පිහිටා ඇති අතර මේ වනවිට රෝහලේ ඇති ඇඳන් සංඛ්‍යාව 2374ක්. රෝහල තුල වාට්ටු සහ ඒකක 84ක්. ශල්‍යාගාර 06ක්. විවිධ රෝගවලට ප්‍රතිකාර කිරීමට සායන 65 ක් ක්‍රියාත්මකයි. රෝහල තුල වසරකට ශල්‍ය කර්ම 14000ක් පමණ සිදුකරන අතර 2020 වසරේ ප්‍රතිකාර ලබාගැනීමට පැමිණි රෝගීන් සංඛ්‍යාව 165,875ක්.

එම නිසා ජනතාවගේ සෞඛ්‍ය සේවාවන් ලබාදීමට දැනට පවතින රෝහල වෙනුවට නව රෝහලක් ඉදිකිරීම පිළිබඳ අගමැතිවරයාගේ අවධානය යොමු වී තිබෙනවා.

මෙම සාකච්ඡාව සඳහා වරාය නාවික කටයුතු මාර්ග හා මහාමාර්ග සංවර්ධන ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු, ඖෂධ නිෂ්පාදනය සැපයීම හා නියාමන රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන, අතිරේක ලේකම්වරුන් වන ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත සහ වෛද්‍ය සුනිල් ද අල්විස් මහත්වරුන්, කුරුණෑගල ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂවරයා ප්‍රමුඛ වෛද්‍ය නිලධාරීහු කොන්ත්‍රාත් සමාගම් නියෝජිතයෝ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීහු එක්ව සිටියහ.

# ‘මිහිකත අබිමන්’ විසිතුරු මල් දැක්ම රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධගේ ප්‍රධානත්වයෙන් ඇරඹේ

**උපාලි කරුණාරත්න**

දිවුලපිටිය සහ කටාන “මිහිකත අබිමන්” විසිතුරු මල් දැක්ම ආරම්භ කිරීම ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතාගේ ප්‍රදානත්වයෙන් පසුගියදා (7) සිදු කෙරිණි.

ජනාධිපතිතුමාගේ “සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව අගමැතිවරයාගේ උපදෙස් පරිදි මල් වගාව ආශ්‍රිත කර්මාන්තකරුවන් දිරි ගැන්වීම උදෙසා ශ්‍රී ලංකා පොදුජන මල්වගා හා ඒ ආශ්‍රිත වෘත්තිකයන්ගේ සහ කර්මාන්තකරුවන්ගේ ජාතික සංවිධානයේ මෙහෙයවීමෙන් “මිහිකත අබිමන්” දිවුලපිටිය සහ කටාන ප්‍රාදේශීය සංසදය මෙම විසිතුරු මල් දැක්ම සංවිධානය කෙළේය.

දිවුලපිටිය ප්‍රාදේශීය සංසදය සංවිධානය කරනු ලබන මල් දැක්ම දිවුලපිටිය නගරයේ දී අද (10)



දක්වා පැවැත්වෙන අතර කටාන ප්‍රාදේශීය සංසදය සංවිධානය කරනු ලබන මල් දැක්ම කටාන වලිසිංහ හරිස්චන්ද්‍ර ක්‍රීඩාංගණ පරිශ්‍රයේදී හෙට (11 )දින දක්වා පැවැත්වේ.

මෙහිදී විවිධ විසිතුරු මල් වර්ග සහ විසිතුරු පැළෑටි වර්ග සහන මිලට ජනතාවට මිලදී ගැනීමට අවස්ථාව උදාවේ.

# ‘සෞභාග්‍යා පුලතිසි දැක්ම-2021’ විවෘත වෙයි





**නුවන් කොඩිකාර සහ පොළොන්නරුව සමූහ**

දිරියෙන් ජීවිතය දිනන්නට වෙර දරණ ග්‍රාමීය ව්‍යවසායකයන් දිරිගැන්වීම උදෙසා පැවැත්වෙන 'සෞභාග්‍යා පුලතිසි දැක්ම -2021' වෙළෙඳ ප්‍රදර්ශනය, තරුණ හා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ, පළාත් පාලන හා පළාත් සභා රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පෙරේදා (8) විවෘත කෙරිණි.

මෙම අවස්ථාවට සමගාමීව polonnaruwa.online වෙබ් අඩවිය ද රාජපක්ෂ මහතා අතින් අන්තර්ජාලයට එක් කෙළේය.

පුලතිසිපුර නව වෙළෙඳ පරිශ්‍රයේ පැවැත්වෙන මෙම වෙළෙඳ ප්‍රදර්ශනය ලබන 11 වැනිදා දක්වා පැවැත්වෙන අතර පොළොන්නරු දිස්ත්‍රික්කයේ ජනතාවගේ අත්කම්, ඇඟලුම් , විලාසිතා, දැව නිෂ්පාදන, රස කැවිලි, පළතුරු, විසිතුරු මසුන් ,විසිතුරු මල් වර්ග, ලිපි ද්‍රව්‍ය සහ ක්‍රීඩා භාණ්ඩ ආදී ඉහළ වටිනාකමකින් යුතු දේශීය නිෂ්පාදන එහිදී මිලදී ගැනීමට හැකිය.

සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළ යටතේ 'අනාගත පොළොන්නරුව' තුළ ග්‍රාමීය ආර්ථිකය සවිබල ගන්වමින් නිෂ්පාදන ආර්ථිකයක් බිහි කිරීමේ උනන්දුව වැඩි කිරීමට මෙම ප්‍රදර්ශනය ඉවහල් වේ.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දිරිගැන්වීමටත් මෙම ප්‍රදර්ශනය මහඟු පිටුබලයලක් බව පළාත් පාලන හා පළාත් සභා රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ මහතා මෙම අවස්ථාවට එක්වෙමින් පැවැසීය.

සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළ යටතේ ' අනාගත පොළොන්නරුව' තුළ ග්‍රාමීය ආර්ථිකය සවිබල ගන්වමින් නිෂ්පාදන ආර්ථිකයක් බිහි කිරීමේ උනන්දුව වැඩි කිරීමටත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරි ගැන්වීමටත් මෙම ප්‍රදර්ශනය මහඟු අවස්ථාවක් බව රජ්‍ය ඇමැතිවරයා පැවසීය.

# ශ්‍රී ලංකා යුද හමුදාවේ දක්ෂතා සලකා බලා එජා සාම සාධක හමුදාවට අප එක් කර ගත්තා

යුද හමුදාපති ශවේන්ද්‍ර සිල්වා



## මාලි රාජ්‍යයේ සාම සාධක කටයුතුවලට තුන්වන සංග්‍රාමික ප්‍රවාහන භට කණ්ඩායම පිටත් වෙයි



**රක්ෂණ ශ්‍රියන්ත කුකුලේගඟ සිට...**

ලෝකයේ දරුණුතම ත්‍රස්ත්‍රවාදී කණ්ඩායම විනාශ කළ ශ්‍රී ලංකා යුද හමුදාව සතු හැකියාවන් දක්ෂතාවන් වෙන කිසිදු රටක හමුදාවක් සතු නොවන හෙයින් එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවන්ට අපේ හමුදාවද එක් කර ගත් බවත් එය අපේ හමුදාවන් සතු මානුෂීය භාවය ලොවට කියා පෑමට අවස්ථාවක් බවත් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද හමුදාපති, ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පවසයි.

එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් රාජකාරීන් සඳහා මාලි රාජ්‍යය වෙත පිටත්ව යෑමට නියමිත තුන්වන සංග්‍රාමික ප්‍රවාහන භට කණ්ඩායම විසින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා වෙත සම්මාන පෙළපාළියක් ඊයේ (08) කුකුළේ ගඟ සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනයේදී මහත් අභිමානයෙන් පිරිනැමිණි. ඒ අවස්ථවේදී යුද හමුදාපතිවරයා මේ බව පැවැසීය

නිලධාරීන් 20 දෙනෙකු සහ සෙසු නිලයන් 223 දෙනෙකුගෙන් සමන්විත 03වන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම් පෙළපාළියෙන් අනතුරුව ඔවුන් මාලි රාජ්‍යයේ සාම සාධක හමුදාවන් සඳහා එක්වීමට නොබෝ දිනකින් පිටත්ව යනු ඇත.

මෙම තුන්වන සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම මාලි රාජ්‍යයේ රාජකාරී කටයුතු සඳහා යෑමට ප්‍රථම තම පුහුණුවීම් කටයුතු සඳහා මෙම පුහුණු පාසල වෙත පසුගිය ජූනි 20 වන දින පැමිණ පාඨමාලාව ආරම්භ කර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ රාජකාරී සිදු කරනු ලබන සාමාජිකයකුගේ මූලික නීති රෙගුලාසියේ සිට මාලි රාජ්‍යයේ රාජකාරී සිදු කරනු ලබන ආකාරය පිළිබඳව දක්වා සාර්ථක පුහුණුවකින් පසු මාදුරු ඔය යුද්ධ හමුදා පුහුණු පාසලේද ක්ෂණික ක්‍රියා සරඹ, ජීව වෙඩි තැබීම් වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලින් පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර ගැනීමෙන් පසුව හා දින 14 කාලසීමාක් තුළදී මෙම ඒකකයන්ට විශේෂ වූ ක්‍රියාකාරකම් සම්බන්ධව ප්‍රායෝගික පුහුණු වලින් පසුව අවසාන වශයෙන් හර්මතාන් ක්ෂේත්‍ර අභ්‍යාසය මගින් තම දැනුම පරිපූර්ණ කොට ඇත.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා ...

විශේෂයෙන්ම ශ්‍රී ලංකාව ත්‍රස්ත්‍රවාදීන්ගෙන් දසක තුනකට ආසන්න කාලයක් බැට කාපු රටක්. ත්‍රස්ත්‍රවාදීන් සමග සටන් කරලා මේ ලංකාද්වීපයේ සාමයෙන් සතුටින් ශ්‍රී ලංකා වාසි ජනතාවට ජීවත්වෙන්න පුළුවන් පරිසරයක් හදා දෙන්න ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාව ප්‍රමුඛ අනෙකුත් සියලුම අංශ කටයුතු කරනු ලැබුවා.

මෙසේ ප්‍රමුඛතම දායකත්වයක් සැපයූ ත්‍රිවිධ හමුදාවේ යුද හමුදාවේ කණ්ඩායමක් මේ ආකාරයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ රාජකාරී කිරීමට තෝරා ගැනීම මෙන්ම මීට පෙර අපි කණ්ඩායම් දෙකක් යවා තිබෙනවා. එය ශ්‍රී ලංකා හමුදාවන් කෙරෙහි ඇති විශ්වාසය සහ ඔවුන් කරන රාජකාරිය තුළ නිපුනත්වයේ ඇති විශ්වාසය නිසා තමයි මේ අවස්ථාවෙත් අපි මාලි රාජ්‍යයට සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායමක් වශයෙන් පිටත්ව යන්නේ.

මෙහිදී විශේෂයෙන් වැදගත් වන්නේ මාලි රාජ්‍යය යනු දැනට යුද තත්ත්වයක් පවතින රාජ්‍යයක්. එම රාජ්‍යයේ සාම සාධක රාජකාරී සඳහා යන අප බලාපොරොත්තු වන්නේ රටට සාමයක් ගෙනාපු හමුදාවක් වශයෙන් ඒ රටේ සාමය ළඟා කර දීම සඳහා කළ යුතු රාජකාරීන් ඉටු කිරීමටයි ගමන් ගන්නේ. මෙය එක්සත් ජාතීන්ගේ සාම සාධක භට කණ්ඩායම් තිබෙන් ස්ථාන අතරින් මෙය දුෂ්කරතම ස්ථානයක් වශයෙන් හඳුන්වන්නේ මාලි රාජ්‍යයේ තිබෙන සාම සාධක රාජකාරීන්.

ශ්‍රී ලංකා යුද හමුදාව තෝරාගෙන තිබෙන්නෙත් මම හිතන්නේ අපගේ තිබෙන දක්ෂතාව අනුවයි. මම හිතන්නේ මීට පෙරත් අපි ඉතාමත් දක්ෂ ලෙස කටයුතු කර තිබෙනවා. මීට කලින් සාමසාධක හමුදාව වශයෙන් ගිය අපේ නිලධාරියකු සහ සෙසු නිලයන් දෙදෙනකු ජීවිතක්ෂයට පත්ව තිබෙනවා. හත් දෙනෙකු පමණ තුවාල වූ අවස්ථාවකුත් තිබෙනවා. කෙසේ වෙතත් අප කළ හැකි උපරිම සේවය කරලා ලෝකය හමුවේ අප මොනතරම් මානුෂීය හමුදාවක්ද යන්න ඔප්පු කරවීම සඳහා එක් අවස්ථාවක් මේ අවස්ථාව. අප බලාපොරොත්තු වෙනවා ඉතාමත්ම දක්ෂ ලෙස රාජකාරී කරමින් මාලි රාජ්‍යයට සාමය ගෙන දීම සඳහා අපගෙන් කළ හැකි උපරිම සේවය කිරීමට. එක්සත් ජාතීන්ගේ සංවිධානය බලාපොරොත්තු වෙන ලෝක සාමය ගෙන ඒමේ සාම සාධක රාජකාරිය සඳහා ශ්‍රී ලංකාව වශයෙන් අපගේ මාතෘ භූමිය, අපේ රටේ ජනතාවට අභිමානයක් ගෙන දෙන ආකාරයෙන් ක්‍රියා කරමින් ලෝක සාමය ගෙන ඒමට උදව් කිරීම සඳහා.



රටක් වශයෙන් ගත් විට මාලි රාජ්‍යය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාම සාධක හමුදාවන් සිටින ඉතාමත් දුෂ්කරතම සාම සාධක රාජකාරී කරන ස්ථානය. මේකට සමහර රටවල් ඉදිරිපත් වෙන්නෙත් බොහොම අපහසුවෙන්. එහි ඇති දුෂ්කරතාව නිසා. එහි සටන් පවතින නිසා. එවැනි ස්ථානයකට සමහර රටවල් ඉදිරිපත් වෙන්නත් බයයි. නමුත් අප නවත්තන්න බැහැ කියපු යුද්ධයක් ජයග්‍රහණය කළ හමුදාවන් වශයෙන් අපට නිර්භීත හමුදාවක් සිටින නිසා තමයි මෙවැනි අභියෝග භාර ගන්න පුළුවන් හමුදාවක් රටේ ඉන්න නිසා තමයි මේ ආකාරයෙන් ඔවුන් ගමන් කරන්නේ.

විදේශ විනිමය සඳහා මෙය විශාල වශයෙන් බලපානවා. මේ කරන සෑම රාජකාරියක් වෙනුවෙන්ම හමුදාවට විශේෂයෙන්ම රටට ගෙවීමක් කරනු ලබනවා.

එමගින් ශ්‍රී ලංකාවට මුදල්මය වශයෙනුත් යම්කිසි වැදගත්කමක් දක්වනවා. ඊට අමතරව හමුදාවක් කියන්නේ සෑම වෙලාවකම අපට අත්දැකීම් අරන් ඉදිරියට යන්න ඕන. මේක ඉතාමත් හොඳ අත්දැකීම් ලබන අවස්ථාවක්. එම ප්‍රදේශවල ප්‍රහාර එල්ල කරනවා. බිම්බෝම්බ අටවනවා ඒවා අත්දැකීම්. එහිදී අපේ රටේ හමුදාවන්වල අභිමානය ලෝකය හමුවේ පෙන්වන්න පුළුවන් අවස්ථාවක්.

මේ අවස්ථාව සඳහා යුද හමුදාවේ උසස් නිලධාරීන් සමඟ පිටත්ව යන යුද හමුදාවේ සාමාජිකයන්ගේ පවුල්වල ඥාතීහුද එක්ව සිටියහ.

ජායාරූප - රුක්මල් ගමගේ

# ගෘහස්ථ සිතියම් තාක්ෂණය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙයි

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාවට මුල්වරට ගෘහස්ථ සිතියම් තාක්ෂණය හඳුන්වා දෙමින් කොළඹ, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපොළේ (BIA) Google Indoor Maps හඳුන්වා දීමට පියවර ගෙන තිබේ.

ඒ අනුව ශ්‍රී ලංකාව තුළ ගෘහස්ථ සිතියම් තාක්ෂණය හඳුන්වාදුන් පළමු ස්ථානය බවට ගුවන් තොටුපළ පත්ව තිබෙන අතර ශ්‍රීලංකන් ගුවන් සේවය සහ ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ තොරතුරු තාක්ෂණ කණ්ඩායම් එක්ව මෙම ගූගල් ගෘහස්ථ සිතියම් සක්‍රිය කර ඇත.



ඕනෑම ඇපල් හා ඇන්ඩ්‍රොයිඩ් උපාංග, ස්මාර්ට් ජංගම දුරකතන සහ ටැබ් උපකරණ මගින් මේ සඳහා ප්‍රවේශ වියහැකි අතර මෙම Google Indoor Maps හරහා මගීන් සහ අමුත්තන්ට ඔවුන්ගේ ගමන ආරම්භ කිරීමට හෝ ගුවන් තොටුපළට පැමිණීමට පෙර සිටම ගමන් මාර්ගයන් සොයා ගැනීමට පහසුකම් ලබාදෙයි.

ශ්‍රීලංකන් ගුවන් සේවය, BIA හි බලයලත් භූමි හසුරුවන්නා වන අතර ගුවන්තොටුපොළ ක්‍රියාකරු ලෙස AASL සමාගම මෙම ව්‍යාපෘතිය ආරම්භ කළේ මගීන්ට නැවුම් අත්දැකීමක් ලබා දිය හැකිවේ යන දැඩි විශ්වාසයෙන් ය. මෙවැනි මුලපිරීම් මගින් ජනාධිපතිවරයාගේ ඩිජිටල් හා තොරතුරු තාක්ෂණ දැක්ම තවදුරටත් ඉදිරියට ගෙන යෑමට හැකියාව ලැබෙන අතරම සංචාරක ඇමැති, ගුවන් හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරුන්ගේ මඟ පෙන්වීම යටතේ AASL සභාපති මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඒ චන්ද්‍රසිරි සහ ශ්‍රීලංකන් ගුවන් සමාගමේ සභාපති අශෝක් පතිරගේ යන මහත්වරුන් විසින් මෙය ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන තිබේ.

## ග්‍රාම නිලධාරීන්ගේ රාජකාරී ගැටලුවලට විසඳුම් සොයා දෙන්න ඇමැති නාමල් පොරොන්දු වෙයි

**නුවන් කොඩිකාර**

ගමේ දරුවන් ක්‍රීඩාවට නැඹුරු කර ගැනීමේ ක්‍රියාදාමයට සමගාමීව ග්‍රාම නිලධාරීන්ගේ මෙතෙක් නොවිසඳුණු ගැටලුවලට පිළියම් සැපයීමට බලාපොරොත්තු වන බව තරුණ හා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා පැවැසීය.

වසර 50 තිස්සේ නොවිසිඳුණු ගැටලු සම්බන්ධයෙන් එක්සත් ග්‍රාමනිලධාරී සංගමයේ මහත්ම මහත්මීන් පෙරේදා (07) දින තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයට පැමිණ ඉදිරිපත් කළ දැනුම්වත් කිරීම අවසානයේ ඇමැතිවරයා මේ බව කියා සිටියේය.

ග්‍රාම නිලධාරීන් වෙනුවෙන් රාජකාරි ගැසට් කර සේවා ව්‍යවස්ථාවක් ලබාදීම සහ රාජකාරි කරගෙන යෑමට කාර්යාලයක් සහ කොට්ඨාසයේ සංචාරය සඳහා වන ගෙවීම් ඇතුළු මූලික ගැටලු හා යෝජනා මෙහිදී ඉදිරිපත් විය.

ඒ සම්බන්ධව ඒ මොහොතේදීම ක්‍රියාත්මක වූ ඇමැති නාමල් රාජපක්ෂ මහතා සේවා ව්‍යවස්ථාවක් ලබාදීමේ කටයුතුවල වත්මන් තත්ත්වය සොයා බලා ඊට කඩිනම් විසඳුම් ලබා දෙන බව කියා සිටියේය.

ග්‍රාමනිලධාරි මහත්ම මහත්මීන්ගේ සේවා ස්ථානය සම්බන්ධයෙන් ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව යමින් සේවා පියසෙන් මුදල් වෙන් කර සියලුම ග්‍රාමසේවා වසම් සඳහා කාර්යාලීය පහසුකම් සැලසීමේ වැඩපිළිවෙළ දැනටමත් අරඹා ඇති බව රාජපක්ෂ මහතා මෙහිදී පැවැසීය.

ගම් මට්ටමේ රාජ්‍ය සේවකයන් විශ්‍රාම ගිය පසු ඔවුන් රැකබලා ගැනීමට ක්‍රමවේදයක් සකසන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් වූ අතර ඔවුන්ට (Green House Apartment) වැඩපිළිවෙළ හා සම්බන්ධ විය හැකි බව ඇමැතිවරයා මෙහිදි පෙන්වා දුන්නේය.

ක්‍රීඩා අමාත්‍යාංශය සමඟ එක්ව ග්‍රාම සේවා නිලධාරී මහතුන්ගේ මූලිකත්වයෙන් ග්‍රාමසේවා වසම්වල GS meet පැවැත්වීමට අදාළ ඉදිරි කටයුතු සාකච්ඡා කර ගැනීමට පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ මහතා සමඟ සාකච්ඡාවක් ලබාදීමට ද ඇමැතිවරයා මෙහි දී කටයුතු කළේය.

සැප්තැම්බර් 31 දාට යෙදෙන ක්‍රීඩා දිනයේ දී ශ්‍රී ලංකාවේ මිලියනයක පිරිසක් කුමන හෝ ක්‍රීඩාවකට යොමු කිරීමේ අරමුණ ඇතිව දැවැන්ත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බව ඇමැතිවරයා මෙහි දී හෙළිකළ අතර ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන්ගේ මැදිහත්වීමෙන් ගමේ දරුවන් ද ඊට යොමු කරන්නැයි ඉල්ලීමක් කළේය.

එක්සත් ග්‍රාම නිලධාරි සංගමයේ ග්‍රාමනිලධාරී මහත්ම මහත්මීන්ට අගමැතිවරයා සමඟ සාකච්ඡාවක් ලබාදීමට ඉදිරියේ දී කටයුතු කරන බව රාජපක්ෂ මහතා පැවැසීය.

ඉදිරි අවුරුදු 2 කාලය තුළ මුදල් ලබාගෙන සේවා පියස ඉදිකිරීම් 5000 දක්වා වැඩිකර රාජ්‍ය නිලධාරීන් සමඟ ක්‍රීඩා පිටි නඩත්තු කරන නිලධාරියා ද ඊට ඇතුළත් වන පරිදි සේවා ස්ථාන ලබාදීමට කටයුතු කරන බවත් එම ක්‍රීඩා පිටි නඩත්තු කරන නිලධාරියා භාරයේ ගමේ දරුවන්ට ක්‍රීඩා කිරීමට ග්‍රාම සේවා වසමකට ක්‍රීඩා බඩු සංචිතයක් ලබාදී ක්‍රීඩා පිටියේ නඩත්තුව හා එම බඩුවල වගකීම ඔහු වෙත පවරා එම වැඩපිළිවෙළ විධිමත් හා ක්‍රමවත්ව ක්‍රියාවට නංවන්න කටයුතු කරන බවත් තරුණ කටයුතු හා ක්‍රීඩා ඇමැතිවරයා කියා සිටියේය.

මෙම අවස්ථාවට ග්‍රාමීය පාසල් යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති තේනුක විදානගමගේ මහතා සහ එක්සත් ග්‍රාමනිලධාරීන්ගේ සංගමයේ ග්‍රාමනිලධාරි මහත්ම මහත්මීහු පිරිසක් සහභාගි වූහ.

## නව දේශපාලන පක්ෂ ලියාපදිංචියට එවූ අයදුම්පත්‍ර පරීක්ෂාව පටන් ගනී

**අනුර ප්‍රේමලාල්**

2021 වසරේ නව දේශපාලන පක්ෂ ලියාපදංචි කිරීමට අදාළව ලැබී ඇති අයදුම්පත්‍ර පරීක්ෂා කිරීම හා සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම මෙම (28) සිට ආරම්භ කරන බව මැතිවරණ කොමිෂන් සභාව දන්වා සිටියි.

එමෙන්ම 2020 ඡන්ද හිමි නාම ලේඛන ප්‍රතිශෝධනය නියමිත කාල වකවානු තුළ අවසන් කිරීම හා 2021 ප්‍රතිශෝධනය ආරම්භ කිරීම, ඡන්ද විමසීම් නීති සංශෝධනවල වර්තමාන ප්‍රගතිය, මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්මට අදාළ යෝජනා ලබා ගැනීම හා ඉදිරි ඡන්ද විමසීම්වල දී දිස්ත්‍රික් මට්ටමේ සංවිධායක කටයුතු පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාව සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ ඊයේ (07) සාකච්ඡා කර තිබේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගම්පහ දිස්ත්‍රික්කයේ සමගි ජන බලවේගය පක්ෂයේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇතිවී තිබෙන බව පාර්ලිමේන්තු මහ ලේකම් දන්වා ඇති අතර එම පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා 1981 අංක 01 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත ප්‍රකාරව තොරතුරු ඉදිරිපත් කරන ලෙස ගම්පහ දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරි වෙත දන්වා යැවීම හා ඒ අනුව අදාළ තැනැත්තාගේ නම ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කිරීම ගැනද මැතිවරණ කොමිෂම කටයුතු යොදා තිබේ.

## ශ්‍රී ලංකා මානව හිමිකම් සංවිධානයේ නව කාර්යාලයක් විවෘත වෙයි



**අනුර ප්‍රේමලාල්**

ශ්‍රී ලංකා මානව හිමිකම් සංවිධානයේ නව කාර්යාලයක් ග්‍රෑන්ඩ්පාස් සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ ලංකාරාමයේදී මානව හිමිකම් සංවිධානයේ දේශීය හා අන්තර්ජාතික කටයුතු අධ්‍යක්ෂ ආචාර්ය ඉසුරු ශම්මික බණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් සුබ මොහොතින් විවෘත කෙරිණි. මේ අවස්ථාවට පූජ්‍ය මතුරට ධම්මාලංකාර නායක ස්වාමීන් වහන්සේද මානව හිමිකම් සංවිධානයේ අධ්‍යක්ෂක ජෙනරාල්වරයාද ඇතුළු එහි අධ්‍යක්ෂක මණ්ඩලය හා සම්භාවනීය පිරිසක් එක්ව සිටියහ.

මීට සමගාමීව ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පදිංචි දිළිඳු පවුල් වල දරුවන් සඳහා පොත් පෑන් පැන්සල් පාසල් බෑග් ඇතුළු පාසල් උපකරණ රැසක් පරිත්‍යාග කළ අතර ලංකාරාමයේ මතුරට ධම්මාලංකාර නායක ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් පැවත්වෙන වැඩිහිටි නිවාසයටද අවුරුද්දට අවශ්‍ය උපකරණ හා දිවා ආහාරය ලබා දුන්නේය.

නව වසරේ සිදු කරනු ලබන සැමරුම් උත්සව වෙනුවට කොවිඩ්19 හෙවත් නව කොරෝනා වසංගතයෙන් පීඩාවට පත්වූ සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ජීවත් වන හා වෙනත් අවතැන් වූ පවුල් සඳහා අවශ්‍ය උදව් උපකාර කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් සංවිධානයේ අන්තර්ජාතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයා සියලු දෙනාගෙන් ඉල්ලා සිටියේය.

## දවසේ රාහු කාලය

උදේ 09.08 සිට 10.40 දක්වා රාත්‍රී 09.15 සිට 10.43 දක්වා



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂවේදී අජිත් ධර්මසිරි

## දින තත්ත්වය

මීන රවි 27 භාග මැදින් අව තුදුස්වක තිථිය ලත් ශනි දින ඉර උදාව 06.05 ඉර බැසීම 06.19 ට පුවපුටුප නැකත උදේ 06.48 න් ගෙවී උත්‍ර පුටුප නැකත උදාවේ. මැදින් අව තෙළෙස්වක තිථිය අලුයම 04.30න් ගෙවී අව තුදුස්වක තිථිය ලබා පවතී. බ්‍රහ්ම යෝගය දහවල් 01.37 න් ගෙවී මහේන්ද්‍ර යෝගය ලබයි. වණිජකරණය අලුයම 04.30 න් ගෙවී විෂ්තරණය ලබා එය සවස 05.17 න් ගෙවී ශකුණ කරණය උදා වන්නේය.

විෂ කලාව - ලිංග අමෘත කලාව - පතුල මරු සිටින දිසාව - නැගෙනහිර

යෝගිනි - බටහිර සුබ දිසාව - උතුර

## 2021.04.10 සෙනසුරාදා හෝරාව ලබා ගෙවී යන අයුරු

**උදේ**

06.05 - 07.05 දක්වා - සෙනසුරු හෝරාව
07. 05 - 08. 05 දක්වා - ගුරු හෝරාව
08. 05 - 09. 05 දක්වා - කුජ හෝරාව
09. 05 - 10. 05 දක්වා - රවි හෝරාව
10. 05 - 11. 05 දක්වා - සිකුරු හෝරාව
11. 05 - 12. 05 දක්වා - බුධ හෝරාව

**සවස**

12.05 - 01.05 දක්වා - සඳු හෝරාව
01.05 - 02.05 දක්වා - සෙනසුරු හෝරාව
02.05 - 03.05 දක්වා - ගුරු හෝරාව
03.05 - 04.05 දක්වා - කුජ හෝරාව
04.05 - 05.05 දක්වා - රවි හෝරාව
05.05 - 06.05 දක්වා - සිකුරු හෝරාව

**රාත්‍රී**

06.05 - 07.05 දක්වා - බුධ හෝරාව
07.05 - 08.05 දක්වා - සඳු හෝරාව
08.05 - 09.05 දක්වා - සෙනසුරු හෝරාව
09.05 - 10.05 දක්වා - ගුරු හෝරාව
10.05 - 11.05 දක්වා - කුජ හෝරාව
11.05 - 12. 05 දක්වා - රවි හෝරාව

**අලුයම**

12.05 - 01.05 දක්වා - සිකුරු හෝරාව
01.05 - 02.05 දක්වා - බුධ හෝරාව
02.05 - 03.05 දක්වා - සඳු හෝරාව
03.05 - 04.05 දක්වා - සෙනසුරු හෝරාව
04.05 - 05.05 දක්වා - ගුරු හෝරාව
05.05 - 06.05 දක්වා - කුජ හෝරාව

**බබාට නමක්**

උදේ 06.48 දක්වා පුවපුටුප නැකත උදාව පවතින නිසා සෙ, සො, ද, දි අකුරු ද ඉන් පසුව උදා වන උත්‍රපුටුප නැකත අනුව දු,ථ අකුරු ද දිනට හිමි ප, බ, හ, ම අකුරු ද මුල්කොට බබාට නමක් දැමීම සුබයි.






## දවසේ ලග්න පලාපල

**මේෂ ලග්නය - වංචනිකයින්ට හසු වේ**

මේෂ ලග්නයට අනුව අද බොහෝ ප්‍රවේශම් විය යුතු දිනකි. වංචාකාරයින්ට, බොරුකාරයින්ට හසුවන තත්ත්වයකි. පිටරටකට යාමට යයි කියා කෙනෙකුට මුදල් දීම අනුවණ ක්‍රියාවකි. මුදලත් ගමනත් අහිමි වනු ඇත. ටික දිනක් එබඳු දේ ප්‍රමාද කරන්න. රැකියා බාධක ද එළඹේ. දණහිසට අපලයි. තුනටියට ද එසේමයි. උඩක නැඟ රාජකාරි කරන අය ප්‍රවේශම් විය යුතුයි. දැනට පිටරටක සිටින අයකු නම් සුබ දිනකි.

**වෘෂභ ලග්නය - ලැබීම් අතින් උසස් වේ.**

වෘෂභ ලග්නයට අනුව අද දින ඔබට සුබයි. ආර්ථික වශයෙන් උසස් වේ. රවි බුධ සිකුරු හා චන්ද්‍ර යන සිවු ග්‍රහ සංයෝගය 11 හි යෙදීම නිසා ලැබීම් උසස් වේ. ආගමික කටයුතු කෙරේ දැඩි උනන්දුව මතු කෙරේ. නමුත් හිතට වද දෙන කාරණාවක් විටින් විට තම දියුණුවට හා හොඳ සිහි බුද්ධිය විනාශ කිරීමට හේතු වෙයි. සිත සන්සුන් කරවා ගන්න

**මිථුන ලග්නය - රැකියාවේ උසස්වීම්**

මිථුන ලග්නයට අනුව අද ඔබට රැකියා ස්ථානගත ප්‍රබල තත්ත්වයක් ඇති වේ. ප්‍රධානින්ගෙන් ප්‍රසාදය උසස් තත්ත්වය පිරිනැමීම නිසා සිතේ සතුට අභිවෘද්ධිය මතු කෙරේ. ධනය අතින් හදිසි ලැබීම් පෙන්වයි. පාදයේ වළලුකර ආශ්‍රිත උවදුරු පෙනේ. ඒ නිසා ප්‍රවේශම් වන්න. තුනටිය ආශ්‍රිතව ද රෝග හදිසි වැටීම් නිසා ආපදා විය හැකිය වාහන ලාභයක් පෙන්වයි.

**කටක ලග්නය - අමතක නොවන සිදුවීමක්**

කටක ලග්නයට අනුව අද දින ඔබේ ජීවිතයේ අමතක නොවන සිදුවීමකට හේතුවේ. තම ලේ ඥාතියකුගේ වියෝ වීමක් පෙන්වයි. ඒ වෙනුවෙන් කාලය , ධනය වැය කිරීමට සිදුවේ. එහෙත් එහිදී ඔබට හමුවන යහපත් මිතුරන් නිසා අනාගතයට හොඳ ශක්තිමත් අඩිතාලමක් දමා ගැනීමට හේතුවන දිනකි. විවාහ ස්ථානගත යම් යම් මතභේද ඇතිවන අතර, ආදර සබඳතාවලට විවිධ පාර්ශ්වයන්ගේ විරෝධය එල්ල වනු ඇත. මුත්‍ර දෝෂ , යටි බඩේ දෝෂ සහිතයි.

**සිංහ ලග්නය - අපවාද චෝදනා එල්ල වේ**

සිංහ ලග්නයට අනුව අද ඔබ ඉතා ප්‍රවේශම් විය යුතුය. තමා නොකළ වරදකට හසුවීමට ඉඩ ඇත. යහළුවන් නිසා කරදරේ වැටේ. අන්සතු දෙයක් තමා සතු කර ගැනීමට යාමේදී විවිධ බාධා අපවාද චෝදනා එල්ල වේ. ඒ නිසා නීති ගැටලු පවා ඒමට පුළුවන. ආගමික කටයුතු කෙරේ සිත යොදන්න. පිරිස එක්රොක් වන ස්ථානවලට යාමෙන් වළකින්න. .

**කන්‍යා ලග්නය - යුගදිවිය සුභවාදිය**

කන්‍යා ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. රවි, චන්ද්‍ර, බුධ, සිකුරු 7 වැන්නේ සංයෝග වීම සිතට දැඩි සහනය ගෙනෙන, තම ගෘහ ජීවිතය සැපවත් කරන යුගදිවිය සුබ කරන පිහිටීමකි. තම විවාහ සහකරු හෝ සහකාරිය තමාගේ කටයුතුවලට ඉතා යහපත් ප්‍රතිචාර දක්වන දිනකි. ආර්ථික සහජීවනය හා රැකියා ව්‍යාපාර සුබ වන දිනකි.

**තුලා ලග්නය - පිටරට ගමන් යෙදේ**

තුලා ලග්නයට අනුව අද දින ඔබට තම රාජකාරි කටයුතුවලින් මිදී දුරබැහැර ගමනකට හේතු වෙයි. පිටරටකට යාමට බලාපොරොත්තුවෙන් සිටි අයගේ අදහස් සපල වේ. ගොවි කටයුතු කෙරේ සිත යෙදූ අයට සුබයි. තම එදිනෙදා කටයුතු කාර්ය බහුලත්වයෙන් සිදු වේ. කෙනෙකුට දුන් මුදලක් ආපසු ගැනීමට නොහැකිව නීතියේ පිහිට පතන්නට සිදු වේ. කුස ආශ්‍රිත උවදුරු හා අජීර්ණ දෝෂ බලපාන දිනකි

**වෘශ්චික ලග්නය - ව්‍යාපාරික දියුණුවක්**

වෘශ්චික ලග්නය අනුව තම ජීවිතයේ සුබවාදි වෙනසක් මතු කෙරේ. තම පවුලට අලුතෙන් සාමාජිකයෙක් එකතු වේ. තමාට තම දූ පුතුන් වෙනුවෙන් ඒ අයගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් කාලයත්, ශ්‍රමයත් , මුදලත් වැය කිරීමට සිදු වේ. අදහස් කරගෙන සිටි ව්‍යාපාරික කටයුත්තක් සාර්ථක කර ගැනීමට හැකි වේ. තද බල හිසේ අමාරුවක් නිසා දවසේ වැඩි කොටසක් අපහසුතා විඳීමට සිදුවනු ඇත

**ධනු ලග්නය -නිවසක සිහිනය සැබෑ වේ**

ධනු ලග්නයට අනුව අද ඔබට සිය එදිනෙදා කටයුතු සාර්ථකව කරගෙන යාමට හැකිවේ. ආර්ථික යහපත උදාවේ. වාහනයක් නව නිවසක් පිළිබඳව තිබූ සිහිනය සැබෑවනු ඇත. තමාට බොහෝ පිටස්තරයින්ගෙන් ඒ සඳහා උදවු උපකාර ලැබේ. පාදයේ වළලුකර ආශ්‍රිත රෝග, හදිසි ආපදා පෙන්වයි. යටිබඩ අසාත්මිකතා ගෙනේ. වතුර පානය අඩු අයට මුත්‍ර දෝෂ මතු කෙරේ. ඒ හා සබැඳි පරීක්ෂණවලට පවා යෑමට සිදු වන දිනකි.

**මකර ලග්නය - නීති ගැටලු ලිහිල් වේ**

මකර ලග්නයට අනුව අද දින ඔබ මහමඟ ගමන් කරන විට ප්‍රවේශම් විය යුතුයි. ධන හානි හා තම මුදලක් නැතිවී යාමට බොහෝදුරට ඉඩ ඇත. නමුත් කලක් පැවති නීති ගැටලුවක් ලිහිල් වී කිසියම් දේපළක් හෝ උරුමයක් තමාට ලැබෙන තත්ත්වයක් පෙන්වයි. හා පපුවේ සෙම දැඩි වීම නිසා ප්‍රතිකාර ගැනීමට පවා සිදු වේ.

**කුම්භ ලග්නය - සතුටුදායක ආරංචි**

කුම්භ ලග්නයට අනුව අද දින ඔබට හදිසි ධන ලාභයක් පෙන්වයි. ලොතරැයි ජය තරග ජය හිමි වනු ඇත. විදෙස් රටක සිටින තම පවුලේ අයකුගෙන් සතුටුදායක ආරංචි ලැබේ. කලකට පසු විශ්වාස වන්ත මිතුරකු නැවත තම නිවසට පැමිණෙනු ඇත. පපුවේ අපහසුතා පැන නඟී. නහරගත රෝග , ලේ ගමනාගමන දුෂ්කරතා මතු කෙරේ. නමුත් ඔබට සැර උෂ්ණ ආහාර පානයෙන් ප්‍රවේශම් වීමෙන් යහපත උදාකර ගත හැකිය.

**මීන ලග්නය - සිතේ දැඩි සතුට**

මීන ලග්නයට අනුව අද දින ඔබට ඉතා සුබ දිනකි. තම අභිමතාර්ථයන් ඉටු වන දිනකි. සිතේ සතුට නිසා නව නිර්මාණ බිහි වේ. පරිගණක ක්ෂේත්‍රයේ කටයුතු කරන අයට සුවිශේෂයි. තම ගෘහ ජීවිතය සැපවත් වේ. අලුත් අලුත් රසවත් ආහාර පානවල රස විඳීමට හැකිවේ. තම දූ දරුවන් හා සමීපතමයින් සමඟ සතුටින් තම දවස ගත කිරීමට හැකි වේ. පාදයේ දණහිස උරහිස ආශ්‍රිත ආපදා විය හැකිය.

# ආණ්ඩුව කෙරෙහි වැරැදි වැටහීමක සිටි ගැටඹේ විහාරාධිපති හිමිගේ මතය නිවැරැදි කරන්න හැකි වුණා

## පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.බී. දිසානායක

**මහින්ද අලුත්ගෙදර**



වත්මන් ආණ්ඩුව සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සම්බන්ධයෙන් වැරැදි වැටහීමක සිටි ගැටඹේ රාජෝපවනාරාම විහාරාධිපති හිමියන්ගේ මතය නිවැරැදි කරන්න තමාට හැකිවූ බව නුවරඑළිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.බී දිසානායක මහතා ප්‍රකාශ කරයි.

මන්ත්‍රීවරයා මේ බව සඳහන් කළේ බත්තරමුල්ලේ පිහිටි ඒ මහතාගේ නිවෙසේ පැවැති මාධ්‍ය හමුවට එක්වෙමිනි. පසුගිය දිනෙක ගැටඹේ රාජෝපවනාරාම විහාරස්ථානයට ගිය එස්.බී දිසානායක මහතා විහාරාධිපති කැප්පෙටියාගොඩ සිරිවිමල නාහිමියන් හමුවූ අවස්ථාවේ සිදුවීම සම්බන්ධයෙන් විවිධ ප්‍රචාරයන් මාධ්‍ය ඔස්සේ පළවී තිබෙන අතර එහි සත්‍ය තත්ත්වය පැහැදිලි කිරීම වෙනුවෙන් මේ මාධ්‍ය හමුව පැවැත්විණි.

උන් වහන්සේගේ උපන් දිනය එදිනට යෙදී තිබූ අතර අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ සුබ පැතුම් නාහිමියන් වෙත පිළිගැන්වීම වෙනුවෙන් තමා එම විහාරස්ථානයට ගිය බවද උන් වහන්සේ අපි සමඟ සමීපව කටයුතු කරන බවද පෙන්වා දුන්නේය.

වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ හා ජී.එල් පීරිස් මහත්වරුන්ට උන් වහන්සේ ආදරය කරන බව පෙන්වා දුන් මන්ත්‍රීවරයා එදා තමා යෑමට පෙර අධ්‍යාපන ඇමැති ජී.එල්. පීරිස් මහතා එහි ගොස් තිබෙන බවද එහිදී නායක හිමියන් රජයට, අධ්‍යාපන අමාත්‍යාංශයට දෝෂාරෝපණය කළ බවද පැවසීය.

එහිදී තමා මේ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර දෙන්නට උත්සාහ කළ බව සඳහන් කළ එස්.බී. දිසානායක මහතා ආණ්ඩුව, අධ්‍යාපන ඇමැති හා අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ නිවැරැදි නොවන කාරණා සියල්ල තමා නිවැරැදි කිරීමට පියවර ගත් බවද උන් වහන්සේ එහිදී අමනාප නොවූ බවද පෙන්වා දුන්නේය.

කෙසේ වුවද මෙහිදී රජයේ ඇතැම් පත්වීම් සම්බන්ධයෙන් කැප්පෙටියාගොඩ සිරිවිමල නාහිමියන් කරුණු දැක්වූ බව සිහිපත් කළ මන්ත්‍රීවරයා ඇතැම් පත් කිරීම් හරහා විශාල ප්‍රගතියක් පෙන්නුම් කර තිබෙන බවට පෙන්නුම් කළ බවද උන් වහන්සේ හැම අවස්ථාවකම ජනතාවගේ පැත්තේ සිට අදහස් ඉදිරිපත් කරන සගරුවනක් බවද සිහිපත් කළේය.

තමන් වහන්සේ වැරැදි කියා සිතන කාරණා සම්බන්ධයෙන් මේ රට පාලනය කළ සියලු නායකයන්ට පෙන්වා දී තිබෙන හිමිනමක ලෙස ගැටඹේ විහාරාධිපති හිමියන් ප්‍රසිද්ධියක් උසුලන බව පෙන්වා දුන් මන්ත්‍රීවරයා ඒ අනුව රජය, ජනාධිපතිවරයා, අගමැතිවරයා සහ අධ්‍යාපන ඇමැතිවරයා සම්බන්ධයෙන් සිටි වැරැදි මතය නිවැරැදි කර ගන්න තමාට අවස්ථාව ලැබුණු බවද ප්‍රකාශ කළේය.

# පැළ මිලියන 22ක් රට පුරා සිටුවන්න ජනතාවට විවෘත ආරාධනාවක් කරනවා



## එජාප හිටපු පා.ම. ආශු මාරසිංහ

**මැද කොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ**

එක්සත් ජාතික පක්ෂය මේ වන විට හරිත ප්‍රකාශයක් නිකුත් කර තිබෙනවා. ඒ අනුව පැළ මිලියන 22ක් සිටුවීමට රටේ සෑම දිස්ත්‍රික්කයකම සිටින ජනතාවට විවෘත ආරාධනාවක් කරනවා. අප්‍රේල් 16 වැනි දින උදෑසන 6.40ට එම පැළ සිටුවීමට එක්වන්න කියා තාක්ෂණ හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ හිටපු උපදේශක එජාප හිටපු මන්ත්‍රී මහාචාර්ය ආශු මාරසිංහ මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා මේ ප්‍රකාශය කළේ පිටකෝට්ටේ සිරිකොත මන්දිරයේ පෙරේදා (08) පැවැති එක්සත් ජාතික පක්ෂයේ මාධ්‍ය හමුවේදීය.

මාධ්‍යවේදීන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් මහාචාර්ය ආශු මාරසිංහ හිටපු මන්ත්‍රීවරයා මෙසේද කීය.

ඒ වගේම 2020 ජනවාරි සිට 2021 මාර්තු මස අවසන් වන විට අක්කර 68000ක වන විනාශයක් සිදු කර තිබෙනවා. මේ වර්ෂයේ අප්‍රේල් මස ලැබීමට ප්‍රථම ජනවාරි පෙබරවාරි මාර්තු ඉකුත් දින 90 පමණක් අලි මරණ 90ක් සිදුවී තිබෙනවා. සිංහරාජය ගැන කතා කරපු උදවිය දැන් නිදි. නමුත් ඔවුන්ගේ තක්කඩි කතා මෙතෙක් අවසන් වී නැහැ. මේ රජයට අලි වැටවත් මේ දක්වා ක්‍රියාත්මක කිරීමට හැකි වී නැහැ.

# නවුෆර් මවුලවි හිටිහැටියේ පාස්කු දින ප්‍රහාරයේ මහමොළකරු වුණේ කොහොමදැයි ප්‍රශ්නයක්

## එජාප සභාපති වජිර අබේවර්ධන

**ශිරෝමි අබයසිංහ**



පාස්කුදා ප්‍රහාරය ගැන සොයා බැලීමට පත් කළ ජනාධිපති පරීක්ෂණ කොමිසම හමුවටවත් නොකැඳවූ නවුෆර් මවුලවි හිටි හැටියේම පාස්කු දින ප්‍රහාරයේ මහමොළකරු වූවේ කෙසේදැයි එක්සත් ජාතික පක්ෂ සභාපති වජිර අබේවර්ධන මහතා ඊයේ (08) සඳහන් කළේය.

නවුෆර් මවුලවි ප්‍රහාරයේ මහමොළකරු බවට රජයේ පාර්ශ්වයෙන් කළ ප්‍රකාශය සම්බන්ධයෙන් කරුණු දක්වමින් වජිර අබේවර්ධන මහතා මේ බව සඳහන් කළේය

නවුෆර් මවුලවි අත්අඩංගුවට ගත්තේ පාස්කු දින ප්‍රහාරය වූ දින රාත්‍රියේම යහපාලන ආණ්ඩුව යටතේ බව පැවසූ වජිර අබේවර්ධන මහතා මේ සැකකරු පාස්කු දින ප්‍රහාරයට දින කීපයකට පෙර සහරාන් සමඟ ඇතිකර ගත් ගැටුමක් හේතුවෙන් ඔවුන්ගෙන් ඉවත් වූ බවට පරීක්ෂණවලදී හෙළිව ඇතැයිද කීය.

පාස්කු දින ප්‍රහාරයට අකමැත්ත පළකරමින් ඉවත් වූ පුද්ගලයා ප්‍රහාරයේ මහමොළකරු නම් ඔහු අනිවාර්යයෙන්ම පාස්කු කොමිසමට කැඳවා ප්‍රශ්න කළ යුතුව තිබූ නමුත් එලෙස කටයුතු නොකළේ කාගේ බලපෑමෙන්දැයි රජය වහාම ප්‍රකාශයක් කළ යුතුයැයි එජාප සභාපතිවරයා කියා සිටියේය.

විදෙස් ගත පුද්ගලයන් හා විදෙස්ගත බුද්ධි අංශ ගැන විමසා බලන ලෙස පාස්කු වාර්තාවේ සඳහන් වෙද්දි නවුෆර් මවුලවි මහමොළකරු ලෙස හැඳින්වීමට හේතු සාධක මොනවාදැයි රජය ජනතාවට කරුණු ඉදිරිපත් කළ යුතුව ඇතැයි ද සභාපතිවරයා කීය.

# මේ ආණ්ඩුව ජනතාව මරන්න හදන්නේ විස ආහාර කවලා



## හිටපු හිටපු පා.ම. හිරුණිකා

**පහන් විජේසේකර**

එදා එල්ටීටීඊය මිනිසුන් මරා දැම්මා. පාස්කුදා ප්‍රහාරයේදී කතෝලික ජනතාව 300කට ආසන්න පිරිසක් මියගියා . දැන් මේ ආණ්ඩුව විස ආහාර කවා ජනතාව මරන්න හදන බව විපක්ෂ නායක කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදී සමගි වනිතා බලවේගයේ ජාතික සංවිධායක හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීනී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය පෙරේදා (08) පැවැසීය.

එහිදී ඇය මෙසේ ද කීවාය.

සිංහල හින්දු අලුත් අවුරුද්දට තව දින 5ක්වගේ කාලයක් තිබෙන්නේ. එහිදී විශාල වගකීමක් ගෘහනියන්ට තිබෙනවා. අද ඔවුන්ට ගැටලු රාශියකට මුහුණ දෙන්න සිදුවෙලා. එය භීතිකාවක් හා අභියෝගයක්. අවුරුද්දට අපි හැමෝම ආසයි රස කැවිලි කන්න.ගිය අවුරුද්ද රටේ ජනතාවට සමරන්න නොහැකි වුණා. ඒ කොරෝනා වයිරසය නිසා. මෙවරත් වර්තමාන ආණ්ඩුවේ මිනීමැරුම් ක්‍රියාකලාපය නිසා ගජමිතුරුන්ගේ මඩිය තද කරගන්න කරන උත්සාහයන් නිසා රටේ අහිංසක මිනිස්සු අවුරුදු කන්න බයවෙලා. මෙවර අවුරුද්දට කිරි ඉතිරුවත් අනුභව කරන වෙලාවට කන්න වෙන්නේ කිරිබත් විතරයි. කැවිලි හදන්න විදියක් නැහැ.රටට විස කාරක පොල්තෙල් ගෙන්වලා. එය 2020 දී තමයි ගෙන්වා තිබෙන්නේ.එය රටම පිළිගෙන ඉවරයි.

# පැලියගොඩ තොග මිල

**පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳපොළ දෛනික මසුන් මිල**

| | කිලෝ ග්‍රෑම් එකක මිල - රුපියල් |
|---|---|
| තෝරා බිලි | 1000 |
| පරව් ලොකු | 600 |
| පරව් මධ්‍යම | 700 |
| පරව් කුඩා | 650 |
| ඇටනගුල් පරව් | 650 |
| ඇන්ජිලා නයිලෝන් | 900 |
| බලයා ලොකු | 450-350 |
| බලයා | 450 |
| කෙලවල්ලා කුඩා | 700 |
| කොප්පරා | 900 |
| මෝරා ශුද්ධ | 700 |
| ඇටිස්සා ලොකු | 700 |
| හබරලි | 600 |
| පිලා මධ්‍යම | 700 |
| ඇටවල්ලා ලොකු | 480 |
| පියා මැස්සා | 280 |
| ගල් හුරුල්ලා | 500 |
| සාලයා මට්ට | 140-180 |
| හාල්මැස්සා | 250 |
| දැල්ලා පිලි | 800 |
| දැල්ලා කුඩා- | 700 |
| ඉස්සා ලොකු | 1100 |
| ඉස්සා මධ්‍යම - | 950 |
| මොරැල්ලා - | 400 |
| ලින්නා ලොකු- | 450-500 |
| ලින්නා කුඩා | 420 |
| සුද්දා | 600 |
| මුහුදු කකුළුවා ලොකු | 540 |
| ගීනටි පරව්- | 540 |
| කටුවල්ලා | 250 |
| අගයා | 450 |
| සූඩයා- | 100 |
| පොතුබරි- | 200 |
| මඩුවා | 280 |
| කුම්බලා | 550 |
| බෝල්ලා | 550 |
| සුරාපරව් | 400 |

**පැලියගොඩ එළවළු මිල**

| | (කිලෝවක තොග මිල) රුපියල් |
|---|---|
| ගෝවා | 70 |
| බෝංචි | 110 |
| තක්කාලි | 100 |
| ලීක්ස් | 60 |
| කැරට් | 120 |
| වම්බටු | 180 |
| පිපිඤ්ඤා | 20 |
| අමුමිරිස් | 180 |
| මාළුමිරිස් | 250 |
| බණ්ඩක්කා | 50 |
| තලනබටු | 60 |
| දෙහි | 60 |
| වට්ටක්කා | 50 |
| පතෝල | 80 |
| බීට් | 40 |
| දේශය අර්තාපල් | 180 |
| ලූනු | 55-70 |

**පැලියගොඩ පලතුරු මිල**

| | (කිලෝවක තොග මිල) රුපියල් |
|---|---|
| අඹ අල්පොන්සෝ | 380-400 |
| කෝලිකුට්ටු | 180-200 |
| ඇඹුල් කෙසෙල් | 70-80 |
| සීනි කෙසෙල් | 80-90 |
| දොඩං | 160-170 |
| කොමඩු | 50-60 |
| අන්නාසි | 110-120 |
| කිලෝපේර | 160-170 |
| ගස්ලබු | 110-120 |

බී. එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

# අම්මා හීනෙන් ඇවිත් කියූ වස්තුව ගන්න තාත්තයි පුතයි නිදන කාමරයේ කැණීම් කරලා

වසර කිහිපයකට ඉහතදී මියගිය මව විසින් නිවෙසේ කාමරය පිහිටි බිමේ වටිනා වස්තු සම්භාරයක් තිබෙනා බව හීනෙන් පැවසීම හේතුවෙන් එය සොයා කාමරය තුළ විශාල කැණීමක් සිදු කරමින් සිටි විශ්‍රාමික පොලිස් රියැදුරකු හා ඔහුගේ පුත්‍රයාට ඇප දීම තරයේ ප්‍රතික්ෂේප කරමින් ඔවුන්ව 20 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරනා ලෙස අනුරාධපුර ප්‍රධාන මහෙස්ත්‍රාත් අතිරේක දිසාවිනිසුරු නාලක ජයසූරිය මහතා නියෝග කළේය. මෙලෙස බන්ධනාගාරගත කරන ලද්දේ අනුරාධපුර කලත්තෑව මිහිඳු මාවත ලිපිනයේ පදිංචි 65 හැවිරිදි පියකු සහ 35 හැවිරිදි පුතෙකි.

නිවෙසේ කාමරක් තුළ විශාල කැණීමක් සිදු කෙරෙමින් පවතිනා බවට පොලිස් හදිසි ඇමතුම් අංශයට ලැබුණු තොරතුරකට අනුව පොලිසිය වැටලීම සිදු කර තිබූ අතර ස්ථානය වටලනා විට විශ්‍රාමික පොලිස් රියැදුරාගේ පුත්‍රයා අට්ටාලයක් සකසාගෙන පොළොව කණිමින් සිටි බව පොලිසිය අධිකරණයට දන්වා සිටියේය.

කාමරයේ අඩි හතරහමාරක් පළල අඩි හතරක් දිග සහ අඩි පහළොවක් ගැඹුර කැණීමක් සිදු කර තිබූ බවත් එම ස්ථානයේ අඩියක් පමණ ජලය රැඳී තිබූ බවත් පොලිසිය අධිකරණයට දැන්වුවේය. සැකකාර පියා සහ පුත්‍රයා සතියක පමණ කාලයක් හොර රහසේ කැණීම සිදු කර තිබෙනා බවත් ඔවුන් කැණීමෙන් ඉවත දමා තිබූ පස්වලින් කොටසක් නිවෙසේ තබාගෙන ඔවුන්ට අයත් පැළ තවානේ විකිණීම සඳහා පැකට් කර තබා ඇත.

වැටලීම කළ ස්ථානයේ තිබී උදලු, අලවංගු, ලණු, බාල්දි, ඉනිමගක්, වයර් හා බල්බ ඇතුළු නඩු භාණ්ඩ විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමට පොලිසියට හැකි වී තිබිණි. සිය මියගිය මව විසින් නිවෙසේ නිධානයක් ඇති බවට අවස්ථා කිහිපයකදීම හීනෙන් පැවසූ බවත් ඒ හේතුවෙන් තරියන්කුලමේ පිහිටි දේවාලයකට ගොස් සාත්තරක් බැලූ අවස්ථාවේ නිදන කාමරයේ කැණීම සිදු කරනා ලෙස උපදෙස් දුන් බවත් විශ්‍රාමික පොලිස් රියැදුරා පොලිස් අත්අඩංගුවට පත් වූ අවස්ථාවේ පවසා තිබේ.අනුරාධපුර කොට්ඨාස පුරාවිද්‍යා ආරක්ෂණ විශේෂ පොලිස් ඒකකයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්. එම්. ඩබ්. ඇල්ලේපොළ මහතාගේ උපදෙස් මත පොලිස් පරීක්ෂක කරුණාරත්න, පොලිස් සැරයන්වරුන් වන (31166) හරස්ගම, (36446) වීරකෝන්, පොලිස් කොස්තාපල් (28118) පෙරේරා යන නිලධාරීහු වැටලීමට එක් වූහ.

ඩබ්.ඒ. පියතිලක - මැදිරිගිරිය සමූහ

## අලියකු පහරදී පුද්ලයෙක් ජීවිතක්ෂයට



පොළොන්නරුව දිඹුලාගල සිරිපුර ප්‍රදේශයේ පෙරේදා (08) අවමංගල්‍ය උත්සවයකට ගොස් නිවෙසට පැමිණිමෙන් සිටියදී වන අලියකු පහරදීමෙන් පුද්ලයෙකු මියගොස් ඇති බව සිරිපුර පොලීසිය පවසයි.

වන අලියා පහර දීමෙන් මියගොස් ඇත්තේ අංක 163, රත්මල්කන්ඩිය, සිරිපුර ලිපිනයේ පදිංචි එම්.කේ. ප්‍රේමරත්න (52) අයෙකි.

සිරිපුර පොලීසිය කළ විමර්ශනයකට අනුව මෙම පුද්ගලයා සිය මිතුරෙකුගේ අවමංගල්‍ය උත්සවයක් සඳහා සහභාගි වී අලුයම නිවෙසට පැමිණෙමින් සිටියදී මෙසේ අලි පහරදීමට ලක්ව ඇති බව පොලීසිය සඳහන් කර සිටී.

පොලොන්නරුව කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඔෂාන් හේවාවිතාරණ මහතාගේ උපදේස් පරිදි සිරිපුර පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ඇතුළු පොලිස් නිලධාරීන් පිරිසක් වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

ධර්මදාස සිරිවර්ධන - ගාල්ල දිස්ත්‍රික් සංචාරක

## අහුංගල්ලේ මහජන ආරක්ෂක කමිටු පිහිටුවයි





අම්බලන්ගොඩ කලාපයේ මහජන ආරක්ෂක කමිටු පිහිටු වීම පසුගියදා (08) බලපිටිය නිල්මිණි හෝටල් සංකීර්ණයේදී ඇල්පිටිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වයි. එම්. ලීලවංශ හා අහුංගල්ල ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්. ටී. ජයසේකර යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. මෙහිදී නීතිය හා සාමය ආරක්ෂා කිරීම පිළිබඳ විශේෂ දේශනය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ලීලවංශ මහතා විසින් සිදු කරන ලදි. දිස්ත්‍රික් ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරිනී එස්. ඒ. ඩී. එන්. මනෝරි, ප්‍රජා පොලිස් අංශයේ ස්ථානාධිපති එච්. සුමනසිරි, උප පොලිස් පරීක්ෂක ඒ. ආර්. සුදුසිංහ යන මහත්වරුන් ඇතුළු පොලිස් නිලධාරීන්, කමිටු සභාපතිවරුන්, ලේකම්වරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

ගයාන් සංජය සහ ජී. එස්. තැලිගම - කිරිඳිවැල සමූහ

## දවල්ට පොල් කඩන දෙමස්සිනෝ රෑට ගෙවල් බිඳලා

කලක සිට කිරිඳිවැල ප්‍රදේශය ඇතුළු අවට ගම් කිහිපයක නිවෙස් බිඳ භාණ්ඩ සොරකම් කළ පුද්ගලයන් දෙදෙනකු පසුගියදා (06) අත්අඩංගුවට ගැනීමට කිරිඳිවැල පොලිසියේ නිලධාරීන් සමත් වී තිබේ. කිරිඳිවැල පොලිසියේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. නිරංජන් මිලාන් ද සිල්වා මහතාට ලැබුණු තොරතුරකට අනුව සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇත.

මෙලෙස නිවෙස් කොල්ලකෑම සිදු කළ සැකකරුවන් දෙදෙනා දෙමස්සිනන් වන අතර ඔවුන් එම ප්‍රදේශයේ 'මනියා' සහ 'කිංකිණි' යන අන්වර්ථ නම්වලින් පෙනී සිටිනා බවට පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී ඇත. මොවුන් දෙදෙනා මාහල්ඔළුව ප්‍රදේශයේ පදිංචිකරුවන්ය. සැකකරුවන්ට විරුද්ධව බල අපරාධ තුනකට සහ නිවාස බිඳීම් 06කට චෝදනා ගොනු කර ඇති අතර මොවුන් විසින් සිදු කරනා ලද තවත් කොල්ලකෑම් පිළිබඳ විමර්ශන කිරිඳිවැල පොලිසිය මඟින් සිදු කරමින් පවතී. දහවල් කාලයේ පොල් කඩනා මුවාවෙන් ගොස් මිනිසුන් නැති නිවෙස් පිළිබඳ තොරතුරු සොයා ඇති සැකකරුවන් රාත්‍රී කාලයේදී සූක්ෂම ව නිවාස කොල්ලකා ඇත.

සැකකරුවන් විසින් කොල්ලකන ලද රුපියල් ලක්ෂ 20ක පමණ රත්තරන් බඩු මට්ටක්කුලිය, මෝදර ප්‍රදේශයේ මත්කුඩු ජාවාරම්කරුවන්ට දී මත්කුඩු ගෙන ඇති බවට පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ. මොවුන් අත්අඩංගුවට පත් වන අවස්ථාවේදී 'මනියා' නමැත්තා ළඟ මත්කුඩු ග්‍රෑම් 2යි මිලිග්‍රෑම් 800ක් තිබී ඇති අතර 'කිංකිණි' නමැත්තා ළඟ ගල්කටස් වර්ගයේ පිස්තෝලයක් තිබී අත්අඩංගුවට ගෙන තිබේ. මේ කොල්ලකෑම්වලට සම්බන්ධ තවත් සැකකරුවන් කිහිපදෙනකු කිරිඳිවැල පොලිසිය මඟින් හඳුනාගෙන ඇති අතර ඔවුන් මේ වන විට ප්‍රදේශයෙන් පලා ගොස් තිබේ. පලා ගිය සැකකරුවන් සොයා කිරිඳවැල පොලිසිය මඟින් විමර්ශන ආරම්භ කර ඇත.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ උපදෙස් මත බස්නාහිර උතුර දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති දමයන්ත විජය ශ්‍රී, ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඉන්දික ද සිල්වා, සහකාර පොලිස් අධිකාරි චින්තක පීරිස් යන මහත්වරුන්ගේ මෙහෙවීමෙන් කිරිඳිවැල පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නිරංජන් මිලාන් ද සිල්වා, අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක දේශාන්ත පෙරේරා, දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක පරාක්‍රම, පො.සැ. වරුන් වන (55562) වසන්ත නවරත්න, (31028) රත්නායක, පො.කො. (83397) ගයාන් යන නිලධාරීහු වැටලීමට එක් වූහ.

එස්.ජී. විජේරත්න - කටුගස්තොට සමූහ

## කඳුරට ගුවන් විදුලියේ වෛද්‍ය සායනය අද

කඳුරට ගුවන් විදුලියේ මෙහෙයවීම මත සිදු කරනු ලබන වෛද්‍ය සායනය අක්ෂි සායනය සහ ලේ හා පටක දන්දීමේ කඳවුර අද (10) පෙරවරු 09 සිට පස්වරු 04 දක්වා ගුවන්විදුලි සංස්ථා පරිශ්‍රයේදී පැවැත්වේ.

මෙම වැඩසටහන සංවිධානය කරනු ලබන්නේ මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 98 ආදි ශිෂ්‍ය කණ්ඩායම් එකමුතුව විසිනි.

කේ. විජේසිරි නිශ්ශංක - කරල්ලියද්ද සමූහ

## රන්ටැඹේ අභයභූමියේ අලි පැටියකුගේ මළ සිරුරක්

වික්ටෝරියා රන්දෙණිගල රන්ටැඹේ අභයභූමියේ සිටි වයස අවුරුදු දෙකක් වයසැති වන අලියකු රන්දෙණිගල දේවාලය අසලදී පසුගියදා (04) ජීවිතක්ෂයට පත්ව සිටියදී සොයාගෙන තිබේ. වයස අවුරුදු දෙකක් වයසැති අඩි හතරක් පමණ අසැති මේ වන අලි පැටියා කුමන ආකාරයෙන් ජීවිතක්ෂයට පත් වූයේදැයි සැක සහිත බවත් මේ මිය ගිය වන අලියාගේ සිරුරේ කොටස් කොළඹ වනජීවී කාර්යාලයට යවා ඇති බවත් වනජීවී කාර්යාලය ප්‍රකාශ කළේය. වන අලි පැටියාගේ සිරුර පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය හසලක දාගැවිල්ල වනජීවී නිලධාරීන් හා වෛද්‍ය නිලධාරීන් විසින් පසුගියදා සිදු කෙරිණි.

මහානාම විතානගේ - මල්වාන සමූහ හා
සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ සමූහ

## ඔලුව තාප්පයේ වැදී දරුවෙක් මරුමුවට

මල්වානේ යබරලුව ප්‍රදේශයේ නිවෙසක ළමයන් දෙදෙනකු සෙල්ලම් කරමින් සිටියේදී කුකුළෙකුට බියෙන් දිව ගිය ළමයකු තාප්පයක වැදී හිසට හානි සිදු වීමෙන් මරුමුවට පත් වී තිබේ.

මොහු බියගම රජයේ රෝහලට ඇතුළත් කිරීමෙන් පසුව මිය ගොස් තිබිණි.

පෙරේදා (08) පෙරවරුවේ සිදු වූ මේ සිද්ධියෙන් මිය ගියේ. මල්වානේ යබරලුව ප්‍රදේශයේ පදිංචිව සිටි බියගම මධ්‍ය මහා විදුහලේ (09) වන වසර පන්තියේ අධ්‍යාපනය ලැබූ එච්.පී.එන්. චින්තක දිසානායක නමැති දාහතර හැවිරිදි පාසල් සිසුවෙකි. මේ පිළිබඳව මරණ පරීක්ෂණය බියගම හදිසි මරණ පරීක්ෂක වෛද්‍ය හර්ෂජිත් ගුණසේකර මහතා විසින් පවත්වා මළ සිරුර පී.සී.ආර්. පරීක්ෂණයට යොමු කොට පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වන ලෙසට පොලීසියට නියෝග කරන ලදී. මේ අනුව පශ්චාත් මරණ පරීක්ෂණය ඊයේ (09) රාගම මහා රෝහලේදී පැවැත් විණි.

බියගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඒ.ජේ.එම්.ආර්. සමරසිංහ මහතාගේ උපදෙස් අනුව සැරයන් සමන්ත මහතා (43916) මේ සිද්ධිය පිළිබඳව පරීක්ෂණ පවත්වයි.

රාගම සමූහ

## රාගම වෛද්‍ය පීඨයට වසර 30යි



රාගම වෛද්‍ය පීඨය ආරම්භ කර වසර තිහක් සපිරීම නිමිත්තෙන් ලෝක සෞඛ්‍ය දිනයට සමගාමීව පසුගියදා (05) රාගම වෛද්‍ය පීඨ භූමියේදී 'සැමට සමාන සෞඛ්‍ය සේවාවක්' යන තේමාව යටතේ සැමරුම් උත්සවයක් පැවැත්වූ අතර මේ තිස්වන වසර සැමරුම වෙනුවෙන් වෛද්‍ය පීඨයේ හරිත කමිටුව විසින් ශ්‍රී ලංකාවට ආවේණික වූ ශාක වර්ග තිහකින් පැළ හැටක්ද පලතුරු පැළ හැටක්ද වෛද්‍ය පීඨ භූමියේදී රෝපණය කරන ලදි.

වර්ෂ 1991 සිසුන් 120 දෙනෙකුගෙන් ආරම්භ කර ඇති කැලණිය විශ්වවිද්‍යාලයේ රාගම වෛද්‍ය පීඨයේ මේ වන විට සිසුන් 1000කට අධික පිරිසක් අධ්‍යයන කටයුතුවල නිරතව සිටිනා අතර පුරා වසර තිහක කාලයක් තුළදී වෛද්‍යවරුන් දහස් ගණනක් මේ වෛද්‍ය පීඨයෙන් මාතෘ භූමියට මෙන්ම සමස්ත ලෝකයට ද දායාද කර ඇත. වර්ෂ 1991 සිට මේ දක්වා පීඨාධිපතිවරුන් හයදෙනකුගේ පාලනය යටතේ පැවති වෛද්‍ය පීඨයේ වත්මන් පීඨාධිපතිනිය ලෙස මහාචාර්ය ජානකී හේවාවිසෙන්ති මහත්මිය සේවයේ නිරතව සිටී.

අක්කර තිස්පහකින් සමන්විත වූ ඉතා මනරම් සුන්දර භූමියක පිහිටා ඇති රාගම වෛද්‍ය පීඨය මේ වන විට අංගසම්පූර්ණ වෛද්‍ය පීඨයක් බවට පත් වී ඇති අතර එහි ගෞරවය මෙතෙක් පීඨාධිපති ධුරය හෙබවූ පීඨාධිපතිවරුන් සැමටත් නන් අයුරින් උපකාර කළ සැමටත් හිමිවනා බව කැලණි විශ්වවිද්‍යාලයේ උපකුලපති රාගම වෛද්‍ය පීඨයේ හිටපු පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා මහත්මිය තිස්වන සංවත්සර සැමරුම් උත්සවය අමතමින් පැවසීය.

ලංකාවේ ප්‍රථම හරිත විශ්වවිද්‍යාලය වන කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත රාගම වෛද්‍ය පීඨයේ හරිත කමිටුව විසින් නිර්මාණය කළ වෙබ් අඩවිය නිල වශයෙන් ආරම්භ කිරීම එදින විශේෂ ආරාධිත අමුත්තා ලෙස එක්වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත ඔලීවියා නීවේරාස් මැතිනිය සහ කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිනී මහාචාර්ය නිලන්ති ද සිල්වා මැතිනියගේ සුරතින් සිදු කරන ලදි.

ඒ.ටී.එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

## බැක්බේ මුහුදේ තහනම් කරමල් දැල් යොදා මාළු බාලා

ත්‍රිකුණාමලය පිටත වරායේ බිලිපිති පන්නය සඳහා අති විශේෂ ගැසට් නිවේදනයකින් වෙන්කර ඇති "බැක්බේ' මුහුදු තීරයේ කරමල් දැල් යොදා මසුන් ඇල්ලූ ධීවර කාර්මිකයන් හතර දෙනෙකු යාත්‍රා දෙකක්, කරමල් දැල් දෙකක් සමඟ ඇල්ලූ මසුන් තොගයක් අත්අඩංගුවට ගත් නාවික හමුදාව පෙරේදා (08) රාත්‍රී වැඩිදුර පරීක්ෂණ සඳහා ත්‍රිකුණාලය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට භාරදෙනු ලැබීය.

අත්අඩංගුවට ගත් සැකකරුවන් සාම්බල්තිව්, සල්ලිය ප්‍රදේශයේ පදිංචිකරුවෝ වන අතර ඔවුන් එම ප්‍රදේශයේ සිට පිටත එන්ජින් සවිකරන බෝට්ටුවලින් පැමිණ බැක්බේ මුහුදු තීරයට ඇතුළු වී මෙලෙස මසුන් මරා ඇතැයි ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව කියයි.

ධීවර හා ජලජසම්පත් දෙපාර්තමේන්තුවේ ත්‍රිකුණාමල සහකාර අධ්‍යක්ෂ අනිල් සේනාරත්න මහතාගේ උපදෙස් මත ධීවර නිලධාරි ඉෂාර ටී. කංකානම්ගේ මහතා සැකකරුවන් සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ මෙහෙය විය. අත්අඩංගුවට ගත් මසුන් කිලෝග්‍රෑම් 155 හා සැකකරුවන් ත්‍රිකුණාමල මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.1996 අංක 2 දරණ ධීවර හා ජලජ සම්පත් පනත යටතේ සැකකරුවන්ට එරෙහිව චෝදනා ගොනු කිරීමට නියමිතය.





නියෝජ්‍ය පොලිස්පතිවරයාට මංගල කෘතිය පිළිගන්වමින්

දිනූෂි මනතුංග

## 'අපරාධ විමර්ශනයෙහි ඵලදායිතාවයට බලපානු ලබන විද්‍යාත්මක ක්‍රමවේද' දොරට වඩී

'අපරාධ විමර්ශනයෙහි ඵලදායිතාවයට බලපානු ලබන විද්‍යාත්මක ක්‍රමවේද' නමැති ග්‍රන්ථය දොරට වැඩීම පසුගියදා (27) මහනුවර මූලස්ථාන පොලිස් පරිශ්‍රයේ ශ්‍රවණාගාරයේදී උත්කර්ශවත් අයුරින් පැවැත්විණි. මේ ග්‍රන්තය රචනා කරන ලද්දේ තෙල්දෙණිය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජගත් සේරම් මහතා විසිනි. වසර 4ක පර්යේෂණයන්හි ප්‍රතිඵලයක් ලෙසින් රචිත මේ ග්‍රන්ථය මෑත කාලයේ ලියන ලද අපරාධ පිළිබඳ විශිෂ්ට කෘතියකි.

මේ කෘතිය නීතිය හදාරණ සිසු සිසුවියන්ට, නීතිඥවරුන්ට මෙන්ම වැඩිදුර අධ්‍යාපනය හදාරන්නන් හට උපදේශන ග්‍රන්ථයකි. මෙමඟින් ශ්‍රී ලංකාවේ අපරාධ විමර්ශන විද්‍යාත්මක ක්‍රම භාවිත කරන්නේ කෙසේද, සැකකරුවන් වරදකරුවන් වීමේ ප්‍රතිශතය පිළිබඳ පුළුල් විග්‍රහයක් කොට තිබේ.

මේ අවස්ථාවට නියෝජ්‍ය පොලිස්පති චන්දන අලහකෝන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය වසන්ත අතුකෝරළ, මහනුවර දිස්ත්‍රික් ලේකම් චන්දන තෙන්නකෝන් යන මහත්වරුන් ඇතුළු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පර්යේෂණ අංශයේ නිලධාරීන්, පොලිස් ස්ථානාධිපතිවරුන්, ප්‍රදේශයේ ගරුතර සංඝරත්නය ඇතුළු සම්භාවනීය අමුත්තන් පිරිසක් සහභාගී වී සිටියහ.



ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා විසින් දිස්ත්‍රික් ලේකම්වරයා හට කෘතිය පිළිගන්වමින්

දිනමිණ The Dinamina

# ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

**මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/21/2018/පිටු/සැ**

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත් / පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2021.04.09 වෙනි දින සිට 2021.04.23 වෙනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2021.04.30 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර | ඉඩම්වල විස්තර | ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. කොට්ඨාසයේ 220 වෙළුමේ 148 පත්‍රිරුව | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පිකරින්ග්ස් පාර, කඩවත්තුල හි පිහිටි ලොට් 04 හා වරිපනම් අංක 34 නැමැති ඉඩමට මායිම්,<br>**උතුරට** : පිකරින්ග්ස් පාර සහ ඇන්ඩෘ ප්‍රනාන්දුට අයිති දේපළ<br>**නැගෙනහිරට** : මාර්ගය<br>**දකුණට** : සී. ඩේවිඩ් සහ අතිත් අයට අයිති ඉඩම<br>**බස්නාහිරට** : ඇන්ඩෘ ප්‍රනාන්දුට අයිති දේපළ සහ ජෝන් අස්සෙරප්පාට අයිති යාය.<br>**බිම් ප්‍රමාණය** : අ. 00 රූ. 02 ප. 12.83 | 01. ටී.ඒ.ඩී. පීරිස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1933.10.12 දින අංක 20 දරන උගස් ඔප්පුව.<br>02. ටී.ඒ.ඩී. පීරිස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1934.02.13 දින අංක 27 දරන ප්‍රකාශන ඔප්පුව. |

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,**
**නො. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**බත්තරමුල්ල.**

**ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර**
**රෙජිස්ට්‍රාර් ජනරාල්.**

---

**මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/45/2018/පිටු/සැ**

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත් / පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2021.04.09 වෙනි දින සිට 2021.04.23** වෙනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල **පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා** ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2021.04.30 දිනට** පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර | ඉඩම්වල විස්තර | ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. කොට්ඨාසයේ 949 වෙළුමේ 77 පත්‍රිරුව | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තුවේ සල්පිටි කෝරළයේ උඩහමුල්ල ග්‍රාමයේ 'කැටකැලගහවත්ත නොහොත් හැඩවකගහලන්ද' නැමැති ඉඩමේ කැබලි අංක 'A' සඳහා මායිම්,<br>**උතුරු නැගෙනහිරට** : ඒ.ජී. පෙරේරාට හිමි ඉඩම<br>**දකුණු නැගෙනහිරට** : ලොට් බී කොටස<br>**දකුණු බස්නාහිරට** : පාර<br>**උතුරු බස්නාහිරට** : ඒ.ජේ. ද ක්‍රොස්ගේ දේපළ<br>**බිම් ප්‍රමාණය** : අ. 00 රූ. 02 ප. 34 | 01. ඒ. ගුණරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1970.03.14 දින අංක 2153 දරන තෑගි ඔප්පුවයි.<br>02. ඒ. ගුණරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1989.04.11 දින අංක 3698 දරන වරද නිවැරදි කිරීමේ ඔප්පුවයි. |

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,**
**නො. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**බත්තරමුල්ල.**

**ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර**
**රෙජිස්ට්‍රාර් ජනරාල්.**

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/27/2018/පිටු/සැ

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත් / පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2021-04-09 වෙනි දින සිට 2021-04-23 වෙනි දින දක්වා** සතියේ වැඩකරන දිනවල **පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා** ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2021-04-30 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර | ඉඩම්වල විස්තර | ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 355/1283/97 දරන පත්‍රිරුව. | කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ආදයම් නිලධාරී කොට්ඨාසයේ 348- කිරිබමුනේගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කිරිබමුනේගම පිහිටි රජයේ ඉඩම නැමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද පිඹුරු අංක 3027 කුරු/ප්‍ර 94519 දීමනා පත්‍රයේ 1996-08-20 දිනැති ඉඩමට මායිම්,<br>**උතුරට** : පාර රක්ෂිතය<br>**නැගෙනහිරට** : ඊ.එම්. තිලකරත්නගේ ඉඩම<br>**දකුණට** : ජේ.එම්. රංහාමිගේ ඉඩම<br>**බස්නාහිරට** : උබයවර්ධනගේ ඉඩම<br>**බිම් ප්‍රමාණය** : අක්. 02 රූ. 00 ප.00 | 01. ජනාධිපති ලේකම් විසින් 1996-08-20 දින ප්‍රදානය කරන ලද අංක කුරු/ප්‍ර 94519 දරන දීමනා පත්‍රයයි. |

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,**
**නො. 234/ඒ3,**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර,**
**රෙජිස්ට්‍රාර් ජනරාල්.**

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/42/2018/පිටු/සැ

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත් / පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කළ ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2021-04-09 වෙනි දින සිට 2021-04-23 වෙනි දින දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2021-04-30 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර | ඉඩම්වල විස්තර | ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 1354 වෙළුමේ 298 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තුවේ සල්පිටි කෝරළයේ ගොඩිගමුව - නිලම්මහර ග්‍රාමයේ 'අළුබෝගහවත්ත' නැමැති ඉඩමේ 1990-09-24 සිතියම් දිනැති කැබලි අංක '2ඒ/01' සඳහා මායිම්,<br>උතුරු නැගෙනහිරට : මීගහවත්ත පටුමග,<br>දකුණු නැගෙනහිරට : 3748 පිඹුරේ සඳහන් අංක 02ඒ/04 දරන කොටස හා ඒ2ඒ/03 දරන කොටස<br>දකුණු බස්නාහිරට : 3748 පිඹුරේ 2ඒ2 දරන කොටස<br>උතුරු බස්නාහිරට : නිලම්මහර පාර,<br>බිම් ප්‍රමාණය : අ:00 රූ: 00 ප: 28 70/100 | 01. එච්.ඩබ්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1991-06-26 දින අංක 36688 දරන තෑගි ඔප්පුවයි.<br>02. පී.පල්ලෙවෙල ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2002-07-01 දින අංක 240 දරන බදු ඔප්පුව. |

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,**
**නො. 234/ඒ3,**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර,**
**රෙජිස්ට්‍රාර් ජනරාල්.**

---

## ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කර්යාලය - කළුතර

# ලංසු සඳහා ආරාධනයයි

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා පහත වර්ගීකරණය යටතේ වෙන් වෙන්ව සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| ලංසු යොමු අංකය | ලංසු නාමය | ප්‍රමාණය | ආපසු ගෙවනු නොලබන ලංසු ගාස්තුව (රු.ශ) | ලංසු සුරක්ෂණයේ වටිනාකම (රු.ශ) |
|---|---|---|---|---|
| Purchasing Of ETU & HLC Equipment | | | | |
| BME/MEQ/PSSP/ETU& HLC/2021 | Multipara Monitor | 06 | | |
| | Defibrillator | 04 | | |
| | Spinal Board | 12 | | |
| | Tuning Fork | 15 | | |
| | BP Apparatus | 06 | | |
| | ENT Set | 06 | 2,500.00 | 70,000.00 |
| | Stethoscope | 06 | | |
| | Height Measuring Rod | 06 | | |
| | Weighing Scales For Infant | 06 | | |
| | Length Board For Infant | 06 | | |
| | Examination Bed | 06 | | |
| Purchasing Of MOH Office Equipment | | | | |
| BME/MEQ/PSSP/MOH/2021 | Mini Auto Clave | 13 | | |
| | Examination Bed | 15 | | |
| | Large Sterilizer | 15 | | |
| | Speculum M-160, L-30, S-16 | - | | |
| | Sport Lamp | 15 | | |
| | Dressing Trolley | 02 | | |
| | Scissors | 47 | 1,500.00 | 20,000.00 |
| | Vumselum Forceps | 31 | | |
| | Uterine Sound | 33 | | |
| | Mosquito Artery | 10 | | |
| | Kidney Tray | 20 | | |
| | Sponge Holder | 20 | | |
| | Covering Screen | 05 | | |

1. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය යටතේ පවත්වනු ලැබේ.
2. ලංසු ලිපි ලේඛන ලබා ගැනීම සඳහා අභිලාෂී ලංසුකරුවන් පහත ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.
   - I. ඉහත සඳහන් උපකරණ විකිණීම සඳහා වන වලංගු ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය.
   - II. නිෂ්පාදකයා නොවන්නේ නම් ලංසුකරුවන්ට එම අයිතම විකිණීම සඳහා නිෂ්පාදකයින් වෙතින් ලිඛිත අවසරයක් තිබිය යුතුය.
   - III. අවම වශයෙන් වසර දෙකක් සඳහා අදාළ ව්‍යාපාරවල යෙදී සිටීමේ පලපුරුද්ද.
   - IV. උපකරණ විකිණීම සඳහා NMRA සහතිකය.
3. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු තැ.පෙ.29, කච්චේරි සංකීර්ණය, 04 වන මහල, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ පරිපාලන නිලධාරී වෙතින් ලබා ගත හැකි අතර, ඉහත සඳහන් ආපසු නොගෙවන ලංසු ලියවිලි ගාස්තු කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට ගෙවීමෙන් පසුව ලංසු ලිපිලේඛන 2021.04.16 වෙනි දින සිට 2021.05.07 වන දින දක්වා රාජකාරි දිනවලදී පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා අතරතුර මිලදි ගත හැක.
4. ලංසු සුරක්ෂණය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, කළුතර නමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වානිජ බැංකුවකින් ඉහත වගුවේ සඳහන් පරිදි ලබාගත් ලංසු සුරක්ෂණයක් සම්පූර්ණ කරන ලද ලංසු ලිපි ලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.
5. නිසි පරිදි සම්පූර්ණ කරණ ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව, මුල් පිටපත හා අනුපිටපත ලෙස සලකුණුකර, වෙන් වෙන්ව කවර දෙකක බහා මුද්‍රා තබා එම කවර දෙකම නැවත මුද්‍රා තබන ලද කවරයක බහා වම්පස ඉහළ කෙළවරේ Purchasing Of ETU & HLC Equipment සඳහා BME/MEQ/PSSP/ETU & HLC/2021,Purchasing Of MOH Office Equipment සඳහා BME/MEQ/PSSP/MOH/2021 යනුවෙන් සඳහන් කර 2021.05.10 දින පෙ.ව,10.30ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියා පදිංචි තැපැල මගින් හෝ ඉහත ලිපිනයේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීම කළ හැකිය.
6. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසුපත් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරිපිට විවෘත කරනු ලැබේ.
7. වැඩිදුර විස්තර සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 034-2222610, 034-2222367,038-2294700 අමතන්න.

**සභාපති,ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය ,**
**කළුතර.**

**පොල් මිල**
**පොල් සංවර්ධන අධිකාරිය**
**ප්‍රකාශිත දිනය 2021/04/09**

1. පොල් මිල
(අ) වෙළෙඳ පොළ මිල ගණන් 2021.03.19-2021.03.25 (මූලාශ්‍රය - HARTI)

| | තොග මිල | සිල්ලර මිල |
|---|---|---|
| ලොකු ප්‍රමාණය ගෙඩියක මිල රු. | 70.00 - 75.00 | 80.00 - 90.00 |
| කුඩා ප්‍රමාණය ගෙඩියක මිල රු. | 65.00 - 68.00 | 65.00 - 75.00 |

(ඈ) දේශීය ගොවිපල මිල රු/ගෙඩි 1000ක්
(ලෙලි නොගසන) රු/මෙ.ටො.1ක මිල (ලෙලි ගසන ලද)

| | | |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 60,000 - 65,000 | 110,000 -115,000 |
| පුත්තලම් දිස්ත්‍රික්කය | 58,000 - 65,000 | 108,000 -110,000 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 58,000 - 60,000 | 105,000 -112,000 |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | 60,000 - 70,000 | 110,000 - 115,000 |

2.දිසිදි පොල්
සියුම් මධ්‍යම ශ්‍රී ලංකා (දේශිය)(රු./කි.ග්‍රෑ.1 ක්) 520 - 525 සා
(රු./කි.ග්‍රෑ.1 ක්) 525 - 530 සා
ශ්‍රී ලංකා - නැව තෙක් මිල (රු./කි.ග්‍රෑ.1 ක්)
4.පොල් තෙල් (තොග මිල)
දේශිය මිල (රු./මෙ.ටො.1ක්) 650,000 - 700,000 සා
පිලිපීන් (මි.ර.ගැ/රොටඩෑම්) ඔයිල් වල්ඩ් (2021.03.31) (රු./මෙ.ටො.1ක්) 290,938
5. පුන්නක්කු (රු./මෙ.ටො.1ක්) 65,000 - 75,000 වි
6. ගුදිරි කොහු (රු./කි.ග්‍රෑ.50 ක්) 950 - 1,400 වි
7. ඕමැට් කොහු (රු./කි.ග්‍රෑ.50 ක්) 3,750 - 5,000 වි
8. මිශ්‍ර කොහු (රු./කි.ග්‍රෑ.50 ක්) 1,500 - 1,750 වි
9. බ්‍රිස්ටල් කොහු බැමි 1 (රු./කි.ග්‍රෑ.50 ක්) 5,000 - 7,000 වි
10. බ්‍රිස්ටල් කොහු බැමි 2 (රු/කි.ග්‍රෑ. 50ක්) 7,500 - 8,500 වි
11. පොල් ලෙලි මිල (16-03-2021)

| දිස්ත්‍රික්කය | පොල් ලෙලි 1000ක මිල (රුපියල්) |
|---|---|
| පුත්තලම | 4,500 - 5,000 |
| ගම්පහ | 4,500 - 5,000 |
| මාතර | 4,500 - 5,000 |
| කුරුණෑගල | 4,500 - 5,500 |

තෙතමනය 50% වැඩි පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 7.00
තෙතමනය 40% - 50% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 7.50
තෙතමනය 30% - 40% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 8.50
තෙතමනය 20% - 30% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 9.50
තෙතමනය 10% - 20% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 10.50
තෙතමනය 10% අඩු පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 13.00
12. පොල් කටු (රු/මෙ. ටො. 1ක්) 29,500 - 30,500 වි
13. පොල් කටු අඟුරු (2021-03-19 - 2021-03-25) (රු/මෙ.ටො. 1ක්) 110,000.00 වි
(තෙතමනය - 12%, අඟුරු කුඩු - 3%)
14. පොල් ඉරටු (රු./මෙ.ටො. 1ක්) 43,000 - 46,000 වි

**වි - විකුණුම් මිල** **සා.- සාමාන්‍ය මිල**

## COYLE - සභාපති සාරංග ගුණවර්ධන



තරුණ ලාංකේය ව්‍යවසායකයන්ගේ වාණිජ සංගමයේ (COYLE) නව සභාපතිවරයා ලෙස TNG Packaging සහ TN Global සමාගම්වල කළමනාකාර අධ්‍යක්ෂ සාරංග ගුණවර්ධන මහතා පසුගියදා පත් කර ගැනිණි. පසුගියදා කොළඹ ෂැංග්‍රිලා හෝටලයේදී පැවති එම සංගමයේ 22 වැනි මහා සභා රැස්වීම අතරතුරදී මේ පත් කිරීම විය. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා වශයෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සහභාගි වූ අතර, රාජ්‍ය ඇමැතිවරුන්, අමාත්‍යාංශ ලේකම්වරු, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සහ COYLE සාමාජිකයන් ඇතුළු සම්භාවනීය පිරිසක්ද ඊට එක්ව සිටියහ. එහිදී සාම්ප්‍රදායික කිරිබත් කැපීමේ චාරිත්‍රය ඉටු කරන ලද්දේ එම සංගමයේ හිටපු සභාපතිවරුන් විසිනි.

COYLE සභාපතිත්වය ගුණවර්ධන මහතාට හිමිවූයේ චමත් කෝට්ටගේ මහතාගේ ධුර කාලයෙන් අනතුරුවය. නව සභාපතිවරයාගේ පත්වීමට සමගාමීව දිමුත් චන්කම සිල්වා මහතා ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයා ලෙසද රසිත් වික්‍රමසිංහ මහතා උප සභාපතිවරයා ලෙසද පත් කර ගැනුණි.

COYLE හි 22වැනි සභාපතිවරයා වන ගුණවර්ධන මහතා, ව්‍යාපාර ක්ෂේත්‍රයට පිවිසීමට පෙර සිවිල් ඉංජිනේරුවරයකු ලෙස ක්‍රියා කළේය. එහෙත් සැම විටම ගෝලීය ව්‍යාපාර කෙරෙහි මහත් උනන්දුවකින් කටයුතු කළ ඔහු තම ව්‍යාපාර පරිපාලනවේදය පිළිබඳ පශ්චාත් උපාධිය සඳහා අමෙරිකා එක්සත් ජනපදය බලා යන්නේද ව්‍යාපාර ක්ෂේත්‍රය පිළිබඳ හැදෑරීමට තිබූ දැඩි ආසාව නිසාවෙනි. පශ්චාත් උපාධිය ගැනීමෙන් අනතුරුව කලක් අමෙරිකානු සමාගමක සේවය කළ ගුණවර්ධන මහතා එම කාලය අතරතුර ඉ-වාණිජ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ද හැදෑරීමක් කළේය. අනතුරුව නැවතත් මව් රටට පැමිණි ඔහු ආරක්ෂිත ඇසුරුම්කරණ ක්ෂේත්‍රයේ ව්‍යාපාර කටයුතු ආරම්භ කළේය.

## කොමර්ෂල් ටෙක්නොලොජීස් ප්ලස් ජාතික ජයග්‍රහණයක් හිමි කර ගනී



ස්මාර්ට් මොබිලිටි ව්‍යාපාර (Smart Mobility Enterprise) විසඳුම් සපයන්නකු වශයෙන් SAAS Enterprise ව්‍යාපාර වේදිකා සංවර්ධනයේ පෙරමුණ ගත් සී/ස කොමර්ෂල් ටෙක්නොලොජීස් ප්ලස් සමාගම ඉදිරිපත් කළ බිල්ලා ක්ලවුඩ් විසඳුම ශ්‍රී ලංකා මෘදුකාංග සේවා සමාගම් සංගමය (SLASSCOM) සංවිධාන කළ'National Ingenuity Awards 2021' සම්මාන උලෙළේදී ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ කාණ්ඩයේ හොඳම නවතාවෙන් යුත් නිර්මාණය වෙනුවෙන් ජාතික ජයග්‍රහණය ලබා ගත්තේය. එම කාණ්ඩයේ බස්නාහිර පළාත් ජයග්‍රහණයත් ඔවුන් සතු වීම විශේෂත්වයකි. දීප ව්‍යාප්ත තරගාවලියක් ඔස්සේ මෘදුකාංග ක්ෂේත්‍රයේ නව නිර්මාණකරණයට උනන්දුව සපයන 'National Ingenuity Awards 2021' සම්මාන උලෙළ පසුගියදා කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේදී උත්කර්ෂවත් ලෙස පැවැත්විණි.

"නැගී එන සමාගමක් වශයෙන් මෙවැනි ජාතික ජයග්‍රහණක් ලැබීම විශාල සතුටක්. බාධක සහ අභියෝග රැසක් ජය ගනිමින් අපේ කණ්ඩායම කළ කැප වීම මීට බෙහෙවින් දායක වුණා. කණ්ඩායමේ සැම දෙනාටම මාගේ ප්‍රශංසාත්මක ස්තුතිය පුද කරනවා." සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි, නවෝත්පාදන ප්‍රධානි සුපුන් මයුෂාන් මහතා පැවසීය. සුපුන් මයුෂාන් මහතා 2016දී ඇරඹූ කොමර්ෂල් ටෙක්නොලොජීස් ප්ලස් තාක්ෂණික අංශයෙන්ඉදිරියට යමින්SAAS Platforms Development ඔස්සේ සිය කෙටි ඉතිහාසය තුළ ශීඝ්‍ර වර්ධනයක් පෙන්වීය. සමාගමේ ප්‍රමුඛතම නිපැයුම වන බිල්ලා ක්ලවුඩ් (BillaCloud-Business Management System) මීට පෙර e-ස්වාභිමානි 2020 සම්මාන උලෙළේදී ද ව්‍යාපාර හා වාණිජ කාණ්ඩය යටතේ ඇගයුමට ලක් විය. බිල්ලා ක්ලවුඩ් යනු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අවශ්‍ය සියල්ල ඇතුළත් ව්‍යාපාර කළමනාකරණ පද්ධතියකි. එක් ලියාපදිංචි කිරීමකින් Cloud POS, Mobile POS, Ecommerce Websites, Order Management Platform සහ Driver app යනාදී සේවා රැසක් සැපයීමට එම පද්ධතියට හැකියාව තිබේ.

## ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරයට රන් සම්මාන ද්විත්වයක්



ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමාගමක් වන ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරය ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FCCISL)සංවිධාන කළ වසරේ ව්‍යවසායකයා සම්මාන උලෙළේදී ජාතික මට්ටමේ, මහා පරිමාණ කාණ්ඩයේ, රන් සම්මානයෙන් සහ බස්නාහිර පළාතේ, මහා පරිමාණ කාණ්ඩයේ, රන් සම්මානයෙන් පිදුම් ලැබීය. සම්මාන උලෙළ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් උත්කර්ෂවත් ලෙස BMCHහිදී පැවැත්විණි. ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂ මංජුල ආරියකුමාර මහතා එහිදී සම්මානය ගත්තේය."නිෂ්පාදන සහ සේවා විශිෂ්ට මට්ටමින් සැපයීම අපගේ ප්‍රධාන දැක්ම වන නිසා ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරය නිරන්තරයෙන් ඇගැයීමට ලක් වෙමින් සම්මාන දිනා ගන්නවා. මේ සම්මානය ගැනීමට දායකත්වය සැපයූ කාර්ය මණ්ඩලයට මෙන්ම අපගේ පාරිභෝගිකයන්ට මගේ කෘතවේදීත්වය පිරිනමනවා." මංජුල ආරියකුමාර මහතා පැවසීය.

කුඩා පරිමාණයෙන් අරඹා වර්තමානයේදී ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමාගමක් බවට පත්වී තිබෙන ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරය සම්මාන රැසකින් පිදුම් ලබා ඇත. ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය පිරිනැමූ කර්මාන්ත විශිෂ්ටතා රන් හා රිදී සම්මාන සහ ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය පිරිනැමූ විශිෂ්ටතම ව්‍යවසායකයා රන් හා රිදී සම්මාන හිමි කර ගැනීමත්, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පිරිනැමූ නිෂ්පාදන විශිෂ්ටතා සම්මානවලින් අඛණ්ඩව පිදුම් ලැබීමත් ඒ අතරින් ප්‍රධානය. ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරයේ නවතම පරිසර හිතකාමී හඳුන්වාදීම වන්නේ හිරු එළියෙන් විදුලිය නිපදවන සූර්ය පැනල පද්ධතියයි. ත්‍රී සිංහ සමූහය නවීන තාක්ෂණය යොදා ගනිමින් අඩු වියදමින් වානේ ගොඩනැගිලි (Prefabricated Steel Building) ඉදිකිරීමද අරඹා තිබේ. රෝලර් ඩෝ, රෝලර් ෂටර්ස්, සෙක්ෂනල් ඕවර්හෙඩ් ඩෝ, වින්ඩෝ ෂටර්ස්, ෆයර් රෙසිස්ටන්ට් ඩෝ, ඇලුමිනියම් ෆැබ්රිකේෂන්ස්, සෙන්සර් ඩෝ, ස්ටේන්ලස් ස්ටීල්, ස්ටීල් රේලින්ග්ස් සහ ස්ටෙයාවේස්, පොලිකාබනේට් කැනපීස්, ස්ටේන්ලස් ස්ටීල් පැන්ට්‍රි කබඩ්ස්, ස්ටීල් බිල්ඩින්ග්ස්, ඔටෝමැටික් බැරියර්ස් සහ මෝටර් සවි කළ ස්ලයිඩින්ග් ඇන්ඩ් ස්වින්ග් ගේට්ස් ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරයේ අනෙකුත් නිෂ්පාදන අතර වේ.




| | නාරාහේන්පිට ආ. ම. | රත්මලාන ආ. ම. | වැලිසර. ආ. ම. | මීගොඩ ආ. ම. | තඹුත්තේගම ආ. ම. | දඹුල්ල ආ. ම. | නුවරඑළිය ආ. ම. | මිල රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|
| **පහත රට එළවළු** | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | තොග මිල රු. | තොග මිල රු | තොග මිල රු. | තොග මිල රු | | තොග මිල රු. |
| වට්ටක්කා | 100 | 120 | 70 | 60-70 | 60 | | ගෝවා | 90 |
| අළු කෙසෙල් | 100 | 130 | 60 | 55-60 | 30-40 | 40-50 | කැරට් | 120 |
| පිපිඤ්ඤා | 70 | 80 | 30 | 30-40 | 15-20 | 15-20 | ලීක්ස් | 70 |
| වැටකොළු | 160 | 160 | 90 | 90-100 | 80-100 | 70-80 | රාබු | 50 |
| බණ්ඩක්කා | 120 | 100 | 70 | 60-70 | 50-60 | - | බීට්රූට් | 65 |
| කරවිල | 200 | 200 | 120 | 100-110 | 110-120 | 80-90 | අර්තාපල් | 120 |
| පතෝල | 160 | 160 | 80 | 110-120 | 60-70 | 65-70 | අර්තාපල් රතු | 100 |
| මාළු මිරිස් | 280 | 280 | 220 | 200-230 | 250 | 170-200 | නෝකෝල් | 70 |
| බටානා | - | - | 100 | 80 | 80-85 | 60-70 | බෙල්පෙපර් රතු | 400 |
| මුරුංගා | 400 | - | - | - | 160-180 | 150-160 | කහ | 400 |
| එළබටු | 140 | - | 90 | 80-120 | 50-80 | 80-90 | කොළ | 350 |
| කැකිරි | 80 | 90 | 30 | 30 | 50-60 | 25-30 | බැසිල් | 330 |
| නෝකෝල් | 140 | 120 | 80 | 70 | 80 | 35-40 | චයිනීස් කැබේජ් | 170 |
| මඤ්ඤොක්කා | 70 | 80 | 110 | - | 30-35 | 25-30 | රෙඩ් කැබේජ් | 800 |
| බතල | - | - | 50 | - | 50 | 40-50 | සැල්දිරි | 240 |
| දඹල | 180 | 100 | 100 | 100 | 70 | 80-90 | කොත්තමල්ලි කොළ | 175 |
| මැකරල් | 140 | 120 | 70 | 60-70 | 50-70 | 80-90 | අයිස්බර්ග් | 175 |
| **උඩරට එළවළු** | | | | | | | සලාද | 60 |
| බෝංචි | 140 | 200 | 110 | 110 | 60-70 | 80-100 | රතුසලාද | 550 |
| ගෝවා ගෙඩි | 160 | 160 | 100 | - | 40-50 | 80-90 | මිංචි | 170 |
| කැරට් | 180 | 200 | 130 | 130-140 | 160-180 | 130-140 | පාස්ලි | 450 |
| ලීක්ස් | 120 | 160 | 80 | 90 | 40-70 | - | රූබා | 60 |
| රාබු | 120 | 100 | 30 | 40-80 | 30-40 | 15-20 | රෝස්මරි | 700 |
| තක්කාලි | 120 | 160 | 80 | 80 | 60-100 | 65-70 | බ්‍රොකෝලි | 1100 |
| බීට්රූට් | 140 | 160 | 60 | 70 | 60-100 | 50-60 | මල්ගෝවා | 850 |
| සලාද | - | 210 | 200 | - | 40-70 | - | රතුරාබු | 450 |
| ගෝවා කොළ | 180 | - | 100 | 20-30 | - | - | පැවර්ලි | 120 |
| **පලතුරු** | | | | | - | | සුකිනි | 170 |
| අන්නාසි | 140 | 150 | 110 | 100 | - | 100-110 | කහ සුකිනි | 170 |
| ඇඹුල් කෙසෙල් | 140 | 140 | 70 | 90 | 30-70 | 65-70 | දිගරාබු | 100 |
| කෝලිකුට්ටු | 250 | 250 | 180 | 190 | 160-180 | 150-170 | තක්කාලි | 220 |
| සීනි කෙසෙල් | 140 | 140 | 80 | 80 | 30-70 | 75-80 | මාළුමිරිස් | 270 |
| ඇම්බුන් | 200 | 200 | 120 | - | 130-160 | 75-80 | | |
| ගස් ලබු (රෙඩ්ලේඩි) | - | 110 | 140 | 120 | 60-100 | - | | |
| ගස් ලබු | 180 | 120 | 140 | 120 | 60-100 | 80-90 | | |
| ඇපල් (ආනයනික) | 60-80 | 250 | 60 | - | - | - | | |
| මිදි (දේශිය) | - | - | - | - | - | - | | |
| මිදි (ආනයනික රතු) | 1100 | 1200 | 950 | - | - | - | | |
| මිදි (ආනයනික කොළ) | 1000 | 1200 | 950 | - | - | - | | - |
| **මස්** | | | | | | | | |
| කුකුළු මස් - අලුත් (සම රහිත) | 650 | 620 | 500 | - | 510 | - | | - |
| කුකුළු මස් - ශීත කළ (සම සහිත) | 480-560 | 450 | 650 | - | - | - | | |
| **අනෙකුත්** | | | | | | | | |
| අමු මිරිස් | 280 | 240 | - | 200-210 | - | - | | |
| දෙහි | 140 | 160 | - | 80-90 | 55-60 | 60-70 | | |
| අමු ඉඟුරු | - | 320 | - | - | - | 150-160 | | |
| **සහල්** | | | | | | | | |
| රතු නාඩු | 110 | 110 | 980 | 111-115 | 96 | - | | |
| සුදු නාඩු | 105-115 | 105 | 100 | 98-99 | - | - | | |
| රතු කැකුළු | 100 | 95 | 94 | 98-99 | - | - | | |
| සුදු කැකුළු | 100 | 100 | 95 | 92-94 | 93 | - | | |
| සුදු කැකුළු සම්බා | 98-125 | - | 120 | 115-116 | 94 | - | | |
| තම්බපු කැකුළු සම්බා | 98-125 | 135 | 120 | - | 130 | - | | |
| කිරි සම්බා | 175-195 | 185 | 175 | - | - | - | | |



දැනගෙන ගන්න
**රන් මිල**

| | |
|---|---|
| කැරට් 21 | 94500 |
| කැරට් 22 | 99000 |
| කැරට් 24 | 108000 |

2021 අප්‍රේල් 10 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ
2021 අප්‍රේල් 10 සෙනසුරාදා
සදුතනික පත්තර තාරුණ්‍යය

# යොවුන් ජනතා



චිත්‍රය - ප්‍රබෝධා ජයකමාලි

PAGE 02

## සුදු හුඹස් කළු මැණික්

අතිශයින්ම චොක්ලට් පාට කෙල්ලන්ට



PAGE 07

## Sex කියන්නේ Gender වලට ම ද?



PAGE 08

## සුද්දගේ ක්‍රීඩාවට පිති හදන අපේ කොල්ලෙක්



අපි ඔබ ඉලක්ක කරන්නෙමු

**යොවුන් හදවත් තුළ අර්ථවත් අකුරු නවාතැනක් වීම අප පුවත්පතෙහි මූලික අරමුණයි. තරුණයන් ඉලක්කගත කර ගනිමින්, හරසුන් දේ බලෙන් ඇගේ ගැසීම වෙනුවට අරුත්බර දේ ආදරයෙන් වැලඳ ගන්නා මාවතක් සැකසීම අපේ බලාපොරොත්තුවයි. ඕනෑම නිපැයුමක රඳා පැවැත්ම වෙනුවෙන් ඔවුන් ඉලක්ක ගත කරන්නේ ද තරුණ පරපුරයි. අපේ ඉලක්කය ද ඔබයි. ඔබේ ගමනට හරි මඟ සලකුණු පෙන්වීමට හැකි නම් අපේ ජයග්‍රහණය එයයි.**

එන්න, අපි හරි පාරක් හදමු

**සංස්කරණය - රජිත බස්නායක**

younjanatha@lakehouse.lk

**'යොවුන් ජනතා', දිනමිණ**
**අංක 35**
**ලේක් හවුස්**
**ඩී. ආර්. විජයවර්ධන මාවත**
**කොළඹ 10**

**යොවුන් ජනතා මුල් කවරය හැඩගැන්වීමට ඔබේ නිර්මාණයත්**
younjanatha@lakehouse.lk
**ලිපිනයට යොමු කරන්න**

# තරුණ ශ්‍රමයෙන් වැඩක් ගනිමුද?



**රටක අධ්‍යාපනය යනු ආයෝජනයකි. එසේ ආයෝජනයකින් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා කෙරේ. අප රටේ අධ්‍යාපනය ද එබඳුම වූවකි. රජය විශාල මුදලක් වැය කොට නිදහස් අධ්‍යාපනය ක්‍රියාවට නංවයි. අවසානයේ උපාධිධාරීන් විශාල පිරිසක් වාර්ෂිකව බිහි කරනු ලබයි. ඔවුහු ජාතික ශ්‍රම බළකාය වශයෙන් එක් වෙති. රටක වටිනා ශ්‍රම සම්පත රටේ සංවර්ධන කාර්යයට දායක කර ගත යුතුව ඇත.**

එහෙත් ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් විරැකියාවෙන් පීඩා විඳියි. රජය කරනු ලබන ආයෝජනයේ නිසි ඵල නොලැබී පාඩු විඳියි. මෙයට හේතුව කුමක්ද?

රටෙහි ආර්ථික ක්‍රියාවට බද්ධව සිටින ව්‍යාපාරිකයන් හා කර්මාන්තකරුවන් ඇතුළු ව්‍යාපාරික ප්‍රජාව විශ්වවිද්‍යාල වලින් පිටවන උගතුන්ට රැකියා අවස්ථා දීමට මැළි වෙති. ඔවුහු උපාධිධාරීන් ප්‍රතික්ෂේප කිරීමට උත්සුක වෙති. මෙසේ ගැටලුකාරී තත්ත්වයක් උද්ගතව ඇත්තේ රජය හා ව්‍යාපාරික ප්‍රජාව අතර පවත්නා දුරස්ථතාව හේතුවෙන් ද? නොඑසේනම් රටේ ආර්ථික ක්‍රියා පිළිවෙළ හා අධ්‍යාපන ක්‍රමවේදයේ පවත්නා අසම්බන්ධතාව හේතුවෙන් ද?

මූලික අධ්‍යාපනයට පිවිසෙන පිරිස අතරින් 0.1% ක පමණ ප්‍රමාණයක් උසස් අධ්‍යාපනයට පිවිසෙති. ඔවුහු විශ්වවිද්‍යාලයෙහි විවිධ පාඨමාලා හදාරා උපාධි ලබති. එහෙත් රැකියා සඳහා යෝග්‍ය පාඨමාලා හැදෑරීමට අප රටෙහි තවමත් අවශ්‍ය පමණ විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතන බිහිව නැති බවක් පෙනේ. එහෙයින් ව්‍යාපාරික ප්‍රජාව අපේක්ෂා කරන රටෙහි ආර්ථික සංවර්ධනයට දායක කරගත හැකි ශ්‍රම බළකායක් බිහි නොවන බව සැබෑය. එහෙත් මෙය විසඳිය නොහැකි ගැටලුවක් ද නොවේ.

දැනුම ලබා ඇති උගතුන් වූ උපාධිධාරීන් කුසලතා පූර්ණ කිරීම අපහසු නොවේ. කෙටිකාලීන පුහුණුවකින් ඔවුන් යෝග්‍ය පුද්ගලයින් බවට පත් කිරීම අසීරු නොවේ. ඉන් අනතුරුව ඔවුන්ගේ ශ්‍රම දායකත්වය සංවර්ධනය සඳහා පහසුවෙන් යොදා ගත හැකිව ඇත. එහෙත් ව්‍යාපාරික ප්‍රජාව නිතරම උත්සාහ දරනුයේ සිය ලාභ ප්‍රතිශතය ඉහළ මට්ටමක රඳවා ගැනීම සඳහායි. ඒ හේතුවෙන් දැනුම් රහිත වූ කුසලතා ඇතියවුන් අඩු වැටුප් පරිමාවකට සේවයෙහි යොදවා ගැනීමට ඔවුහු පෙලඹෙති.

උපාධිධාරී පුහුණු ශ්‍රමිකයින් සේවයට බඳවා ගැනීම තුළින් ඔවුනට ගෙවීමට සිදුවන වැටුප් ඉහළ මට්ටමක් විය යුතු අතර ව්‍යාපාරිකයින්ගේ ලාභය කෙරෙහි එයින් බලපෑමක් සිදුවේ. මේ ක්‍රමය තුළ උපාධිධාරී උගත් පිරිස් මන්දෝත්සාහී කිරීමට ව්‍යාපාරික පිරිස් පෙලඹෙති. ඒ ඔස්සේ උසස් අධ්‍යාපනය සඳහා යොමුවන කණ්ඩායම අවම කර ඔවුහු සිය අනාගත අපේක්ෂාවන් සපුරා ගනිති.

විශේෂයෙන්ම මේ තත්ත්වය පිළිබඳ රජයේ අවධානය යොමු විය යුතුය. උගත් ශ්‍රමික පිරිස්වල ශක්තිය රටේ සංවර්ධනයට යොමු කර ගත හැකි විධිමත් ක්‍රියා පිළිවෙතක් සකස් කළ යුතුය. එපමණක් නොව උපාධිධාරී පුහුණු ශ්‍රමදායකත්වයක් සැපයිය හැකි නව අධ්‍යාපන ක්‍රමවේදයන් භාවිත කිරීමට ද කටයුතු කඩිනම් කළ යුතුය. ඒ සඳහා පුහුණු පාඨමාලා භාවිත කළ හැකිය.

ජාතික ශක්තිය හා ජීවය වන උගත් තරුණ පරපුර මන්දෝත්සාහී තත්ත්වයකට පත්වීමට ඇති ඉඩකඩ මගහරවා ගත යුතුව ඇත. රජය මුදල් වැයකොට තරුණයින් සිය ශක්තියෙන්ලැබූ අධ්‍යාපනය රටටත් ඔවුනටත් පාරාවළල්ලක් වීමට ඉඩ නොතබා අවතක්සේරුවට ලක්වීමට ඉඩ නොහරිමු. අධ්‍යාපන ප්‍රතිසංවිධාන ක්‍රියාවට නංවා හෙට ලොව උගත් බුද්ධිමත් ලෝකයක් කිරීමට වෙර දරමු.

**ඔවිඳු ජයසූරිය**
**12 ශ්‍රේණිය (කලා අංශය)**
**ගා/ක්‍රිස්තුදේව පි.වි.,බද්දේගම**

# දූපත් මානසිකත්වයෙන් ඔබ්බට...



**ප්‍රේමය යනු නව යෞවන වියෙහි ඇති වන සිතුවිල්ලකි. අද සමාජයේ දරුවා තාක්ෂණය හරහා ලෝකය හා සම්බන්ධ වේ. හොඳ හෝ නරක වේවා තාක්ෂණය තුළින් ඔහු හෝ ඇය ලෝකය දකියි. එයින් නිදහස කියන දේ අවබෝධ කර ගනියි. මේ සමග ඔහු හෝ ඇය තුළ යම් පෞරුෂත්වයක් ගොඩ නැගෙයි. එම පෞරුෂත්වය තුළින් ඔහු හෝ ඇය තනි තීරණයන්ට එළැඹේ. එහි ප්‍රතිඵලයක් ලෙස පාසල් ප්‍රේමයේ ගොඩ නැඟීමක් සිදුවේ.**

දරුවා ප්‍රේම කිරීමට ඉගෙන ගන්නේ ඔහුගේ පවුල තුළිනි. පවුල හැරුණු පසු ඔහුට පළමුව ආදරයක් හමුවන්නේ පාසල තුළිනි. මෙම යෞවන ප්‍රේමය සාමාන්‍ය වූවකි. එම ඇති වන කුළුඳුල් සිතුවිල්ල එක් වීම, කසාදය දක්වා කතා කරන්නේ වැඩිහිටියන් විසිනි. එයින් පැහැදිලි වන්නේ වැඩිහිටි පරම්පරාවට මේ නව යෞවනය තේරුම් ගත නොහැකි බවයි.

ආදරය හා ලිංගිකත්වය යනු අදහස් දෙකකි. එම නිසා පාසල් ප්‍රේමය කියූ පමණින්ම ලිංගිකත්වය ගැන කතා කිරීම සාධාරණ නොවේ. නව යෞවන ප්‍රේමයක දී වැඩිහිටියන් ලෙස ප්‍රචණ්ඩව ක්‍රියා කිරීම උචිත නොවේ. තම පවුල සමග ආදරණීය, විශ්වාසනීය, ගෞරවනීය සම්බන්ධතාවයක් තිබෙන දරුවා තම සීමාව ඉක්මවා කටයුතු නො කරයි. ඒ නිසා ප්‍රචණ්ඩත්වය වෙනුවට දරුවාට නිසි අවබෝධයක් පමණක් දිය යුතු බව මම විශ්වාස කරමි.

ප්‍රේමය යන සුදුසු කාලය පැමිණි පසු ලිංගිකත්වය යන සංකල්පය දක්වා යන ගැඹුරු හැඟීමකි. ලිංගිකත්වය යනු ප්‍රජනන ක්‍රියාවලියක් බව වැඩිහිටියන් දරුවන් සමඟ විවෘතව කතා කළ යුතු ය. අම්මාගෙන් දුවට යන ලිංගික අධ්‍යාපනයක්, පියාගෙන් පුතාට යන ලිංගික අධ්‍යාපනයක් අද සමාජයේ තිබිය යුතු ය. ලිංගික කුකුසෙන්, පිපාසයෙන්, අසහනයෙන් පෙළෙන තිරිසන් භාවය ද අබිබවා යන සමාජයක ජීවත් වීමට නම් දරුවාට ලිංගික අධ්‍යාපනය දිය යුතු ය.

ආදරය, ගෞරවය, ආරක්ෂාව මේ සියල්ලෙහි ම ගැඹුර වන්නේ ප්‍රේමයයි. එසේ නැති වුවහොත් විවාහය දික්කසාදය දක්වා කෙළවර වේ, අනියම් සබඳතා ගොඩනැගේ. මෙවැනි ප්‍රශ්න නිසා අසරණ වන්නේ ද දරුවන්ය. බටහිර සමාජය තුළ ප්‍රශ්න සීමිත වන්නේ ඔවුන්ගේ 'ලිවින් ටුගෙදර්' සංකල්පය නිසා වෙනි. ලාංකීය සමාජය තුළ 'ලිවින් ටුගෙදර්' සංකල්පය ආන්දෝලනාත්මක ප්‍රශ්නයකි. 'ලිවින් ටුගෙදර්' හරහා දෙදෙනා තුළ ඇති වෙන පරිණත භාවය තුළින් විවාහය දික්කසාදය දක්වාම නොයයි.

**ඩී.ජී. එන්. මධුෂාණි**
**ජනසන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යන අංශය,**
**නැඟෙනහිර විශ්වවිද්‍යාලය,**

# සුදු හුඹස් - කළු මැණික්

## (අතිශයින්ම චොක්ලට් පාට කෙල්ලන්ට)

මොකක්ද මේ සුදු හුඹස් - කළු මැණික් කතාව? මේ ගැන ලියන්නම ඕන කියලා අදහසක් පහළ වුණේ තමන්ගේ හම සුදු නෑ කියලා ජීවිතේ අනිත් හැමදේම අත්හැරලා ඔහේ හුල්ලන ජීවිත කීපයක් ගැනම කතා සැරින් සැරේට සමාජ මාධ්‍ය ඇතුළෙ අහන දකින නිසා. අපි කවුරුත් එක වගේ පෙනුමට මේ ලෝකේට ඉපදිලා නෑ. අතේ ඇඟිලි පහ වුණත් එක වගේ නැත්තෙ ඒකයි. බහුතරයක් දෙනා ලස්සන කියන දේ තීරණය කරන්නේ හමේ පාට අනුව. මේක ඒ තරම් ගණන් ගන්න ඕනි නැති දෙයක් වගේ පෙනුනට ලංකාවේ ගැහැනු ළමයි වැඩි පිරිසකට මේ ගැටලුව මානසික පීඩනයක් බවට පත් වෙලා තියනවා. මුලින්ම කියන්න ඕන ලස්සන කියලා කියන්නේ සුදු පාටට නෙවෙයි. මෙන්න මේ අමන සංකල්පය හිතෙන් අතුගාලා දාන එක තමයි පළවෙනිම විසඳුම. තමන් ගැන කොහොමටවත් අවතක්සේරුවක් තියාගන්න හොඳ නෑ. මොකද සිතිවිලි තමයි හැමදාමත් අපිව ජීවත් කරවන්නේ. ඉතිං යහපත් ප්‍රතිඵල ගන්නනම් යහපත් දේවල්ම හිතන්න ඕනි. ලස්සන කියලා කියන්නේ ඇත්තටම හරිම සාපේක්ෂ දෙයක්. එක එක්කෙනා ලස්සන කියන දේ විවිධාකාරයෙන් දකින්න පුළුවන්. කළු පාට හමක් තියන ගෑනු ළමයි කැතයි කියලා කියන්නේ කොහොමද ඉතිං?

අඳුරු පාට හමක් තියන ගෑනු ළමයෙක්ගෙ ජීවිතේ එයා ඒ හමේ පාට නිසා අනිත් අය ඉදිරියේ පීඩාවට පත්වුණු අවස්ථා ඕනි තරම් ඇති. ඒ හැම කෙනෙක්ගෙම කතා හරිම සමානයි. පුංචි බබෙක්ව ආසාවට තුරුල් කරගන්න නෑ. “ඔන්න පුතේ නැන්දිගෙ / අක්කිගෙ කළු ගෑවෙයි” ඒ එක කතාවක්. ටිකක් තේරුම් යනකොට ඔය කියන කතාවලට දුක හිතුණා නේද? මේ අනිත් කතාව “ඒ ළමයා නිකං දෙමළ ළමයෙක් වගේ.” දෙමළ කිව්ව ගමන් අපේ මිනිස්සුන්ට මතක් වෙන්නෙම කළු පාට. ටිකක් හිතලා බලන්න ලංකාවේ ඇතැම් වැඩිහිටියෝ ළමයින්ව මේ වගේ කතාවලින් මානසිකව වට්ටන්නෙ නැද්ද කියලා? ඇයි කෙනෙක්ව දැක්කාම ඒ මනුස්සයට ජීවත් වෙන්න ආස හිතෙන හේතුවක් කියන්නේ නැත්තේ ? සමහර පාසල්වල ගුරුවරු පවා මේ ගැටලුව තාමත් හරි හැටි අවබෝධ කරගෙන නෑ. මොන තරම් දක්ෂ දරුවෙක් වුනත් හමේ පාට නිසා වටිනා අවස්ථා අහිමි වුණු වාර ඕන තරමක් අදටත් ඇති.

මේ වගේ දුර්වල ආකල්ප තියෙනකල් චොක්ලට් පාට හම තියන දරුවො සමාජයෙන් දුරස් වෙලා ඉඳීවී. ඔව්... ඒකට මං කියන්නේ චොක්ලට් පාට කියලා. වැදගම්මකට නැති හේතුවක් වෙනුවෙන් ළමයින් සමාජෙන් ඈත් කරන එක හරි අපරාධයක්. සමහර ප්‍රේම සම්බන්ධතා අතරමඟ නතර වෙන්නත් මේ හේතුව බලපාන්න පුළුවන්. ඇත්තටම ලස්සන තියෙන්නේ තමන්ගේ හමේ තියන පාට උඩ නෙමෙයි. පිරිසුදුවට පිළිවෙළකට ඇඳලා සතුටින් සැහැල්ලුවෙන් ජීවත් වෙන ඕනිම කෙනෙක් හරිම ලස්සනයි. මේ කිසි දෙයක් ඕනි නෑ , අවංකව හිනාවෙන හැම කෙනෙක්ම හැමදාමත් ලස්සනයි. ආසියාතික රටක් නිසා අපිට කොහොමත් උරුම වෙලා තියෙන්නේ කළු පැහැයට හුරු සමක්. විද්‍යාත්මකව කිව්වොත් මෙලනින්වලින් පෝසත් හමක්. ඉතිං ස්වාභාවිකව අපිට ලැබිලා තියන පාට කෘතිමව වෙනස් කරන එක ශරීරයට ඒ තරම් හොඳ දෙයක් නම් නෙවෙයි. අනේ මං කළුයි කැතයි කිය කිය ළතවෙන එකෙන් වෙන්නේ තමන්ගේ මුළු ජීවිතේම කිසිම රහක් නැතුව ගෙවන්න වෙන එක විතරයි. හැමදේටම කලින් තමන්ට ආදරේ කරන්න පුරුදු වෙන්න. එහෙම නොකරන තාක් කවදාවත්ම මේ ජීවිතේ සතුටක් සැහැල්ලුවක් දැනෙන එකක් නෑ. චොක්ලට් පාට කියන්නේ තව දුරටත් මේ සමාජෙ ඇතුළෙ කොන්වෙලා තියන පාටක් නෙවෙයි. 2019 වසරේදී රටවල් 111 ක් පරදලා ලෝක රූ රැජන වුණේ ජැමෙයිකාවේ ටෝනි ඈන් සිංග් කියන දැකුම්කලු තරුණිය. ඒ අවුරුද්දේ විවාහක රූ රැජන බවට පත් වුණෙත් තලෙළු හමක් තියන ලංකාවේ කැරොලයින් ජූරි. එම වසරේම විශ්ව රූ රැජන ලෙස කිරුළු පැලඳූ දකුණු අප්‍රිකාවේ සොසිබිනි ටුන්සි මෙන්න මෙහෙම පණිවිඩයක් මුළු ලෝකයටම ලබා දෙනවා.



“මගේ වගේ සමක් සහ කොණ්ඩයක් තිබෙන මා වැනි කාන්තාවන් කිසිදාක ලස්සනයි කියා සලකපු නැති ලෝකෙක තමයි මං ඉපදුණේ. ඒක අදින් නවතිනවා කියා මා සිතනවා”

ඉතිං තවත් මොන උදාහරණ මේ වෙනුවෙන් කියන්නද? හමේ පාට නිසා කවදාවත්ම තමන්ගෙ ඉලක්ක අත් හරින්න එපා. මොකද මේ ලෝකේ මේ වෙනකල්ම වෙනස් කරේ අලුත් විදියට හිතපු මිනිස්සු. කාන්තරයේ කුසුම පොතේ අසහාය ගැහැනිය වාරිස් ඩයිරිත් මේ වෙලාවේ අමතක කරන්නම බැරි චරිතයක්. ඉතිං තවත් අටුවා ටීකා මොකටද සුදු පාට පුහුල් දෝසි වගේම කළු දොදොළුත් පට්ට රසයි. වැනිලා වගේම චොක්ලට් අයිස් ක්‍රීම් කන්නත් බහුතරයක් දෙනා කැමතියි. ඇත්තෙන්ම.... සමහර සුදු පාට හුඹස් ළඟ හැම කළු මැණිකක්ම කියන්න බැරි තරමට ලස්සනයි.

**හර්ෂමාලී වීරරත්න**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ජනසන්නිවේදන අධ්‍යයනාංශය**

# වෙස් ගත්තෝ



"සිනාවෙන් හෝ කතාවෙන් බෑ මනින්නට මිනිසා" කියලා බෙග් මාස්ටර් සින්දුවකින් අපිට උගන්නනවා. ඔය කියන කතාව ගොඩාක් දුරට හරියටම හරි. බහුතරය එහෙම තමයි. සුළුතරයක් ඉන්නවා හිනාවෙනුයි කතාවෙනුයි මැන ගන්න පුළුවන් ජාතියේ අය. ඇත්තටම අද සමාජෙ මනුස්සයෙක්ව ගොඩක් වෙලාවට සිනාවෙන් කතාවෙන් මැන ගන්න පුළුවන්කමක් නෑ. මොකද දාගෙන ඉන්නෙ වෙස් මූණක්. සමාජෙට පෙන්නන්නෙ එක මූණක්. ඒත් ඇත්ත ජීවිතේ තව මූණක්. හරියට "හක්කෙ බුදු රැස් බොක්කෙ දඩමස්" වගේ.

අපිට හරි ආදරෙන් ලංවෙන අය ගොඩ දෙනෙක්ගෙ ඇත්ත ස්වභාවය හාත්පසින්ම වෙනස්. කපටිකම, වංචාකාරී හැඟීම් ඒ වෙස් මූණ ඇතුලෙ තියෙනවා. ආදරෙයි කිය කිය උඹට ළං වෙන්නෙ මොකක් හරි ලාභ ප්‍රයෝජනයක් ගන්න අරමුණින් වෙන්න පුළුවන්. ඒ වෙනුවෙන් පාවිච්චි කරන්නෙ ආදරේ නාමෙන් දාගත්ත බොරු වෙස් මූණක්. අපිට බොක්කෙන්ම උදව් කරන විදියට කරට අත දාගෙන, වචනෙනුත් පණ දෙන්න කතා කරන යාළුවො ගොඩ දෙනෙක් ඔයාට මට කරදරයක්, ප්‍රශ්නයක් වෙනකොට අහලකවත් නෑ. දුසිම් දෙක තුනක් ඉන්න යාළුවො අතරින් ඒ වෙලාවට අපිට පිහිට වෙන්නෙ අතේ ඇඟිලි ගානටත් වඩා අඩු පිරිසක්. තමන්ගෙ කපටි අරමුණු වෙනුවෙන් තමන්ගෙම අම්මා, තාත්තා, දරුවා පල් කියල බොරු පොරොන්දු දෙන්න පුළුවන් ජාතියෙ පහත් ගති තියෙන මිනිස්සු මේ රටේ ඉන්නවා.

සමහරු ඉන්නවා අපේ ඔළුව අත ගගා ඉදලා අපිටත් නොදැන හීනියට අපිටම ටොක්ක ඇනලා යන ජාතියෙ අය. මේ හින්දා අද කාලෙ හරි අමාරුයි වෙස් මූණු දාගෙන නැති අය හොයා ගන්න. සද්ගුණවත් ව්‍යාපාරිකයො විදියට රටට පෙන්නන සමහරු නීති විරෝධි බිස්නස් කරනවා සුදු ඇඳගෙන මිනිස්සු ඉස්සරහ කට පුරවල හිනාවෙන සමහර ඇත්තො කරන්නෙම පස් පව්. අහිංසක හිනාවෙන්, වශී කරවන කතාවෙන් මිනිස්සු රවට්ටන ඔය කොයි කවුරුත් දන්නෙ නෑ තමන්ගෙ වෙස් මූණ ගැලවෙන දවසකුත් එනවා කියලා. ඇයි අපි බොරු වෙස්මූණු දාගෙන සමාජෙට එකක් ඇත්ත ජීවිතේ තව එකක් කරගන්නෙ? ඒ මූණු ගැලවුණු දාට ඒක දරා ගන්නත් සෑහෙන අමාරුයි නේද.? ඉතින් මේ විවිධාකාර වෙස් ගත්ත චරිත අතර ඔයත් තව වෙස් ගත්ත චරිතයක් වෙන්න එපා. ඔයා ඔයාම වෙන්න ට්‍රයි කරන්න. මොකද කොයි වෙස් මූණත් තාවකාලිකයි. ඒත් සැබෑ මූණ සදාකාලිකයි.

**කුමුදිකා ඩී. සපුතන්ත්‍රි**

# අපි නැති වෙන තවත් තැනක්



පැරණි ඉතිහාසයකට උරුමකම් කියන ලක්දිව නම් පුණ්‍ය භූමියේ යළි උපදින්නට මමත් ඔබත් උදම් අනමින් පුරසාරම් දොඩමින් පෙරුම් පුරන්නනෝ නොවෙද? ලාංකිකයන් යනු ආගන්තුක සත්කාර මැනවින් ප්‍රකට කරන්නට සමත් විශිෂ්ට ජාතියක් විදිහට අනෙක් රටවල් අතරින් කැපී පෙනුණ ජාතියක්. අපේ ආහාර සංස්කෘතිය පවා අනෙක් ජාතීන් වගේ පුරසාරම් අනමින් ප්‍රදර්ශනාත්මක ලෙසින් නොපෙන්වපු සංස්කෘතියක්. බුදු දහමින් පෝෂිත මේ ධර්මදීපය වනචාරීන්ගේ නොහොබිනාකම් නිසා පළුදු වන්නේ අනේ අපොයි යන්න මුමුණන්නට අවැසි පරිසරය සකසමිනි. වෛරීසහගත පිළිකුල සෑම අයෙක්ගේ ම සිත් තුළ ඔඩුදුවන්නේ නිරායාසයෙනි. ලංකාවෙ සංස්කෘතිය ගැන අපි කතා කරන්නෙ මහත් උජාරුවෙන්. එදා අපේ සංස්කෘතියෙ අපටම ආවේණික වූ වෙනස්ම සුන්දරත්වයක් තිබ්බා. අපේ රට සුද්දන්ට යටත් වෙලා වහල්ලුන් වගේ අපේ උන් වැඩකරද්දි අපිටම කියලා ඔළුව උඩ තියන් හිටිය සංස්කෘතියට මොකද වුණේ ? අපේ කියන් හිතන් හිටපු සංස්කෘතිය ඈත් කරලා පර සංස්කෘතීන්ගේ පහස ලබන්න යොමු වුණා ම අපේ ආහාර සංස්කෘතියත් වෙනස් ම වුණා.

විදෙස් සංස්කෘතීන්ගේ ආහාර රටා අපේ සංස්කෘතිය හිස් මුදුනින් පිළිගත්තෙ භාර ඔප්පු කරන්න දේවාල ගානේ පෝළිම්වල පලතුරු වට්ටි ඔළුගෙඩි උඩ තියන් ඉන්නවා වගේ. හරිම ශ්‍රද්ධාවෙන්. ඒත් කවදාවත් මෙතෙක් ලාංකිකයන් විදිහට කනට ඇහුවෙ නැති නුපුරුදු ලෙඩ රෝගවල නම් ගොඩක් දෝතට එන්න ගත්තෙ පර සංස්කෘතීන්ගෙ ආහාර රටා බද්ධ කරගත්ත නිසා ම තමයි. නොමැරී ජීවත් වෙන්න කාටවත් පුළුවන්කමක් නම් නෑ. ඒත් අවුරුදු අනූවක් සීයක් ජීවත් වෙන්න අපේ මුතුන් මිත්තන්ට වාසනාව තිබුණා. ඒකට වැදගත් ම හේතුව තමයි ආහාර රටාව. අද සමාජෙ ජීවිතයක ආයු කාලය සීමිත අවුරුදු ගාණකට සීමා වෙන්න හේතුව තමයි පර සංස්කෘතීන් ආහාර.

මාරයාට අත වනමින් තමා මාරයා අභිමුඛයට යාමට සූදානම් බව කියාපාන්නට සමත් සියලු මං මාවත් විවර කරනන්ට අද සිංහල ජාතිය සමර්ථව ඇත. අපේ සංස්කෘතියට වින කෙටූ විදෙස් සංස්කෘතිය නිරායාසයෙන් අපට ආවක් ම නොවෙයි. අපේ කැමැත්තට අපම ගෙන්වා ගත්තක් .

සංවර්ධනය වීම යන අභිලාෂය මූලික කරගෙන නවමු දේ ජීවිතවලට එක්කාසු කරගන්න සමහරු ලෙඩ රෝගවල ගොදුරක් වුණේ පරිසරය මවපු සරදමකට නම් නෙවෙයි. බටහිර කෑම විලාසිතාවන් තම ජීවන රටාවේ අනිවාර්ය අංගයක් බවට පත්කර ගත් බොහෝ දෙනා ජීවිතය ගෙවා දමන්නේ රෝහල්හි ඇඳන් මත හුස්මට පොරබදිමින් ය. එහෙමත් නැත්තම් අල්ල පිරෙන්න තරම් වන බෙහෙත් පෙති සමගය. යහපත් ජීවන රටාවක් ගෙවා දැමීමට අවැසි සමබල ආහාර රටාවක් ලොව කිසිදු රටක නොපවතින බවත්, ලංකාව සතුව ම පවත්නා බවත් අවිවාදයෙන් පිළිගත යුතු කරුණකි. ලංකාව කුඩා දිවයිනක් වුවත් පිටරටියන්ගේ බඩේගින්න පවා නිවන්නට සමත් උතුම් ජාතියකි. එවන් ජාතියක පරිහානිය වචනෙන් කීමට පවා නොහැකි වීම නෙතට කඳුළු ගෙන එන්නක් නොවෙ ද?

ලාංකේය සංස්කෘතිය අතැර දමා වෙනත් සංස්කෘතීන්ගේ පහස සොයා යන්නට වූ බහුතරය ජීවිතය විඳින්නට වූයේ නැත. ජීවිතය විඳිනවා යැයි සිතුව ද සැබැවින් ම වූයේ එය කෙටි කලකට සීමා වීම පමණි. අප අපේ සංස්කෘතිය අගය කළ යුතුය. පර සංස්කෘතීන් කාවද්දා ගනී නම්, අපේ සංස්කෘතිය රැකගෙන එය කළ යුතුය. විදෙස් සංස්කෘතීන් දෝතින් වැළඳගත් බොහෝ අයට තම මව පියා හා ළබැඳියන් පවා අමතක වන්නට ගත වූයේ ක්ෂණයකි. අපේ සංස්කෘතියට වින කෙටූ විදෙස් සංස්කෘතීන් යළි හිස ඔසවන්නට නොහැකි සේ මුලින් කටුගා දැමීම දැන්වත් කළ යුතු නොවේ ද? ලාංකේය සංස්කෘතිය රැකගත යුතු නම් විදෙස් සංස්කෘතීන්ගේ නැකමට තිත තියන්නට සුදුසු ම කාලයයි මේ.

**සඳුනි අරවින්දිනී**

# සාරධර්ම සුරකිමු

දිනෙන් දින සිදුවන තාක්ෂණික වර්ධනයත් සමග සාරධර්ම කියන්නේ මොනවාද යන්න නොදන්නා තරමට අද සමාජය විකෘති වී ඇත. සාරධර්ම සමාජයෙන් පිරිහී ඇත. පුද්ගලයකුගේ කතා විලාසය, ක්‍රියා කලාපය හා හැසිරීම් රටාව යන සෑම දෙයක්ම සාරධර්ම හා බැඳී පවතී. සමාජයේ යහපත් පුරවැසියකු ලෙස ජීවත්වීමට සාරධර්ම අත්‍යවශ්‍යය. මුලින්ම සාරධර්ම ඉගෙන ගන්නේ තම පවුලෙනි. වැඩිහිටියන්ට ගරු කිරීම, හොඳ වචන කතා කිරීම, යහපත් දේ සිදු කිරීම, අවංකකම, ඉවසීම, කරුණාව හා දයාව ආදියෙන් පවුල තුළින් වර්ධනය කරගනියි. එමෙන්ම සමාජයේ සම්බන්ධතා සමග ඒවා තවත් වර්ධනයට මෙන්ම පිරිහීමට ඉඩ ඇත.

එනම් සමාජයේ ඇසුරු කරන සමවයස් කණ්ඩායම්, මිත්‍රයන් හා අයහපත් පුද්ගලයින් අනුව එය වෙනස් වනු ඇත. සාරධර්ම ගොඩනැගීමට හොඳම ස්ථානය පාසල වේ. මෙහිදී ගුරුවරයකු, පාසල් ශිෂ්‍යයකු හා ශිෂ්‍යයන්ගේ දෙමව්පියන් ලෙස ගිලිහි යන සාරධර්ම නැවත ගොඩනැගීමට දායක විය හැක. සාරධර්මවලට දරුවාව පුරුදු කරවන්න ඔවුන් කුඩා කළ සිටම දෙමව්පියන් වගකීම ගත යුතුය. පාසලෙනුත් දහම්පාසලෙනුත් යහපත් ගුණාංග දරුවාට පුරුදු කළ යුතුය. වර්තමානයේ ළමයින් ඉගෙනීමට උපන් හපන් ඇති වුවද සාරධර්ම අතින් දුර්වලය. මනුස්සකම් නැත. අනෙකාට වඩා තරගකාරීත්වය අබිබවා යෑම අරමුණ වී ඇත. සාරධර්ම පිරිහිමට ජනමාධ්‍ය ප්‍රධාන හේතුවකි. රූපවාහිනියේ විකාශය වන මෙගා ටෙලි නාට්‍යයද සාරධර්ම කෙරෙහි බලපෑම් කරයි. ජනමාධ්‍යයන් දිනෙන් දින තරගකාරී වන මොහොතක එයින් යහපත් දෙයක් සමාජයට දායාද නොකෙරෙයි. දෙමව්පියන් වශයෙන් දරුවාට, පවුලේ සාමාජිකයන්ට උචිත වැඩසටහන් නැරඹීමට තෝරා ගත යුතුය. එමෙන්ම රූපවාහිනී තිරය තුළින් වෙනත් සංස්කෘතීන් නිරූපණය කිරීමේදී අප සංස්කෘතිය පිරිහී යනු ඇත. අප සංස්කෘතිය බිහි වී ඇත්තේ සාරධර්මවලට අනුකූලවය.



කොරෝනා වසංගතය හමුවේ ළමා පරපුර, තරුණ පරපුර නිරන්තරයෙන් ජංගම දුරකථනය හරහා අධ්‍යාපන කටයුතු ,රැකියා කටයුතු සිදු කළේය. මෙහිදී සිදුවන්නේ සමාජයෙන් පවුලෙන් දරුවා, තරුණයන් දුරස් කිරීමයි. සාරධර්ම පිරිහීමට මෙයද හේතුවක් වේ. රටක් ජාතියක් ආගමක් ලෙස සාරධර්ම නැවත ගොඩ නගා ගැනීමට අප එකතු විය යුතුය. වර්තමානයේ වැඩිහිටි නිවාස ඉදිවීමටත්, සිරගෙවල්වල වැරදිකරුවන් වැඩි වීමටත් සහ මත්ද්‍රව්‍ය පානයට ඇබ්බැහි වීම් සිදුව ඇත්තේ නිසි සාරධර්මයන් රට තුළ නොමැති බැවිනි. අනෙකාට වඩා තමන් ඉදිරියට යන්න සිහින දකින ලෝකයක සාරධර්ම යනු නොවටිනා වචනයක් වී හමාරය. එළැඹෙන අවුරුද්ද උදා වේ ද වැඩිහිටියන්ට බුලත් දී වැඳ නමස්කාර කර පවුලේ සමාජයේ නැතිවී ගිය සබඳතා වර්ධනයට, සාරධර්මයන් නැවත යථා තත්ත්වයට වඩවා ගන්න උත්සාහ ගනිමු. පුද්ගලයෙක් සාරධර්ම , උගත්කමින් පරිපූර්ණ වූ කල ඔහු තුළ ඉතා වටිනාකමක් ඇත්තේය. රටක් සංවර්ධනයට භෞතික පරිසරය පමණක් නොව ජීවත්වන මිනිසුන්ගේ හැදියාව, සාරධර්මද ඉවහල්වනු ඇත.

**පී.ජී.එම්. දිලංකා විජේරත්න**



# කෙටි කතාව

# එක්තරා පියෙක්

ගුණපාල වැඩිහිටි නිවාසයට ඇවිත් දැන් සෑහෙන කාලයක්. ඒ වයස අවුරුදු හැත්තෑව වෙනවාත් එක්කය. ආණ්ඩුවේ ලොකු රස්සාවක් කරන ලොකු පුතා එයාගේ වාහනයෙන්ම ඔහුත් එක්ක මේ වැඩිහිටි නිවාසයට එනතෙක් ඒ බවක් ගුණපාල දැන සිටියේ නෑ. ඒ සිද්ධිය වෙලත් දැන් අවුරුදු පහකටත් වැඩියි. තවමත් කිසිදු දරුවෙක් වැඩිහිටි නිවාසයේ සිටින ගුණපාල බැලීමටවත් ආවේ නැති බව දැනෙන විට ඔහුට ඇතිවන්නේ මහත් දුකක්.සුමනා නැතිවෙලාත් දැන් අවුරුදු දහයක් පහළොවක් විතර ඇති. ඒ ඔහුගේ බිරිඳය. එයා මැරෙන කොට ලොකු ළමයා විශ්වවිද්‍යාලයේ. ඔහුගේ මතකයේ නිමක් නැතිව දිගහැරෙන්නේ අතීතයේ මතක සටහන්ය.

වැඩිහිටි නිවාසයේ ස්තෝප්පුවේ තබා ඇති ඇඳි පුටුවක හරිබරි ගැහී බුදුගේ දිහා බලාගන ගුණපාල ඉඳගත්තේ උදේ කෑම අහවර වනවාත් එක්කම වාගේය. දිවියේ සැදෑසමයේ මෙහි සිටින වැඩිහිටි පිරිස කිසිවකුගේ හව්හරණයක් නැති උදවිය වෙන්නැති.මොවුන් මේ ඇවිදින්නේ මරණය එනතෙක් නොවේදැයි ඔහුට හිතුනි. තමාද එවැන්නෙක්යැයි සිතෙන විට ගුණපාලගේ හිතට දැනුනේ දුක්මුසු සතුටකි.

සුමනා නැතිවූදා සිට දරුවන් හදාවඩා ගන්ට ඔහු මුහුණ දුන්හැටි එකිනෙක පෙළට මතක්වූයේ හරියට චිත්‍ර පටයක රූපරාමු එකිනෙක පසුකරගෙන යන්නාක් වාගේය. ලොකු පුතා විශ්වවිද්‍යාලයේ අවසාන අවුරුද්දේ ඉන්නකොට තමයි පොඩි පුතාත් විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු අංශයට ගියේ.

ඒවනවිටත් ලොකුදුව හිමාලි හිටියේ විශ්වවිද්‍යාලයේ. අනෙත් දුව නිමාලි හෙදිවිදුහලේ. දැන් ඔවුන් ඔක්කොම විවාහවෙලා දරුමල්ලොත් ඉන්නවා. ඒ අය බැඳිලා තියෙන්නේ ලොකු පොහොසත් පවුල්වලට. වැඩිහිටි නිවාසේ එකාදෙන්නා ඒමේ අත යන්නේ මොනවා හරි තමතමන්ගේ වැඩවලට වෙන්න ඇති.එක කාන්තාවක් මල් දෙකතුනක් අරගෙන බුදුගේ දිහාවට යනවා දැක්ක ගුණපාල ඒ දිහා ටික වේලාවක් බලා සිටියේ ඇය ජීවිතයේ මඳ හෝ සැනසිල්ලක් ලබන්නට යන්නේයැයි සිතාය.

"මොකද ගුණපාල සීයා අද පැත්තකටවෙලා." එහෙම කියමින් වැඩිහිටි නිවාසේ මැඩම් මා ළඟින් ගියේ ඔෆීස් කාමරේ දිහාටය.

ගුණපාලට දිග හුස්මක් පිටවුණා. නැවතත් ඔහුගේ හිත දුවගියේ සිය යටගියාව හොයාගෙනය.කන්තෝරුවක පියන් කෙනෙක්වු ඔහුට එදා හම්බවුණ සොච්චම් පඩියෙන් ගෙදරදොරේ මෙන්ම දරුමල්ලන්ගේ වැඩ සියල්ල කළේ කොහොමදැයි ඔහුගේ හිතට නැඟුනේ ඉබේටම වාගේය.කිසිදු රැකියාවක් නොකළ සුමනා ඒ පඩිය අරපිරිමැස්මෙන් වියදම් කළ හැටි සිතෙනවිට ඔහුට දැනුනේ වේදනාවක්. දැන් සුමනා තමා ළඟ නොමැති හින්දා මෙවැනි ඉරණමකට මුහුණ දෙන්නට සිදුවුණේයැයි ගුණපාලට හැඟුණි.

සුමනා නැති නිසා ගුණපාලට මුලදී තනිකමක් දැනුනත් දරුවන් නිසා තරමක් හෝ එය මග හැරේවියැයි ඔහු හිතුවාර අනන්තයි. නමුත් එම තත්ත්වය පෙරට වඩා වැඩිවූයේ ලොකු පුතාගේ ගෙදර නැවතීමෙන් පසුවයි. ලොකුපුතා විවාහවී සිටියේ ලොකු පවුලකින්. දොස්තර නෝනා කෙනෙක් එක්ක.

අවුරුදු හැටේදි විශ්‍රාම ගිය ගුණපාල පුරා අවුරුදු දහයකට වැඩිකාලයක් හිටියේ ලොකු පුතාගේ ගෙදරයි. හැබැයි ලොකු පුතා ගුණපාලට ඉන්ට ඉඩදුන්නේ ගෙයි කුස්සියට යාබද කුඩා කාමරයයි. නමුත් ඔහු ඒගැන එතරම් දුරට හිතුවේ නෑ. ඔහුට ලැබෙන විශ්‍රාම වැටුප සිය අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම වෙනුවෙන් වැයකළ හෙතෙම කිසිවකුටත් කරදර නොකිරීමටද වගබලා ගත්තේය. ලොකු පුතාගෙයි ලේලිගෙයි ලොකු ලොකු යාළුවෝ එනවිට දිරාගිය මිනිස් කයක් ගෙය ඉස්සරහ තියෙන එක මහ මූසලකමක්. ගුණපාලට මේ කාමරේ ඉන්ට කියා ලොකු පුතා කිව්වේ ඒ නිසා වෙන්ට ඇතැයි ඔහුට වරින්වර සිතුණි. ඒකත් එක අතකින් ඇත්ත. ජීවිතේටම සරමක් කමිසයක් අඳින තමා වැන්නන් කලිසංකෝට්කාරයෝ ඉස්සරහ මොන නින්දාවක්ද. එහෙම සිතූ ගුණපාල එවැනි අවස්ථාවන්හිදි කාමරය ඇතුළට ඇවිත් දොරවසාගත් හැටි ඔහුගේ මතකයට ආවේ ඉබේටමය.

"ගෙදර නිකං ඉන්න එකේ ඔය මිදුල එහෙම අතුගාලා දානවා.ගේ ඇතුළෙත් අපේ කාමරය නැතිව ඉතිරි හරිය අතුගාන්ට පුළුවන්." ලොකු පුතාගේ නෝනා දොස්තර නෝනා එහෙම කිව්වේ ගුණපාල ඉන්න කාමරේ ලඟ තියෙන බාත්රූම් එකට යන ගමන්.එදා සිට ගුණපාලගේ දින චරියාවට මිදුල හා ගේ අතුගෑමද එක් වුණා. රාජකාරියේ යෙදී සිටියදි නෑ බෑ නොකියා අණට කීකරුව වැඩකිරීම ඔහුගේ රැකියාවේ හැටියි. ඒ හින්දා ගුණපාල මිදුල අතුගෑම පටන් ගත්තේ එළිවෙන කොටමය. දිනක් මිදුල අතුගාන දිහා ලොකු පුතා බලා ඉන්නවා ගුණපාල දැක්කා. එතකොටම ඒක නොදැක්කාසේ ලොකුපුතා ගේ ඇතුළට ගියේ ගෙදර නතරවී හිටිය ලේලියගේ තාත්තාට තේ එක රැගෙනය. දොස්තර නෝනාගේ තාත්තා ගුණපාලට නම කියා කථා කළත් ඔහු කථා කලේ මහත්තයා කියාය.

මේ අතරවාරයේ දිනක් බැංකුවේ ලොකු මහත්තයකුවූ ගුණපාලගේ දෙවන පුතා ඔහුගේ නීතිඥනෝනා එක්ක ආවේ කාරයෙන්. ඔවුන්ගේ දරුවන් දෙන්නාද ඒත් එක්ක ඇවිත් ඉන්නවා ගුණපාල දුටුවා. ඔවුන් එනවා දැක්ක ගුණපාල ඔහුගේ කාමරයට ගොස් දොර වසාගත්තේ තමන් දැකීම ඔවුන්ට අප්‍රසන්න දසුනක් නිසාය. දෙවන පුතාද දැක්කේ අවුරුදු ගාණකට පස්සේ බව ගුණපාලට මතක්වුණා. නමුත් පුතා තමන් නොදැකීම ඔහුට සහනයක් බව දැනුණි.

ඔවුන් ගෙට ගොඩවෙනවාත් සමගම ගේ තුළ දෝංකාරවූයේ සතුටු සිනාය.ඒ ඔවුන් පිළිගන්නවා වෙන්නට ඇතැයි ගුණපාලට සිතුණි.

"එදා නිවාඩු දිනයක්වූ බැවින් දහවලට කෑම කා දෙවන පුතා දරුපවුලත් එක්ක ආපහු ගියේ තමා ගැන කිසිවක් නොවිමසා වෙන්ට ඇති "පිටවූ හුස්මත් සමගම ගුණපාලට කාමරයේ පුංචි ජනේලයෙන් අහස දිහා බැලුනේ ඉබේටම.නාටු කුරුල්ලෙක් අත්තක් අයිනේ වහලා. යන්ට තැනක් නැතිව වෙන්ට ඇති."

දවසක්දා ලොකු පුතා ගුණපාලගේ කාමරයට ඇවිත් තාත්තා කීවේ හෙම්හිටය. අවුරුදු ගාණකට පස්සේ ලොකු පුතා තමාට තාත්තා කියා කථා කළේ ඇයිදැයි ගුණපාලට ඇති වූයේ මහත් පුදුමයකි. "අපි අවුරුදු දෙකකට විතර රට යනවා.සමහර විට ඒ ගමන අවුරුදු තුනහතරක් වෙන්ටත් පුළුවන්.අපි යන්නේ මේ ගෙදර වහලා දාලා. අපි එනකං තාත්තා ආරක්ෂා ඇතිව හොඳට සලකන තැනක හිටවලයි යන්නේ. ආපු ගමන්ම ආපහු මම ඉන්න තැනට ගන්නවායැයි " ඔහු එක දිගට කියාගන ගියේය.

ගුණපාල කිසිවක් කියාගත නොහැකිව නිහඬවුණා. ටික වේලාවක් එහෙම හිටිය ඔහු පුතාගෙන් බයාදු ලෙස ඇහැව්වේ නතරවන තැන කොහේද කියාය. විශ්‍රාම පඩියක් ලබන ඔහුට එය වියපැහැදම් කරගන කොහේ හෝ නතරවිය හැකි බව කීමට ගුණපාලගේ සිතට ආවත් ඒකිසිවක් නොකීමට ඔහු සිතුවේය.

" අපි එහෙනම් හෙට යමු කියමින් " ලොකු පුතා කාමරයෙන් පිටවූ හැටි ගුණපාලට තවමත් මැවි පෙනෙන්නට විය.

ලොකු පුතාගේ බිරිඳ ගුණපාලට නිතරම කෙනහිලිකම් කළත් ඔහු ඒකිසිවක් සිය ලොකු පුතාට නොකීවේ ඔවුන් අතර විරසකයක් ඇතිවේයැයි හිතාගනය. ලොකු පුතා තමාට මේ යෝජනාව කළේ ලේලිගේ ඉගැන්වීම නිසා බවට සැකසිතූ ඔහුට තවත් දෙයක් වීමට පෙර මෙතනින් යායුතුයැයි සිතුනේය.

එදින රාත්‍රී තමා සන්තකයේ තිබු පරණ



සරංදෙක හා කමිස දෙකද මල්ලක දමාගත් ගුණපාල පැන්ෂන් කාඩ්පත සුරැකිව තබා ගැනීමට සිතුවේය.ඒත් ඒ එක්කම හැමදා රෑ නින්දට යන්ට පෙර කියවන පිරිත් පොතද ඔහු මල්ලට දමාගත්තේ වටිනා භාණ්ඩයක් වාගේය.

ලොකු පුතා කී පරිදි පසුදා ගුණපාල ඔහුගේ වාහනයට නංවා ගන්නාවිට ගෙදර කිසිවෙකු දක්නට හිටියේ නැත. වෙනදා පුතා තනියම ගමනක් යනවිට එළියට එන දොස්තර නෝනා අද පේනතෙක් මානයේවත් ඔහු නොදුටුවේය.

මෙසේ පැය තුනක පමණ කාලයක් ගමන් කළ වාහනය ගේට්ටුවකින් ඇතුල්කර එක්තරා ගොඩනැගිල්ලක් ළඟ නතර කළ පුතා එයින් බැස පිටුපස දොර ඇරියේ ගුණපාලට බැසීමටය. ඒත් එක්කම වටපිට බලමින් ගුණපාල ඇඟට තුරුල් කරගන හිටිය මල්ලද ගෙන බිමට බැස්සේ අලුත් නවාතැනකටය.

"මෙයාද කිව්වේ" වාහනය නතර කරන විට එතනට ඇවිත් ඇසු කලිසංකාරයකු ගුණපාල දෙස බැලු අයුරු තවමත් ඔහුට හොඳහැටි මතකය.

"එහෙනම් මේ මහත්තයා එක්ක යන්න. " කියා ලොකු පුතා ගිය ආකාරය දැනුදු ඔහුට මතක්වන විට ඇතිවන්නේ දරාගත නොහැකි දුකකි.අනේ සුමනා හිටියනං මට මෙහෙම දෙයක් වන්නේ නෑ. ගුණපාල අර මහත්තයාට කීකරු විය.

"සීයාගේ නම ගුණපාල කිව්වානේද?." ඒ අර මහත්තයාගේ කටහඬය.

" ඔව් මහත්තයෝ"

"ඔය මහත්තයා ළඟ වැඩට ඇවිල්ලා හුගක් කල්ද?"

"වැඩට" මඳක් නිහඬවී සිටි ගුණපාලට සිතුනේ අනුමානයක් නෑ තමා ඒ ගෙදර වැඩකාරයෙක් බව ලොකු පුතා කියන්ට ඇත කියාය. ගුණපාල මඳක් සිනාසි බිම බලාගත්තේය. ඒ මහත්තයාටද යමක් තේරුනා විය හැකියි. ඔහුද නිහඬවූයේ ඒනිසා වෙන්ට ඇති. වැඩිහිටි නිවාසේ දහවල් දෙළහේ සීනුව නාදවීමත් එක්කම සියල්ලෝම කෑම ශාලාව වෙත හෙමින් හෙමින් යන්ට පටන් ගත්තා. ගුණපාලද උදේ කෑමෙන් පසු ඉඳගෙනසිටි තැනින් හෙමින් නැගිට අවසානයේ ඔවුන්ට එක්විය.

වෙනදාවාගේ එදත් පුරුදු පරිදි තමන්ට නියමිත අසුනෙහි වාඩිගත් සියලු වැඩිහිටියෝ සිය හිස් පිඟන් ඉදිරියේ මේසය මත තබාගන බත්බෙදන තෙක් බලාගන සිටින්නට විය. එවිටම වැඩිහිටි නිවාසෙහි මැඩම් එතනට පැමිණ පැවසුවේ අද දානය මෙහෙ රෝහල් කාර්ය මණ්ඩලය විසින් දෙන බැවින් සියලු දෙනාම ඔවුනට පිංඅනුමෝදන් කළයුතු බවය.

මෙහිදි රෝහල් වෛද්‍යවරුන් මෙන්ම සේවක සේවිකාවන්ද වැඩිහිටි නිවසේ යිටි නේවාසිකයන්ට දානය බෙදාදීමට පටන්ගත් අතර අඩුපාඩු බෙදාදීමටද ඔවුන් යුහුසුලු විය.

"සීයාට තව බත්ටිකක් දෙන්නද?" ගුණපාල ළඟට ඇවිත් ඇසු හෙදියගේ ඒ කටහඬ ඔහුට හොඳට හුරුපුරුදුය. රැවුල හා කොණ්ඩයද වවාගන දිරාගිය සිරුරකින් යුතු තමන් හඳුනාගැනීමද කිසිවෙකුටත් එතරම් පහසු නොවන බව ඔහුට සිතුණි. එබැවින් ඒ ගැහැනු කටහඬින් ඔහු හිස ඔසවා ඒදෙස බැලීය. ගුණපාලට අදහාගත නොහැකි විය.දෙවියනේ මේ මගේ නිමාලි නර්ස් දුවනේද?. ඔහු ආයාසයෙන් ඒවචන ටික පිට නොකර දෑසට ඉනු කඳුළු වම් අතින් පිසදාගත්තා. .

ගුණපාලට දැනුණේ කටට ගත් බත් ගුලිය උගුරේ හිරවෙන්නාක් වාගේය. ඔහුට ඒ සමගම කැස්සක් ඇතිවූයෙන් වැරෙන් අතින් පපුව තදකර ගත්තේය.

ඒ මොහොතේ වහා එතනට දුවගෙන පැමිණි හෙදියක් මේ වතුර උගුර බොන්නයැයි ඔහුගේ කට ළඟට වීදුරුව කිට්ටු කළාය. මොහොතකින් ගුණපාලගේ කෙඳිරියද මිලිනවෙමින් යන සේයාවක් දැනුණි. සියල්ලෝම බියට පත්ව එතන තිබු වාහනයකින් ඔහු රෝහලට ගෙනගොස් සුළු වේලාවකින් නැවතත් ගුණපාල දැස ඇර ආයාසයෙන් වටපිට බලා දෙනෙත් පියාගත්තේ සදහටමය.

එතන සිටි හෙදියක් ඩොක්ටර් ඩොක්ටර් කියා කෑගසන විට වහා පැමිණි වෛද්‍යවරයකු ඔහුගේ සිරුර බලා ගුණපාල මොහොතකට පෙර මියගොස් ඇති බව පැවසීය.

**ඒ.ඒ.එල්. ඩයස්**

## ඉතින් ඒ ප්‍රේමයේ හැටි......

එකමත් එක සිසිරයක
සීතල හිතක් ගැන ලිවුවම
නුඹ හැරෙන තැපෑලෙන්
මට වසන්තය එවූ හැටි...!

ඒ ගෙනත් දුන්නේ
අවසාන වසන්තය බව
නුඹ දැනන් උන්නට
මට ඒක
නොදැනුණු හැටි...!

තාරකා එකක්වත් නැති බව
අහස දිවුරා කී පසුත්
කවුලුව වසා ගන්නට
මට හිත් නොදෙන හැටි...!

මේ සුසුම් ළසොවින්
නුඹ ළඟත් ගැවසෙනවැති
පෙණහලු තාම
මං අඳුරනව ඇති...!

"ලංකාව පුංචි රටක්"
නුඹ එදා කිවු බව
මට
අමතක වෙන්නෙ නැති හැටි...!

**උදේශිකා හේරත්**

## මිය යන්ට කලින් අසමි

හම රැලි වැටී වත මිලින වී වැහැරී ගොසින් ඇති සිරුර සමඟින්
මම වැතිරෙමී උඩුකුරුව සයනේ ගෙන යන්ට මරු එයි කියා සිතමින්
පෙම හැංගුනේ ඔබ සමඟමයි මගේ හිත් පතුල තුළ යළිත් නොඑමින්
එම දවසෙමයි මා මියගියේ වෙන කිසිවෙකුගේ දන් නෑ ඉතින්

සැරයටිය වාරුගෙන හෙමින් ඇවිදිමු පෙර මතක සිහිකර සිනාවෙන්
ඔබ කිව්දිය මට සිහිව තෙත්වුණි දුරුවලව ගිය දෑස කඳුලින්
එන බවය දිත් අපි අපේ වීලා දෙදෙන ඉපදෙමු සපළ කරමින්
මැදි වියට එන්නත් කලින් ඔබ ගියෙ මෙමා තනි කර දමා තරහින්

දැනුනා හොඳින් මට ගෙදර අග හිඟ ඒ නිසයි මම ගියේ වැඩකට
හිතුනා එදත් ඇයි නොකිවුවේ ඔබ ගෙදර හිටපන් කියා මාහට
හුරුවුණා යකඩින් තැනූ ආයුධ සුමට දෑතින් පිරි යෑමට
ගොර හැඬි වුණා අත වගෙම ගත සිත හිතුනෙ මට ඔබ මොටද යහනට

සොඳුරු සමනල වියෙදි පමණ ද පෙමට හිත්වල තෙතක් ඇත්තේ
බඹරු එන්නැති මිලින වන මල් හැලෙන විට ඇයි දුකක් නැත්තේ
පුපුරු ගසනා හිතින් හඬනා මං වගේ තව ළඳුන් ඇත්තේ
ගොදුරු පමණ ද පිරිමි ඇඟකට කරුමයට ඇයි ඇහැක් නැත්තේ

**කමනී ඩයස්**

## ප්‍රගති සමාලෝචනය දා

ඔබ එදා මා දෑස් කොනින්
දෙව් ලියක මෙන් පා තබා
දියව යන තෙක් ම
සඳළු තල යහනේ
බලා සිටියෙමි

ඊ තණ ගසින් වැසුණු ඒ පාර දිග
ඇත් ගමනින් සැලෙන නිතඹට
විල්ලු ද වන් දෙපා හඬට
ඉඟි බිඟි පෑ කොවුල් හඬ
මා දෙසවන් කන්කළු කළ අපූරුව

කුඩා දාස් පෙතියා මල් කෙමියක
මකරන්දයක් හෙම්හිට ඇහැරී
හිස ඔසවන්නට දරන තැත
ඒත් නුඹ ඇහැරෙන්නට නම් එපා
ලොවට පෙනෙන්නට
අවජාතක පුතෙකු සේ
හංවඩු ගසයි උන්
උකුසු ඇස් හෙළයි ඒ දෙස
මකුළු දැල් බැඳෙයි අප යනෙන මග

ඉනික්බිති මා එදා
ඇස් කොනින් නුඹ පිසදා
සුපුරුදු පියවි ලොවට
පිවිසුනෙමි මයාකාරී
ඒ සම්මත සොඳුරු ලොවට

**සංජය ප්‍රියදර්ශන**



ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න
'යොවුන් ජනතා', දිනමිණ
අංක 35, ලේක්හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
younjanatha@lakehouse.lk

## පෙම් කරනු කෙලෙසේ....?

එකම නුවරට දෙපාරක්
යන්න බෑ මැණිකේ...
එකම වැස්සට දෙපාරක්
තෙමෙනු බෑ මැණිකේ...
මතක කුඩයට මුවා වී
තුරුලු වී පෙරසේ...
එකම හදකට දෙපාරක්
පෙම් කරනු කෙලෙසේ

**රවීන්ද්‍ර ලක්මාල් දයාවංශ**

## අම්මා

දැල් ගහපු වීදුරුව
නිල් පාට බස් එක...
මං එද්දී හැමදාම
යට ගිලුණු ඇස් දෙක...
සිල් ගන්න සුදු රෙද්ද
සන්තකව තිබුණ එක...
උසාවිය ළඟ අම්මා
ගිනි ගහන අවුවක...

අංගුලිමාලටත් නිවන නැහැ
උනේ දුර...
දැවෙනවා නුඹේ ඇස් පෙනි පෙනී
දහස් වර...
උසාවියේ කොනක නුඹ ඉද්දි
උස්සගෙන කර...
ලැබෙන දඬුවම නෙමෙයි අම්මෙ
මගෙ හිතට බර...

කළුවරම හුරු වෙච්ච
ඇස් අන්ධකාරේ...
හීන නොදකින දෙනෙත්
සැනසුම අවාරේ...
නුඹ වින්ද දුක් මහමෙරක්
නොනිමි කතරේ...
බුදු වෙයන් අම්මෙ
පුතු නොවෙමි සංසාරේ...

**පුෂ්පශාන්ත සමරනායක**

මතකයන් සුළඟක් ය
නිරන්තර ළඟ රැඳෙන
ජීවිතය ගමනක් ය
නැවත අප මුණ ගැහෙන...

**තත්සරණී කාරියවසම්**

## නුඹ

පැලින් යන්තම් හිරු මියැදෙද්දී
කඳුලක් මීදුම් කුසුමේ තැවරේ
මිලින පිච්ච මල් පාට වැටී
මගේ පැලේ නුඹ ගිමන් හරී

අහස අතහැර රැය නොයන කල
කළුවරට ඉඩ ඒ තරම් නැත
මැදියමේ මිහිදන්ව මතකය
මොහොතකට නුඹ මා දෑස් ළඟ

සඳත් වියැකී අමාවක අද
රැයට තිබුණේ අඳුර තරු යට
නිශා ඉම අග වැස්ස පමණයි
දෑස් ළඟ මුත් නුඹ හුඟක් දුර

**බී. පී ගුණරත්න**

# අන්තර්ජාලය හා කොට උඩ යන ළමා පරපුර

**තාක්ෂණික වශයෙන් දියුණුවූත්, නවීකරණයවූත් වත්මන් ලොව තුළ දැනුම වූ කලී සීඝ්‍රයෙන් පුළුල් වන විෂයකි. ඒ අතර මිනිසාගේ සන්නිවේදනය ද නව මංපෙත් විවර කරමින් ඉදිරියට පැමිණ ඇති බැව් නොරහසකි. සන්නිවේදනයේ හා තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ ලොවට දායාද වූ ප්‍රධානතම මෙවලමක් ලෙස අන්තර්ජාලය හඳුනාගත හැකිය. මෙකී දිනෙන් දින දියුණු වන තාක්ෂණය හමුවේ අන්තර්ජාලය තුළ සක්‍රීය කොටස්කරුවන් බවට පත්ව ඇත්තේ අපගේ ළමා පරපුරයි.**

නවීන දැනුම, කුසලතා වර්ධනය කිරීම, සන්නිවේදන කාර්යයන් පහසුකිරීම, අන්තර්ජාතික සබඳතා වර්ධනය කිරීම ආදී බොහෝ ප්‍රතිලාභ දෙන්නා වූ අන්තර්ජාලය තුළින් නූතන ළමයා නව තාක්ෂණය හා බැඳේ. අද වන විට ගසට පොත්ත මෙන් බැඳීමක් අන්තර්ජාලය හා ළමා පරපුර අතර පවතී. නමුදු අවාසනාවන්ත කරුණ නම් මෙම අන්තර්ජාල බැඳීම හමුවේ වත්මන් ළමා පරපුර විනාශයන්ට අත වනමින් පැවතීමයි. ස්මාර්ට් දුරකතනයක්, ලැප්ටොප් පරිගණකයක් තුළින් අන්තර්ජාලයට සම්බන්ධ වන ළමයා අද එහි ජීවත් වෙමින් ඒ තුළට ඇබ්බැහි වී ඇත. මෙසේ ගොඩනැගෙන ස්මාර්ට් ළමයා සියලු නවීන දැනුමින් පෝෂණය වුවත්, ඔවුන් තුළින් දෙමාපිය වැඩිහිටි සබඳතා දිනෙන් දින වියැකී ගොස් තම තමන්ගේ ස්මාර්ට් ලෝකයන්හි ජීවත් වීමට උත්සාහ දරයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වත්මන් ළමා පරපුර විවිධ අතහදා බැලීම්, ඇබ්බැහිවීම්, ලිංගික අපයෝජනයන්ට යොමුවීම්, සොරකම් කිරීම්, මනස විකෘති වීම් ආදීන්ට නිතැතින්ම යොමු වේ.

වත්මන් ලාංකීය ජන සමාජය දෙස අවධානය යොමු කිරීමේදී ෆේස්බුක්, ටුවිටර්, ස්කයිප්, ඉන්ස්ටර්ග්‍රෑම් ආදී සමාජ ජාල වෙබ් අඩවි තුළ ළමයින් බහුලව සැරිසරන තැනක් බවට පත් වී හමාරය. එමෙන්ම අද කුඩා දරුවන් අත පවා ජංගම දුරකතනයක් පවතී. මෙවන් වූ වපසරියක් තුළ වත්මන් ළමයා විනාශයන්ට ළං වන්නේ නිතැතිනි. ඒ අනුව අන්තර්ජාල අපයෝජන අද දිනෙන් දින ඉහළ යන අතර මත්ද්‍රව්‍ය, මත්පැන් ආදී විවිධ ඇබ්බැහිවීම්වලට මෙන්ම විවිධ අත්හදා බැලීම්වලට ළමයින් යොමුවීම දිනෙන් දින ඉහළ යයි. අන්තර්ජාලයේ පවතින අයහපත් තත්ත්වයන් තුළින් ළමා මනස විකෘති වී අද තම මව පියා නොහඳුනන සමාජ ක්‍රමයක් බිහි වෙමින් පවතී.

දියුණු වන තාක්ෂණය හමුවේ අන්තර්ජාල ගැටලු ද දිනෙන් දින ඉහළ යයි. ඒ සඳහා ස්ථිර විසඳුමක් නොමැති අතර නව තාක්ෂණයන් හමුවේ වත්මන් ළමයින් ඒ පසුපස හඹා යන්නෝ වෙති. එහිදී ළමයා හා අන්තර්ජාලය වෙන් කර තැබීම වූ කලී අනුවණ ක්‍රියාවකි. මෙහිදී ළමයින් හට නව තාක්ෂණය හමුවේ ගැටීමට ඉඩ දී ඔවුන්ගේ දැනුම වර්ධනය කර ගැනීමට ඉඩ දිය යුතු වන්නේය. නමුදු එම මාර්ගයට ළමයා නිවැරදි ලෙස යොමු කිරීම අපගේ කාර්ය භාර්ය වන්නේය. ළමුන් හට අන්තර්ජාලය භාවිත කිරීමට දැනුම තිබුණ ද එය ආරක්ෂාකාරී ලෙස භාවිත කරන්නේ කෙසේද යන්න අප පසක් කළ යුතුමය. මාපියන් තම දරුවා හට නව තාක්ෂණය හමුවේ ගැටීමට ඉඩ දෙනවා සේම ඔවුන් හා සමීප සබඳතාවයන් පවත්වමින් නිතර නිතර තම දරුවා කෙරෙහි අවධානය යොමු කරමින් යහපත් වූ ආකල්ප, ගුණධර්ම දරුවා තුළ වැපිරීමට උත්සුකවීම තුළින් දරුවන් විනාශයන්ට අත වැනීම අවම කර ගත හැකිය. එමෙන්ම අන්තර්ජාල භාවිතයේ පවතින සෘණාත්මක පැති දරුවා හරි හැටි දැනුවත් කිරීම මෙන්ම එහි පවතින හොඳ නරක

තෝරා බේරා ගැනීම සඳහා දරුවන් පුහුණු කිරීම ද වැඩිහිටියන් වශයෙන් අප සිදු කළ යුතු වන්නේය.

**ශාමලිකා නිරෝෂණී**
**සන්නිවේදන හා කළමනාකරණ අධ්‍යයන පීඨය**
**නැගෙනහිර විශ්වවිද්‍යාලය,**



# Sex කියන්නේ Gender වලට ම ද?

**Sex එහෙම නැත්තම් ස්ත්‍රීපුරුෂ බව කියලා කියන්නේ ජීව විද්‍යාත්මක දෙයකටයි. මෙය උපතින් ම හිමිවන දෙයක්. අනන්‍යතාවයක්.ලිංග භේදය ලෙසද මෙය දැක්විය හැක. දරුවෙක් ඉපදුන විට ලිංග භේදය අනුව ගැහැනු පිරිමි ලෙස වෙන් කරයි. නමුත් පසුකාලීනව මතයක් වන්නේ ලිංගේන්ද්‍රය අනුව නොව සමාජයේ ජීවත්වන ආකාරය මත අනන්‍යතාව තීරණය වන බවයි.**

ස්ත්‍රී පුරුෂ බව මත පදනම් ව සමාජය විසින් ලබාදෙන අනන්‍යතාවය Gender ලෙස දැක්විය හැකිය.මෙය සමාජ සංස්කෘතික සාධකයකි. ජීව විද්‍යාත්මක නොවන අතර සමාජ සම්බන්ධතා නිසා සකස් වී ඇති සමාජ ලක්ෂණයකි.ස්ත්‍රිය හා පුරුෂයා අතර බල සබඳතා ස්ථාන ගත වී ඇති ආකාරය ස්ත්‍රී පුරුෂ සමාජභාවය ලෙස දක්වයි.ඕනෑම රටක Sex යන්න සමාන වන අතර ඔවුන්ට සමාජය තුළින් හිමිවන අනන්‍යතාව වෙනස් ය.පන්තිය කුලය, වර්ණය වැනි සාධක මත මෙම ස්ත්‍රී පුරුෂ සමාජ භාවය බැඳී ඇත.නිදසුන් ලෙස ගැහැනු දරුවකු වැඩිවියට පැමිණි පසු නීති රීති දැමීම, පිරිමින් ආශ්‍රය සීමා කරන ලෙස පැවසීම ආදිය සිදු වන්නේ ස ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසාය. දකුණු ආසියාතික රටවල තරමක් දැඩි ලෙසම මෙම අනන්‍යතාව දක්නට ලැබුණත් බටහිර රටවල මේ පිළිබඳ තැකීමක් නොකරයි. ස්ත්‍රීය පිරිමියා මෙන්ම උපරිම නිදහසක් භුක්ති විඳියි.



ස්ත්‍රිය යම් වපසරියකට සීමා කිරීම මේ තුළින් සිදුවේ. සමාජය තුළ කොල්ලා නාවලා ගෙට ගත්තම පිරිසුදුයි කියල කියන්නේ මේ අනන්‍යතාවේ නිසාය.සමාජය තුළින් ස්ත්‍රිය හා පිරිමියා කළ යුතු වැඩ බෙදා දෙයි. පිරිමියා කළ යුත්තේ මෙයයි,ස්ත්‍රී කළ යුත්තේ මෙයයි යනුවෙන් දක්වා ඇත. එම සීමාවෙන් පිට ගිය විට ඔහු හෝ ඇය දෙස බලන්නේ වපර ඇසිනි .ස්වාමියා විසින් බිරිඳට නිවසේ වැඩවලට උදවු කළ හොත් එය පිරිමියාගේ යටහත් පහත් බවක් ලෙස සමාජය දකී. ඒ ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසාය. පිරිමියා නිවසට මුදල් සොයා දීම කළ යුතුය.බිරිඳ නිවසේ මෙන්ම දරුවන්ගේ සේම, සැමියාගේ වැඩ කළ යුතුය. එහෙත් ඇය ගැන ඇගයීමක් නොකරයි.පිරිමියා කරන වැඩවලට වටිනාකමක් දෙයි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ කාන්තාවනට සිදුවන අසාධාරණය වැඩිය. ස්ත්‍රිය ලිංගික පීඩිතයා ය.හැඟීම්බර විය යුතුය. ලාමක විය යුතුය. ඉවසිලිවන්ත විය යුතුය. පුරුෂයා ලිංගිකප්‍රහාරකයාය. තාර්කිකයි.විශ්ලේෂණකාරයෙකි.ආවේගශීලි චරිතයකි. ඒ සමාජය දී ඇති අනන්‍යතාවයි. පුරුෂයාගේ පහසුව පිණිස තීරණ ගනියි.

“හා හා ඔයා ගෑනු ළමයෙක් නේද..ගස් නගින්නේ නෑ...”

“පිරිමි ළමයි එක්ක ඕනෑවට වඩා එපා..ඔයා දැන් ලොකු ළමයෙක්...”

මෙවැනි දේවල් අපට සමාජයේ ඕනෑ තරම් අසන්නට ලැබෙයි. එලෙස ගැහැනු දරුවන්ට යම් යම් සීමා පනවන්නේ සමාජය විසින් ඇයට දී ඇති අනන්‍යතාව නිසාය. නමුත් පිරිමියාට එලෙස පවසා නොමැත.

මේ කරුණු දෙස බලන විට අපට සනාථ වන්නේ Sex සහ Gender යනු ආකාර දෙකක් බවය. උපතින් ලිංග භේදය ලැබුණත් සමාජය තුළ ජීවත් වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මතය.

**සවින්ද්‍යා මධුෂාණී**
**කැලණිය විශ්වවිද්‍යාලය**

උසස් පෙළ අවසන් කර ප්‍රතිඵල ලැබෙනා තෙක් බලා සිටිනා ඇතැම් තරුණ තරුණියෝ තම කාලය නිකරුණේ නාස්ති කර ගනිති. ස්මාර්ට් දුරකතනවලට මෙන්ම පරිගණකවලට ද බෙහෙවින්ම ඇබ්බැහි වී ඇති තරුණ ප්‍රජාව එලෙස නිකරුණේ ගෙවා දමන්නේ තම අනාගතය තීරණය වන වටිනා කාලය බව නොදනිති. සමහරෙක් මව්පියන්ගේ ද පෙරැත්ත ඇතිව යම් පාඨමාලාවක් හැදෑරීමට උනන්දුවක් දක්වති. නමුත් ඒ වටිනා කාලය තුළ තමන්ගේම කියා කුඩා ව්‍යාපාරයක් ආරම්භ කර තවත් කිහිපදෙනකුට රැකියා අවස්ථා හිමි කර දීමට උත්සාහ ගන්නේ ඉන් ටික දෙනෙකි.



# සුද්දගේ ක්‍රීඩාවට පිති හදන අපේ කොල්ලෙක්

මිලින්ද ප්‍රසාද්

**නිපුණතා සංවර්ධන අරමුදලේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයන් බලගැන්වීමේ වැඩසටහනක් යටතේ ගම්පහ බුත්පිටිය ප්‍රදේශයේ ව්‍යවසායකයන් සොයා ගිය ක්ෂේත්‍ර චාරිකාවකදීයි මේ තරුණ ව්‍යවසායකයා හමුවන්නේ. ඔහු නමින් මිලින්ද ප්‍රසාද්ය. ගම්පහ තක්ෂිලා විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා 2019 වසරේ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිට ඉහළ සාමාර්ථයන් ලබාගෙන ඇති ඔහු සබරගමුව විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා, විද්‍යාව හා කළමනාකරණ පාඨමාලාවක් හැදෑරීමට සුදුසුකම් ලබා සිටී.**

මිලින්ද වර්තමාන තරුණ පරපුරටම ආදර්ශවත් සිසුවෙකි. බෙහෝවිට උසස් අධ්‍යාපනය නිමා කරනා තරුණ තරුණියෝ රජයෙන් රැකියාවක් ලැබෙනා තෙක් බලා සිටී. නමුත් මිලින්ද තම අධ්‍යාපන කටයුතු සිදු කරනා අතරතුර තමන්ගේම කුඩා ව්‍යාපාරයක් ආරම්භ කර තිබෙන්නේ සිය නිපුණත්වය උපයෝගී කරගෙනය.

ක්‍රිකට් යනු පිටරටින් අප රටට ලැබුණු ක්‍රීඩාවක් වුවද ඉන් නමක් දිනා ගැනීමට පුංචි අපේ රටට ගත වූයේ කෙටි කාලයකි. වර්තමානයේ පාසල් මට්ටමින් පවා ශිෂ්‍යයන් මෙන්ම ශිෂ්‍යාවන් ද ක්‍රිකට් ක්‍රීඩාවට දක්වන්නේ දැඩි කැමැත්තකි. ඒ හේතුවෙන්ම ක්‍රිකට් ගැසීමට අවශ්‍ය පිති අප පිටරටවලින් ගෙන්වීමට පුරුදුව සිටී. ඉන් අප රටේ මුදල් වැඩි වශයෙන් පිට රටට ගලා යෑමක් සිදු වන අතර අප රටේම සැහැල්ලු ක්‍රිකට් පිති නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට මිලින්ද තීරණය කරන්නේ ඒ හේතුවෙනි. පියා නොමැතිව තම මව සමඟ තනිව ජීවත් වන මිලින්ද මවට බරක් නොවී නිවෙසේ ආර්ථික තත්ත්වයට මෙන්ම තම ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය මුදල් උපයා ගන්නේ ද මේ කුඩා ව්‍යාපාරය මඟිනි. ඒ අනුව අධ්‍යාපනයට බාධාවක් නොවී රටට ද බරක් නොවී ජීවිතය ජය ගන්නට වෙර දරනා මිලින්ද වර්තමාන තරුණ තරුණියන්ට ආදර්ශයකි.

තම සැහැල්ලු පිති ව්‍යාපාරය පිළිබඳ 'දිනමිණ' යොවුන් ජනතා අතිරේකයට මිලින්ද මෙසේ අදහස් දක්වා සිටියේය.


"මම පාසල් කාලයේදී ක්‍රීඩාවට විශාල ලෙස ඇලුම් කළා. ක්‍රීඩා කරද්දී අපි ක්‍රීඩා භාණ්ඩ සමග ගැටනෙවා. එවිට මම දැක්කා ක්‍රිකට් ක්‍රීඩාවේදී යොදා ගන්නා ක්‍රිකට් පිතිවල අඩුපාඩු රැසක් තිබෙනා බව. මට හිතුණා තව හොඳ නිෂ්පාදන තිබුණා නම් කොතරම් හොඳින් ක්‍රීඩාවේ නිරත වන්න පුළුවන් ද කියලා. එහෙම හිතලා තමයි උසස් පෙළ ප්‍රතිඵල එනතෙක් බලන් ඉන්න කාලයේ මේ ව්‍යාපාරය ආරම්භ කරේ."

"අධ්‍යාපනය කියන්නේ අපි හැමෝම ලබන දෙයක්. පොඩි කාලේ ඉඳන් විභාග ලියනවා. මටත් මුලින් තිබුණේ විභාග සමත් වීමේ බලාපොරොත්තුව විතරයි. නමුත් උසස් පෙළ කරන කාලයත් සමඟ ආර්ථික අපහසුතා එද්දී ව්‍යාපාරයක් ආරම්භ කරන්න ඕනෙ කියලා හිතුණා. ක්‍රීඩාවත් එක්ක බැඳිලා තමයි මේ ව්‍යාපාරික අදහස ආවේ. රටක ආර්ථිකය ශක්තිමත් වෙන්නේ විදේශ විනිමය හරහායි. මෙවැනි නිෂ්පාදන තුළින් රටට ආදායමක් ගේන්න පුළුවන් නම් එය ගොඩක් වටිනවා. ඒ සඳහා තමන්ගේ හිතේ තියෙන කැමැත්තත් සමඟ ව්‍යාපාරික කටයුත්තක් තෝරා ගන්න පුළුවන්."

වෙළෙඳපොළෙන් මිල දී ගන්නට තිබෙනා අනෙකුත් ක්‍රිකට් පිතිවලට වඩා මිලින්ද විසින් නිෂ්පාදනය කරනා ක්‍රිකට් පිතිවල තිබෙන සුවිශේෂීත්වය වන්නේ,අප වෙළෙඳපොළෙන් මිල දී ගන්නේ සාදා නිම කර තිබෙනා ක්‍රිකට් පිතිය. නමුත් මිලින්ද පාරිභෝගික අවශ්‍යතාව මත සැහැල්ලු ක්‍රිකට් පිති නිෂ්පාදනය කර පාරිභෝගිකයාට ලබා දෙයි. පාරිභෝගිකයාට අවශ්‍ය පරිදි තමන්ට ගැළපෙන ලෙස බර,ප්‍රමාණය මෙන්ම තමන්ට කැමති ලෙස ස්ටිකර් ද අලවා කැමැති වර්ණයන්ට අනුව ක්‍රිකට් පිති නිෂ්පාදනය කර දීමට මිලින්ද සූදානම්ය. එසේම ක්‍රිකට් පිති නිෂ්පාදනය කරන්නේ මාර ලී වලින් වන අතර ක්‍රිකට් පිත්තේ අඩියට ද යොදා ගන්නේ මාර ලීය. එහෙත් මිලින්දගේ ක්‍රිකට් පිතිවල අඩිය සකසා







තිබෙන්නේ කොස් ලීයෙනි. ක්‍රිකට් පිත්තේ කල්පැවැත්ම පිළිබඳ සිතා වැඩි ආරක්ෂාවක් සැපයීමට මෙසේ කොස් අඩිය යොදාගෙන ඉහළ ගුණාත්මකභාවයකින් ඔහු තම නිෂ්පාදන කටයුතු සිදු කරයි.

මිලින්ද මේ සියලු කටයුතු සිදු කරන්නේ තම නිවෙස පිටුපස තාවකාලිකව තනා ඇති මඩුවක් වැනි කුඩාවට සකසාගත් වැඩබිමක් තුළය. තම නිෂ්පාදනවල ඉල්ලුම වැඩිවද්දී ඔහුට ඉඩ පිළිබඳව ද ගැටලු මතුවෙයි. එසේම නිෂ්පාදන ඉහළ නැංවීමට යන්ත්‍රසූත්‍ර මිල දී ගැනීමේ අවශ්‍යතාව ද ඔහුට මේ වන විට ඉස්මතු වී අවසන්ය. විවිධ අපහසුතා මැද්දේ තම ව්‍යාපාර කටයුතු සිදු කරගෙන යන මිලින්ද 'සම්පත් සීමිතයි නිර්මාණශීලිත්වය අසීමිතයි' යන තේමාවට කදිම උදාහරණයකි. සම්පත් සීමිත වුවත් තම නිර්මාණශීලිත්වය උපයෝගි කරගෙන මේ ව්‍යාපාරය මැනවින් දියුණු කර ඔහු වැනි තවත් දක්ෂයන්ට රැකියා අවස්ථා සලසා දීම ඔහුගේ එකම අපේක්ෂාවයි.

අනෙකුත් ව්‍යවසායකයන් අතුරින් මිලින්දගේ පවතිනා විශේෂත්ව වන්නේ ඔහු මේ ව්‍යාපාර කටයුතු සිදු කරන්නේ තම අධ්‍යාපනය කටයුතු ද සිදු කරගෙන යන අතරතුරදී වීමයි. සබරගමුව විශ්වවිද්‍යලයේ ක්‍රීඩා, විද්‍යාව හා කළමනාකරණ පාඨමාලාවට සුදුසුකම් ලබා සිටිනා මිලින්ද තම අධ්‍යාපනික දැනුම ද උපයෝගි කරගෙන තම ව්‍යාපාරය මහා පරිමාණ ව්‍යාපාරයක් දක්වා දියුණු කර ගැනීමට පැතුම් පොදි බැඳගෙන සිටී.

සටහන - ජානුකා බෝම්බුවල
ඡායාරූප - කසුන් වික්‍රමරත්න

2021 අප්‍රේල් 10 සෙනසුරාදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.